# උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ පරීක්ෂණ කොමිසම් වාර්තාව

# 2011 නොවැම්බර්

## 9 වන පරිච්ඡේදය - ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශවල සාරාංශය[1]

පහත දැක්වෙන්නේ, වාර්තාවෙහි අඩංගු ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශවල සාරාංශයකි.

### *දෙවන පරිච්ඡේදයː සටන් විරාම ගිවිසුම පිළිබඳ නිරීක්ෂණ*

9.1 දශක ගණනාවක් තිස්සේ ත්‍රස්තවාදයෙන් සහ ප්‍රතිප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳ තිබූ රටකට සහ මහජනතාවකට සටන් විරාම ගිවිසුම කෙටි කාලීන සහනයක් සැලසී ය. ගිවිසුම කොතරම් අස්ථාවර වුව ද, අවසානයේ දී කොතරම් නිෂ්ඵල වුව ද, නිවැරදි දේශපාලනික සහ ආරක්ෂක රාමුවකින් තොරව විය හැකි නමුත්, සාකච්ඡාමය විසඳුමකට මග පාදන ක්‍රියාවලියකට පදනමක් දැමීම සඳහා පරිශ්‍රමයක් දැරීමට, එය අදාළ සියලු පාර්ශ්වයන්ට අවස්ථාවක් ලබා දුන්නේ ය. කෙසේ වුව ද, සිදුවීම් දිග හැරුණු ආකාරයෙන් පැහැදිලි වූයේ මින් එකක් වත් ඉටු නොවුණු බව යි.

9.2 සාම ක්‍රියාවලියේ පහසුකම් සපයන්නන් ලෙස, එක් අතකින් නෝර්වේ රාජ්‍යය සහ අනෙක් අතින් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ ප්‍රධානියා භාර ගත් අස්ථාවර දෙයාකාර කාර්ය භාරයන් ද, තිරසර සාම ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය චාලක ශක්තිය සම්පාදනය කිරීමට සටන් විරාම ගිවිසුම අසමත් වීම ද ඇතුළු සටන් විරාම ගිවිසුම් ක්‍රියාවලියෙහි පැවති සාංකල්පික දෝෂ සහ ක්‍රියාත්මීකරණ ඌනතා පෙන්නුම් කරන්නේ, එය රාජ්‍යය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් අතර සාමය ඇති කිරීමේ සාර්ථක ආකෘතියක් නොවීමට නියමිතව තිබූ බව යි. එසේ ම, තම ප්‍රකාශිත පරමාර්ථය වුණු ඊළම හැර අන් කිසිදු සාකච්ඡාමය විසඳුමක් සම්බන්ධයෙන් උනන්දුවක් නැති බව එල්ටීටීඊය පැහැදිලිව ප්‍රකාශ කිරීම සහ රටේ 'ප්‍රධාන ප්‍රවාහයේ' ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතිය තුළ ක්‍රියාකාරී දෙමළ දේශපාලන පක්ෂ ඇතුළු විවිධ දේශපාලන පක්ෂ අතර ඉතා වැදගත් ජාතික ගැටලු සම්බන්ධයෙන් ඒකමතික පිවිසුමක් නොපැවතීම ද මෙම අවාසනාවන්ත සහ හානිකර අත්දැකීමට දායක විය.

9.3 එල්ටීටීඊය සටන් විරාම ගිවිසුමෙහි පැවති සාංකල්පික සහ ක්‍රියාත්මීකරණ ඌනතා පැහැදිලිව ම සිය වාසියට හරවා ගත්තේ ය, භෞමික ප්‍රතිඵල තර කර ගත්තේ ය, තමන්ට පිළිගැනීම දිනා ගත්තේ ය;

---

[1] The LLRC's Final Report was released to the public in December 2011. Up until the public release of this unofficial translation, in mid-March 2012, the government has not released to the public domain a translation of the report in Tamil or Sinhala. Bizarelly, Azzam Ameen, a Sri Lankan journalist on 1st March publicly tweeted that the President's office has official translations of the report in all three languages, which if true, begs the question as to why a more public release of the report in Sinhala and Tamil hasn't occurred and isn't encouraged. This unofficial translation was commissioned by the Centre for Policy Alternatives (CPA) with a view to making key content in the LLRC final report more widely known and accessible.

The official version of the LLRC report can be downloaded from here.

සමතත්ත්වයෙන් සහ පරස්පරතාවක් නොමැතිකමින් වාසි ලැබී ය; ආයුධ ඉවත් කිරීම තබා දේශපාලනික සාකච්ඡා ආරම්භ කිරීම සඳහා වත් කිසිදු විධිවිධානයක් නොමැතිකම ගසා කැවේ ය; ශ්‍රී ලංකා නාවික හමුදාව වෙරළබඩ ප්‍රදේශවල නීත්‍යානුකූලව කළ ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා සටන් විරාම ගිවිසුමේ විධිවිධාන අයුතු ලෙස ප්‍රයෝජනයට ගෙන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ *2011 අංක 1373 දරණ යෝජනාව* ඇතුළු ජාතික සහ ජාත්‍යන්තර නීති උල්ලංඝනය කොට නීති විරෝධී අවි ජාවාරම්වලට පහසුකම් සැපයී ය; උල්ලංඝනයන් වැළැක්වීම සඳහා සත්‍යාසත්‍යතාව පරීක්ෂා කර ගැනීමට කිසිදු විශ්වසනීය පටිපාටියක් නොමැතිකමින් වාසි ලබා ගත්තේ ය; ළමා සොල්දාදුවන් සේවයේ යෙදීමේ පිළිකුල් සහගත පිළිවෙතට එරෙහි ප්‍රබල පටිපාටියක් තබා කිසි ම මානව හිමිකම් බැඳීමක් වත් නොමැතිකමින් නො දැනෙන්නට අයුතු ප්‍රයෝජන ගත්තේ ය.

***තෙවන පරිච්ඡේදය: සිදුවීම් විස්තර කිරීමක් පමණකි.***

***සිව් වන පරිච්ඡේදය: ගැටුමේ අවසන් අදියරට අදාළ ජාත්‍යන්තර මානුෂීය නීති ගැටලු පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ***

**සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සහ සිවිල් වැසියන්ට හානි සිදු වීම වැළැක්වීම සඳහා ගත් පියවර**

9.4 ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳව චෝදනා එල්ල වෙමින් පවතින තතු තුළ ශ්‍රී ලාංකික අත්දැකීම තක්සේරු කරන කොමිසම, එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශ අත්පත් කර ගැනීම සඳහා යොදා ගත් මිලිටරි මූලෝපාය සිවිල් ජනයා ආරක්ෂා කිරීමට ඉහළ ම ප්‍රමුඛතාව දෙමින් පරිස්සමින් සංකල්පනය කළ එකකැයි සෑහීමට පත් වෙයි. ගැටුමේ අවසන් අදියරවල මෙහෙයුම් කර ගෙන යාමේ දී ආරක්ෂක හමුදාවල ගමන හිතාමතා මන්දගාමී කිරීම, සිවිල් වැසියන්ට වන හානි වැළැක්වීම හෝ ඒවා අවම කිරීම ගැන පරිස්සමින් සිතා බලා එම මූලෝපාය සැකසූ බවට සාක්ෂියක් සපයතැයි ද කොමිසම සඳහන් කර සිටී.

9.5 මිලිටරි මෙහෙයුම් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී සිවිල් වැසියන්ගේ ජීවිත ආරක්ෂා කිරීම ප්‍රධාන සාධකයක් වූයේ ය යන ස්ථාවරය සමග මෙම සාධක ගැළපේ. වැඩි දුර පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය කරන විශේෂිත සිදුවීම් පිළිබඳව ඉහත 4 වන පරිච්ඡේදයේ II වන කොටසෙහි (4.106, 4.107, 4.109, 4.110 සහ 4.111 ඡේද බලන්න) සඳහන් වන නමුත්, සිවිල් වැසියන් හිතාමතා ඉලක්ක කර ගැනීම ප්‍රතිපත්තියේ අවශ්‍ය කොටසක් විණැයි කෙරෙන ඕනෑ ම යෝජනාවකට මෙම සාධක බාධකව සිටී.

**යුද මුක්ත කලාප**

9.6 තමන් හමුවේ තිබෙන සියලු කරුණු සහ තොරතුරු සැලකිල්ලට ගන්නා කොමිසම, වෙඩි හුවමාරුවල දී සිවිල් වැසියන්ට සැබවින් ම හානි සිදු වුණ ද ආරක්ෂක හමුදා යුද මුක්ත කලාප තුළ සිටි සිවිල් වැසියන් හිතාමතා ඉලක්ක කර නොගත් බව නිගමනය කරයි. තව ද, එල්ටීටීඊය ගැටුමෙන් බේරී නිරුපද්‍රිත ප්‍රදේශවලට පලා යාමට ප්‍රයත්න දැරූ සිවිල් වැසියන් ඉලක්ක කර ගැනීම සහ ඝාතනය කිරීම, බිම් බෝම්බ නිසා මතු වුණු තර්ජනය සහ ඒ හේතුවෙන් සිවිල් වැසියන් මරණයට පත් වීම සහ තුවාල වීම සහ නන්දි කඩල් කලපුව තරණය කිරීමේ දී නො වැළැක්විය හැකි ලෙස ඇති වුණු උපද්‍රව යන මේ සියල්ල ද සිවිල් වැසියන්ට සිදු වුණු හානිවලට දායක විය. එල්ටීටීඊ තුවක්කු පිහිටුවා තිබෙන ස්ථානයකට එල්ල කරන ප්‍රහාරයකින් ඉටු වන්නේ එම මිලිටරි ප්‍රහාරයේ අරමුණට උචිත සහ සමානුපාතික මෙහෙවරක් බවට අව්‍යාජ අපේක්ෂාවක් තිබිණැයි නිගමනය කිරීම ද සාධාරණ ය.

9.7 ආරක්ෂක හමුදා කිසි සේත් සිවිල් වැසියන් ඉලක්ක කර නොගත්තත්, යුද මුක්ත කලාප තුළට පෙරළා ප්‍රහාර එල්ල කිරීමේ ආරක්ෂක හමුදා ක්‍රියාව සමානුපාතිකතාවේ මූලධර්මය ඉක්මවා ගියේ ද යන ප්‍රශ්නය සලකා බැලීමට ද, ඉහත නිගමනවලට එළඹීම නිසා කොමිසමට බල කෙරේ. ඉහත විස්තර කරන ලද පරිදි එළඹි තත්ත්වයෙහි පැවති සංකීර්ණතාව සැලකිල්ලට ගෙන සියලු පැතිකඩවල් ඉතා ම පරිස්සමින් සලකා බැලූ කොමිසමේ අදහස වන්නේ, වෙනත් තෝරා ගැනීමක් නොතිබුණු බැවින් සහ අදාළ වාතාවරණයන් තුළ දී ගත හැකිව තිබුණු සියලු "ප්‍රායෝගික පූර්වෝපායන්" ගෙන තිබුණු හෙයින්, ආරක්ෂක හමුදා පෙර නොවූ විරූ තත්ත්වයකට මුහුණ පෑ බව යි.

9.8 මිලිටරි මෙහෙයුම්වල දී සිදු වුණු මරණ, තුවාල හෝ දේපළ හානි සම්බන්ධයෙන් රාජ්‍යයට තිබෙන වගකීම පිළිබඳව මතු වන ප්‍රශ්න විසඳීමේ දී, "සටන් ක්‍රියා" සිදු වුණු සියලු තත්ත්වයන් ඒ ආශ්‍රිත සියලු

තත්ත්වයන් ප්‍රමාණවත් ලෙස වාර්තා කරමින් අධිකරණයක් ඉදිරියේ ප්‍රතිනිර්මාණය කිරීම "ඉතා අසීරු" යැයි මූලධර්මාත්මක බලාධිකාරයන්ට අදාළ ජාත්‍යන්තර අධිකරණ පෙන්වා දී ඇති බව සිහිපත් කිරීම ද මෙම තත්ත්වය තුළ දී උචිත ය.

**සිවිල් වැසියන් මරණයට පත් වීම හෝ තුවාල වීම පිළිබඳ විශේෂිත උදාහරණ**

9.9 සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි වීම සම්බන්ධයෙන් කොමිසමේ අවධානයට ලක් කර තිබෙන ඇතැම් සිදුවීම් ප්‍රතිනිර්මාණය කිරීමට ප්‍රයත්න දැරීමේ දී කොමිසම ද සමාන දුෂ්කරතාවන්ට මුහුණ දෙයි. ඉහත 4 වන පරිච්ඡේදයේ II වන කොටසෙහි විස්තර කරන ලද පරිදි (4.106, 4.107, 4.109, 4.110 සහ 4.111 ඡේද බලන්න) එවැනි සිදුවීම් හට ගත්තේ කවර නිශ්චිත තත්ත්වයන් යටතේ දැයි තීරණය කිරීමේ දී කොමිසම දුෂ්කරතාවකට මුහුණ දුන්නත්, හානි කිරීමේ අදහසින් තොරව හෝ සිවිල් වැසියන්ට මරණ හෝ තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා වගකිව යුතු බවක් තොරතුරුවලින් කිසි සේත් ම නො ඇඟවේ. එවැනි සිදුවීම් හට ගත හැක්කේ කවර තත්ත්වයන් යටතේ දැයි වඩා පූර්ණ ලෙස සොයා දැන ගැනීමටත්, අයුතු කල්ක්‍රියාවන් පැවතිණැයි එවන් පරීක්ෂණවලින් හෙළිදරව් වන්නේ නම් වැරදිකරුවන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට දඬුවම් පැමිණවීමටත්, රාජ්‍යයේ පාර්ශ්වයෙන් යුතුකමක් ඇතැයි මෙම තතු තුළ කොමිසම අවධාරණය කර සිටී. ඉහත සඳහන් කළ සිදුවීම්වල දී සහ වැඩි දුර පරීක්ෂණවලින් හෙළිදරව් වන වෙන යම් සිදුවීම්වල දී, පෞද්ගලික බේදවාචකයන්ට ගොදුරු වූවන්ට උපකාර විය හැකි මානුෂීය ඉඟියක් ලෙස, ඝාතනයට ලක් වුණු හෝ තුවාල වුණු අයගේ සමීප ඥාතීන්ට නිසි වන්දියක් ලබා දීම ගැන ද සැලකිල්ල යොමු විය යුතු ය.

**රෝහල්/තාවකාලික රෝහල්**

9.10 සියලු තත්ත්වයන් පරිස්සමින් සලකා බැලූ කොමිසම, හානි සහ තුවාල හෝ මරණ සිදු කරමින් රෝහල්වලට සැබවින් ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වුණු බව ඒත්තු ගනී. කෙසේ වුව ද, කාලය, නිශ්චිත ස්ථානය සහ වෙඩි තැබූ දිසාව අනුව සැලකූ කල, කොමිසම හමුවේ තැබුණු තොරතුරුවලින් දැක්වෙන්නේ සිදුවීම්වල නිශ්චිත ස්වභාවය සම්බන්ධ යම් තරමක ව්‍යාකූල විස්තරයකි.

9.11 මෙම පසුබිම තුළ කොමිසම මුහුණ පා සිටින අභියෝගය නම්, සැබෑ සාක්ෂි පදනම් කර ගෙන ප්‍රශ්නයට ලක්ව තිබෙන ක්‍රියාවන්ට වගකිව යුත්තන් තීරණය කිරීම යි.

9.12 තම තීරණය ගැනීමේ දී කොමිසම මුහුණ පාන දුෂ්කරතාව දෙයාකාර යː

අ. ප්‍රශ්නයට ලක්ව තිබෙන ක්ෂේත්‍ර සම්බන්ධයෙන්, ගැටුමේ තීව්‍රතාව සැලකිල්ලට ගෙන කළැයි සිතිය හැකි ගැඹුරු විශ්ලේෂණයක් සහිත ක්ෂණික පරීක්ෂණයක් ආරම්භ කර නැති බව කොමිසමට පැහැදිලි ය.

ආ. රෝහල්වලට එල්ල වුණු ෂෙල් වෙඩි ප්‍රහාර හට ගත්තේ, ශ්‍රී ලංකා හමුදාවේ පාර්ශ්වයෙන් ම යැයි හෝ එල්ටීටීඊයේ පාර්ශ්වයෙන් ම යැයි නිශ්චිතව තහවුරු කළ හැකි තත්ත්වයක තමන් සිටින බව ප්‍රකාශ කිරීමට, ප්‍රකාශ ඉදිරිපත් කළ කිසිවෙකුට නොහැකි විය. කොමිසම හමුවට පැමිණි සිවිල් වැසියන් ප්‍රකාශ කළේ දෙපාර්ශ්වයෙන් ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වුණු බව යි. එක් සිවිල් වැසියෙකු ප්‍රකාශ කළේ, 'ෂෙල් වෙඩිල්ලක් වැටුණා ම හැමෝම හිතුවේ ඒක හමුදාවෙන් එල්ල වුණු එකක් කියලා - හරියට ම කියන්න බැහැ' යනු යි. වෙනත් හිටපු එල්ටීටීඊ සටන්කරුවෙකු තම ප්‍රකාශවල දී ප්‍රකාශ කර තිබුණේ, එල්ටීටීඊය සැබවින් ම අත්වැරදීමකින් පුදුමාතලන් රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කළ බවත්, අනතුරුව ඔවුන් ඒ පිළිබඳව සමාව ඉල්ලා සිටි බවත් ය.

9.13 මේ අනුව, නීතිමය ස්වභාවයේ ප්‍රාථමික සාක්ෂි නොමැතිකම නිසා මෙන් ම, සිවිල් වැසියන්ගෙන් ලැබුණු උපකාරක සාක්ෂි සැක උපදවන ස්වභාවයක් ගැනීම සහ ෂෙල් වෙඩි ප්‍රහාර සම්බන්ධයෙන් එක් හෝ අනෙක් පාර්ශ්වයක් වගකිව යුතු බව සහතික කරන නිශ්චිත නිගමනයක් ඉදිරිපත් නොකරන නිසා, රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සහ ජීවිත අහිමි කිරීම/දේපළවලට හානි කිරීම සම්බන්ධයෙන් වගකීම දැරිය යුත්තේ කවුරුන් ද යන්න ගැන නිශ්චිත නිගමනයකට එළඹීමේ කොමිසමේ කර්තව්‍යය අතිශයින් දුෂ්කර එකක් බවට පත් වේ.

9.14 ෂෙල් වෙඩි ප්‍රහාර සම්බන්ධයෙන් එක් හෝ අනෙක් පාර්ශ්වයක් වගකිව යුතු යැයි වගකීම තීරණය කිරීමේ දී නිශ්චිත නිගමනයකට එළඹිය හැකි තත්ත්වයක කොමිසම නො සිටියත්, රෝහල්වලට හානි සිදු කරමින් සහ ඇතැම් අවස්ථාවල දී සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි කරමින් හෝ ඔවුන්ට තුවාල සිදු කරමින් රෝහල්වලට සැබවින් ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වුණු බවට සිවිල් වැසියන් අවස්ථා ගණනාවක දී ප්‍රකාශ ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගෙන, ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය ඇති කෙරෙන මානුෂීය ඉඟියක් ලෙස නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව බලපෑමට ලක් වූවන්ට කඩිනමින් නිසි වන්දියක් ලබා දීම ගැන සලකා බැලිය යුතු ය.

**ගැටුම් ප්‍රදේශවල ජීවත් වුණු සිවිල් වැසියන්ට ආහාර සහ ඖෂධ ඇතුළු මානුෂීය සහන සැපයීම**

9.15 2009 වසරේ මුල දක්වා, එල්ටීටීඊය රඳවා ගෙන සිටි සිවිල් වැසියන්ට ආහාර සැපයීම සාමාන්‍යයෙන් සරණාගතයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් පෝෂණ යෙදවුම් මට්ටමට ආසන්නව බොහෝ දුරට ප්‍රමාණවත් මට්ටම්වල පැවති බව කොමිසම සඳහන් කර සිටී. මෙය කළ හැකි වූයේ, 2009 ජනවාරි මාසය දක්වා හමුදා ආරක්ෂාව යටතේ ගොඩබිම හරහා ආහාර ලොරි කණ්ඩායම් පිටත් කර යැවීමෙනි. කෙසේ වුව ද, ගැටුම තීව්‍ර වීම නිසා සහ නන්දි කඩල් කලපුව හරහා වැටුණු පුදුමාතලන් ප්‍රදේශයෙහි පටු බිම් තීරුවෙහි එල්ටීටීඊය රඳවා ගෙන සිටි විශාල ජන සංඛ්‍යාවකට අත්‍යවශ්‍ය සැපයුම් සම්පාදනය කිරීම සඳහා මුහුදු සැපයුම් මාර්ගයක් යොදා ගැනීමට ආණ්ඩුවට බල කෙරුණු නිසා, 2009 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාසවල සහ මැයි මස මුල් භාගයේ දී ප්‍රමාණවත් බවේ මෙම මට්ටම් පහත වැටී ඇති බව පෙනේ. මෙම සැපයුම් රැගෙන ගියේ, ක්‍රියාත්මක ගැටුමක් මධ්‍යයේ මානුෂීය සැපයුම් අඛණ්ඩව ගලා යන බව සහතික කිරීමේ අතිමහත් ප්‍රායෝගික දුෂ්කරතා තිබිය දී බව, ඉදිරිපත් කෙරුණු තොරතුරුවලින් කොමිසමට පැහැදිලි වේ.

9.16 ප්‍රධාන වශයෙන් ම ආණ්ඩුවේ සාමූහික පරිශ්‍රමය කරණ කොට ගෙන, විශේෂයෙන් ම දිසාපතිවරුන් සහ ආරක්ෂක හමුදාවල මෙන් ම ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) සහ ලෝක ආහාර වැඩ සටහන (WFP) වැනි ජාත්‍යන්තර ආයතන සහ අවසන් යුද මුක්ත කලාපවල රැඳී සිටිමින් පරාර්ථකාමී සේවාවන් සැපයූ වෙනත් ස්වේච්ඡා ආයතනවල පරිශ්‍රමය කරණ කොට ගෙන, බලපෑමට ලක් වුණු සිවිල් වැසියන් මුහුණ පා සිටි තත්ත්වයන් හොඳ අතට හැරවීම සඳහා, පැවති තත්ත්වයන් යටතේ බෙදා හැරිය හැකි වුණු උපරිම ආහාර සැපයුම් ප්‍රමාණයන් මුහුදු මාර්ගයෙන් බෙදා හැර තිබුණු බව පිළිගත යුතු ය.

9.17 ගැටුමේ බලපෑම් නිසා සහ එම තත්ත්වයන් යටතේ බෙදා හැරීම් පද්ධතිය තුළ ප්‍රකට වුණු ඌනතා නිසා පැනවුණු පෙර නොවූ විරූ සීමාවන් ද, පැවති සීමාසහිත සැපයුම් යුක්ති ගරුක ලෙස සහ සාධාරණ ලෙස බෙදා හැරීම අවහිර කරමින් එල්ටීටීඊය අනුගමනය කළ පිළිවෙත් ද නො තකා, ගැටුමේ අවසන් සති කිහිපයේ දී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, විශේෂයෙන් ම අත්‍යවශ්‍ය සේවාවන් පිළිබඳ මහ කොමසාරිස්වරයා මෙන් ම ඉහත සඳහන් කළ ඒවා වැනි ජාත්‍යන්තර ආයතන සහ වෙනත් ස්වේච්ඡා සංවිධාන, බලපෑමට ලක් වුණු පුද්ගලයන් වෙත හැකි උපරිම මට්ටමින් සැපයුම් යැවෙන බව සහතික කිරීමෙහි ලා ප්‍රශංසනීය සේවාවන් සහ සහායන් සැපයී ය.

9.18 කෙසේ වුව ද, මෙම පරිශ්‍රමයන් තිබිය දීත්, විශේෂයෙන් ම ගැටුම තීව්‍ර වීමත් සමග, තම පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අසීරුතාවකින් තොරව ලබා ගත හැකි පරිදි ප්‍රමාණවත් තරම් ආහාර සැපයුම් නොමැති වීම හේතු කොට ගෙන සිවිල් වැසියන් පීඩාවට පත් වූයේ ය යන කරුණ පවතී. 2009 පෙබරවාරි මාසයෙන් පසුව පැතිර පැවති බව පෙනෙන ආන්තික තත්ත්වයන්, ඉහත 4 වන පරිච්ඡේදයේ II වන කොටසේ විස්තරාත්මකව දක්වා ඇත.

9.19 තමන් හමුවේ තැබුණු තොරතුරු විභාග කළ කොමිසම අදහස වන්නේ, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ජාත්‍යන්තර ප්‍රජාවේ, විශේෂයෙන් ම ඉහත සඳහන් කළ ආයතනවල මෙන් ම සිවිල් සාමාජීය කණ්ඩායම්වල ද සහයෝගය ඇතිව, ජාත්‍යන්තර සහයෝගයෙන් සහ එකමුතුකමෙන් ශක්තිය ලැබ, මෙහෙයුමේ අතිමහත් සංවිධානාත්මක දුෂ්කරතා පැවතිය දීත්, කොටු වී සිටි සිවිල් වැසියන් වෙත ආහාර සහ වෛද්‍ය සැපයුම් සහ වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සඳහා හැකි සියලු පියවර ගෙන තිබුණු බව යි.

9.20 යුද මුක්ත කලාප තුළ එල්ටීටීඊය යටතේ ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා ගෙන සිටි සිවිල් වැසියන් සංඛ්‍යාව සම්බන්ධයෙන් තමන් හමුවේ පැවතියේ එකිනෙකට වෙනස් තක්සේරු සැපයුණු තොරතුරු බව සඳහන් කිරීමට ද කොමිසම කැමැති ය. අදාළ සිවිල් බලාධිකාරවලින් ලේඛනගත කෙරුණු සාක්ෂි සමග සසඳා එම තක්සේරුවල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කර ගැනීමට කොමිසම ප්‍රශස්ත පරිශ්‍රමයක් දැරුවත්, කිසිදු

මුල් ප්‍රලේඛනයක් ලබා ගැනීමට කොමිසමට නොහැකි වී ඇත. කෙසේ වුව ද, එවැනි ප්‍රලේඛනයන් ලබා ගත නොහැකි වීම, තත්ත්වයන් යටතේ ප්‍රායෝගිකව කළ හැකි දෙයට උර දීම කෙරෙහි තීරණාත්මක බලපෑමක් නො කරයි. ඉහත විස්තර කරන ලද පරිදි, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ ලෝක ආහාර වැඩ සටහන වැනි ජාත්‍යන්තර ආයතනවල සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව දැරූ උද්‍යෝගී පරිශ්‍රමයන් නිසා, සටන් විධික්‍රමයක් ලෙස සිවිල් ජනයා හාමතේ තැබීමේ අරමුණෙන් යුද මුක්ත කලාප තුළ සිටි සිවිල් වැසියන් සංඛ්‍යාව හිතාමතා අඩු කොට දැක්වීමේ අභිප්‍රායක් පැවතියේ ය යන අනුමානයට කිසි අවසරයක් නො ලැබේ.

**වෛද්‍ය සැපයුම්**

9.21 හතර වන පරිච්ඡේදයේ II වන කොටසේ විස්තර කරන ලද පරිදි සියලු සාධක සැලකිල්ලට ගෙන කොමිසමට එළඹිය හැකි වුණු එක ම නිගමනය නම්, සාමාන්‍ය තත්ත්වයන් යටතේ අදාළ වන විෂය මූලික ප්‍රමිතීන් අනුව ගත් විට, ඖෂධ හිඟයක් පැවතී ඇතැයි පෙනෙන බව යි, වෛද්‍ය පහසුකම් අප්‍රමාණවත් වී ඇතැයි පෙනෙන බව යි. කෙසේ වුව ද, මෙම සාධක සලකා බැලිය යුත්තේ ගැටුමේ තීව්‍රතාව මධ්‍යයේ පැතිර පැවති අතිශය අසාමාන්‍ය තත්ත්වයන් සහ රෝහල් පිහිටියේ ගැටුම් බිමට ආසන්නව ය යන්න සැලකිල්ලට ගෙන ය.

9.22 තමන් හමුවේ පවතින තොරතුරුවල අවිනිශ්චිත ස්වභාවය සැලකිල්ලට ගන්නා කොමිසම, ගැටුමේ අවසන් දිනවල දී ගැටුම් ප්‍රදේශවල සිටි සිවිල් වැසියන්ට වෛද්‍ය සැපයුම් යැවීම පිළිබඳ ගැටලුව, අදාළ මානුෂීය තැකීම් යටතේ තව දුර විභාග කළ යුතු කරුණක් බව ද පිළිගනී. එවැනි විභාග කිරීමක දී, තුවාල ලැබූ සිවිල් වැසියන් සංඛ්‍යාව, තුවාල වර්ග, තුවාල ලද සහ ප්‍රතිකාර කෙරුණු එල්ටීටීඊ සාමාජිකයන් සංඛ්‍යාව සහ තුවාල ලැබූවන්ට ප්‍රතිකාර කිරීමට තාවකාලික රෝහල්වලට තිබුණු හැකියාව ඇතුළු අදාළ සියලු සාධක සැලකිල්ලට ගත යුතු ය. සැබෑ සැපයුම් ප්‍රමාණයන් පිළිබඳව තක්සේරුවක් කළ හැක්කේ එම සාධක සමග සැසඳීමෙනි.

**යටත් වීමෙන්/අත් අඩංගුවට ගැනීමෙන් පසුව සිදු විණැයි කියනු ලබන අතුරුදන් වීම්**

9.23 ඇතැම් පුද්ගලයන් හමුදා අත් අඩංගුවට යටත් වනු තමන් සෘජුව ම ඇසින් දුටු බවට (4 වන පරිච්ඡේදයේ II වන කොටසේ 4.242 සිට 4.258 දක්වා ඡේදවල දක්වා ඇති පරිදි) පුද්ගලයන් ගණනාවකගෙන් ලැබුණු ප්‍රකාශ පිළිබඳව සලකන කල, එවැනි නිශ්චිත චෝදනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීමත්, එවැනි පරීක්ෂණවලින් හමුදාවේ තනි තනි සාමාජිකයන්ගේ පාර්ශ්වයෙන් කවර හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වුණු බවට සාක්ෂි ගෙන හැර දැක්වෙන්නේ නම් වැරදි කළවුන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට දඬුවම් පැමිණවීමත් රාජ්‍යයේ පැහැදිලි යුතුකම බව කොමිසම අවධාරණය කළ යුතු ය. යම් සිදුවීමක් නිල අත් අඩංගුවට යටත් වීමෙන් පසුව අතුරුදන් වීමක් බව තහවුරු වන්නේ නම් එය දණ්ඩන ප්‍රතිවිපාක අවශ්‍ය කරන අපරාධයකට සමාන බව ද මේ සම්බන්ධයෙන් කොමිසම අවධාරණය කළ යුතු ය. මෙලෙස, මෙම සිදුවීම් සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් දියත් කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී නීතිමය පියවරයන්ට මුල පිරීම වූකලි, යටත් වීමේ ක්‍රියාවලියේ දී සහ මුදා ගත් ප්‍රදේශවලට සිවිල් වැසියන් මාරු වෙමින් සිටි අවස්ථාවල දී සමස්තයක් ලෙස ආදර්ශමත් ආකාරයෙන් ක්‍රියා කළ හමුදාවේ හොඳ නම විදහා පෑම සඳහා ද අවශ්‍යයෙන් ම කළ යුත්තක් වේ. මන්ද, කිහිප දෙනෙකුගේ ක්‍රියාවන් නිසා එම සමස්ත කල්ක්‍රියාව කෙලෙසීමට ඉඩ නො දිය යුතු වේ.

**එල්ටීටීඊයේ කල්ක්‍රියාව**

9.24 මානව හිමිකම් පිළිබඳ පරිච්ඡේදයෙහි සහ ඒ ආශ්‍රිත ඇමුණුම්වල දී, එල්ටීටීඊය කළ බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් කෙරෙහි සවිස්තරාත්මකව අවධානය යොමු කර ඇත.

:

9.25 එල්ටීටීඊය ජාත්‍යන්තර මානුෂීය නීතියේ හර මූලධර්ම බරපතළ ලෙස උල්ලංඝනය කළ අවස්ථා පිළිබඳව 4 වන පරිච්ඡේදයේ II වන කොටසෙහි, විශේෂයෙන් ම යුද මුක්ත කලාපවලට සම්බන්ධිතව සඳහන් වේ. කෙසේ වුව ද, සමාප්ති නිරීක්ෂණ වශයෙන් පහත සඳහන් දෑ කෙරෙහි සිත යොමු කිරීම කොමිසමේ යුතුකමකි:

අ. තම මිලිටරි මූලෝපාය පෙරට ගෙන යාම සඳහා සිවිල් වැසියන් මානව පලිහක් ලෙස යොදා ගැනීම පිළිබඳ සැබෑ කරුණ, මෙන් ම;

ආ. සිවිල් වැසියන් රැඳී සිටි මධ්‍යස්ථාන තුළ මිලිටරි ආම්පන්න ස්ථානගත කිරීමේ සහ පාවිච්චි කිරීමේ පිළිවෙත,

ඇ. සුරක්ෂිත ප්‍රදේශවලට පලා යාමට උත්සාහ දරමින් සිටි සිවිල් වැසියන්ට වෙඩි තැබීම,

ඈ. ගැටුමේ අවසන් අදියරවල දී පවා, සටනෙහි යෙදවීම සඳහා තරුණ ළමයින් බලාත්කාරයෙන් හමුදාවට බඳවා ගැනීම,

ඉ. සිවිල් වැසියන් අනතුරට ලක් වීමට ඉඩ තිබෙන බව දැන දැන ම ගැටුම් කලාපයෙන් පිටත පවා බිම් බෝම්බ සහ ක්ෂණ නිර්මිත පිපිරුම් උපකරණ (Improvised Explosive Devices - IED) ඇතිරීම,

ඊ. තම මිලිටරි අරමුණු ඉටු කර ගැනීම සඳහා සහායක සේවාවන් සපයා ගැනීමට සිවිල් වැසියන් බලාත්කාරයෙන් යොදා ගැනීම - එමගින්, විශේෂයෙන් ම තදබද වුණු අවසන් යුද මුක්ත කලාපවල දී, සිවිල් වැසියන් සහ සටන්කරුවන් හඳුනා ගැනීම කළ නොහැකි කර්තව්‍යයක් බවට ම පාහේ පත් කිරීම, සහ

උ. අහිංසක සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි කරමින් මරා ගෙන මැරෙන ප්‍රහාර අඛණ්ඩව යොදා ගැනීම, එල්ටීටීඊය ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම අතිනින්දිත ලෙස නො තකා හළ බව තහවුරු කරනවා පමණක් නො ව, සිවිල් වැසියන්ගේ ජීවිත පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොතිබුණු සතුරෙකු සමග සටන් වදිමින් මිලිටරි ජයග්‍රහණයක් අත් කර ගැනීමට යාමේ දී ආරක්ෂක හමුදා මුහුණ දුන් කර්තව්‍යයේ ස්වභාවය ඉස්මතු කර දක්වන්නක් ද වීම.

9.26 චෝදනා ඉදිරිපත් කිරීම සඳහා පිළිගත හැකි සේ හැඟෙන තොරතුරු එළිදරව් වන එල්ටීටීඊ සටන්කරුවන්ට එරෙහිව චෝදනා ගොනු කිරීමේ දී, එවැනි අපරාධවල බරපතළ ස්වභාවයට සරිලන නිසි දඬුවම් නියම කළ හැකි වන පරිදි, හර මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ හර මූලධර්ම උල්ලංඝනය පිළිබඳව නිසි වාර්තා ලබා ගත යුතු ය.

**අභ්‍යන්තර ගැටුම්වලට අදාළ කර ගැනීමේ දී ජාත්‍යන්තර මානුෂීය නීති පටිපාටියේ ක්‍රියා කලාපය පිළිබඳ නිරීක්ෂණ**

9.27 රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධ වී සිටින අභ්‍යන්තර ගැටුම් නියාමනය කරන නීතිමය රාමුවේ අසම්පූර්ණ ස්වභාවය හේතු කොට ගෙන, රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සිවිල් වැසියන්ට සැපයෙන සාම්ප්‍රදායික ආරක්ෂාව නරුම ලෙස නො තකා හැරීම - උදා. 'ආරක්ෂිත කලාප' සටන් මූලෝපායේ කොටසක් බවට පත් කර ගැනීම, සිවිල් වැසියන් මානව පලිහක් ලෙස යොදා ගැනීම වැනි තත්ත්වයන්හි දී නිරන්තරයෙන් මතු වන ගැටලු, රාජ්‍යයන් සහ රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධ වී සිටින අභ්‍යන්තර ගැටුම්වලට අදාළ දැනට පවත්නා නීතිමය රාමුව තුළ පැහැදිලිව අර්ථ දක්වා නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිව තිබෙන තත්ත්වය නම්, සිවිල් වැසියන් වෙසෙන 'ආරක්ෂිත කලාප' තුළ පිහිටුවූ මිලිටරි ස්ථාන අක්‍රිය කළ යුතු අවස්ථා වැනි, රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම්වල සටන් මූලෝපායට මුහුණ දීම සඳහා ප්‍රතිපියවරයන් ගැනීමට රාජ්‍යයට බල කෙරෙන අවස්ථාවල දී සිවිල් වැසියන් දරුණු අනතුරකට ලක් වීම යි.

9.28 පෙර නොවූ විරූ ශ්‍රී ලාංකික අත්දැකීම පෙන්නුම් කර ඇති පරිදි, සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සඳහා සැපයෙන එවැනි කලාප සාකච්ඡාවෙන් ප්‍රකාශයට පත් කිරීමක් සඳහා එකඟ වීමට රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමට කවර හෝ අභිප්‍රායක් නොමැති, එහෙත් රාජ්‍යය ඒකපාර්ශ්වීයව එවැන්නක් ප්‍රකාශයට පත් කළ විට ඒවා තම සටන් මූලෝපාය සහ මෙහෙයුම් පෙරට ගෙන යාම සඳහා ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවල දී (උදාහරණයක් ලෙස, කලාපය තුළ සිටින සිවිල් වැසියන් මානව පලිහක් ලෙස යොදා ගැනීම), රාජ්‍යය සහ ක්ෂේත්‍ර ආඥාපතීහු, එක් අතකින් සිවිල් වැසියන් ආරක්ෂා කිරීමේත්, අනෙක් අතින් යුද මුක්ත කලාපයෙන් හට ගන්නා සතුරාගේ වෙඩි බලය අක්‍රිය කිරීමේත් උභතෝකෝටික ප්‍රශ්නයට මුහුණ දෙති.

9.29 සැබවින් ම, ඒකපාර්ශ්වීයව යුද මුක්ත කලාපයක් ප්‍රකාශයට පත් කිරීමෙන්, මූලෝපායාත්මක අරමුණු උදෙසා සිවිල් වැසියන් වෙසෙන සීමාව තුළ තහවුරු වීමට ආණ්ඩුව නොදැනුවත්ව එල්ටීටීඊයට අවස්ථාවක් සම්පාදනය කළේ ද යන්න පිළිබඳව, ශ්‍රී ලාංකික අත්දැකීම විවාදයක් පැන නංවා ඇත.

9.30 එවැනි දුෂ්කර ගැටලු රැසක් පැන නගියි. යුද මුක්ත කලාපවල අනුල්ලංඝනීයත්වය ආරක්ෂා කිරීමට අදාළව ජාත්‍යන්තර මානුෂීය නීතිය පනවා ඇති අවශ්‍යතාවලට අනුකූලව රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම්වල ක්‍රියාවන්හි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නය ඉන් එකකි. අභ්‍යන්තර ගැටුම් තත්ත්වයන් තුළ දී පවත්නා ජාත්‍යන්තර මානුෂීය නීතියට එල්ල වන සමකාලීන අභියෝගවලට විසඳුම් සෙවීමේ දී, යට කී වැනි තත්ත්වයන්ට විසඳුම් සෙවීම සඳහා නිසි ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටීන් වර්ධනය කිරීම අවශ්‍යයෙන් ම කළ යුත්තක් බවට පත් වේ.

9.31 රාජ්‍යාන්තර ගැටුම් සම්බන්ධයෙන් බලපවත්වන ජාත්‍යන්තර නීතියේ පොදු මූලධර්ම 4 වන පරිච්ඡේදයෙහි විස්තර වන පරිදි අභ්‍යන්තර ගැටුම්වලින් මතු වන සියලු සංකීර්ණතාවන් සහ අභියෝගයන් සැලකිල්ලට ගන්නාක් මෙන්, රාජ්‍යයන් සහ රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් අතර ගැටුම් සම්බන්ධයෙන් බලපවත්වන නීතිමය රාමුවක් පරිස්සමින් නිර්මාණය කිරීමෙන් රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්මවලට වැඩිපුර අවනත බව සහතික කිරීමෙහි ලා විසඳුමක් සම්පාදනය කළ හැකි ය. ජාත්‍යන්තර මානුෂීය නීතිය උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් සමකාලීන අදාළත්වයක් සහිත මෙම සංකීර්ණ ගැටලු කෙරෙහි ජාත්‍යන්තර රාජ්‍ය ප්‍රජාවේ ද එක්සත් ජාතීන් සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වැනි අදාළ ජාත්‍යන්තර සංවිධානවල ද ක්ෂණික අවධානය යොමු කරවිය යුතු ය. එවිට, අභ්‍යන්තර ගැටුම්වලට උපයෝගී කර ගැනීමේ දී ජාත්‍යන්තර මානුෂීය නීතියෙහි පවත්නා හිදැස් පිරවීමට සුදුසු නීතිමය මෙවලම් පවතිනු ඇත.

9.32 මෙය, අහිංසක මිනිස් ජීවිත ඛේදනීය ලෙස අහිමි කරමින් තිස් වසරක් පුරා ඇදී ගිය ශ්‍රී ලංකාවේ ගැටුමෙන් උගත හැකි පැහැදිලි පාඩමකි. මෙම අත්දැකීම්වලින් පාඩම් උකහා ගෙන ප්‍රබල නීතිමය රාමුවක් සකස් කිරීම වූකලි, ගැටුමේ ගොදුරු බවට පත් වුණු සියලු දෙනා වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රජාව ඉටු කළ යුතු පැහැදිලි වගකීමකි.

## තුවාලකරුවන් සහ මිය ගිය අය පිළිබඳ ගැටලුව ගැන නිරීක්ෂණ සහ නිර්දේශ

9.33 බලපෑමට ලක් වුණු සිවිල් වැසියන් සහ රැඳවියන් ඍජුව ඉදිරිපත් කළ විස්තර සහ වෙනත් තොරතුරු පරිශීලනය කිරීමෙන් කොමිසමට පැහැදිලි වූයේ, මහජනයාට සිදු වන හානි වැළැක්වීමට ආරක්ෂක හමුදා පරිශ්‍රම දැරුවත්, සිවිල් වැසියන්ට මරණ සහ තුවාල ඇති කරමින් යුද මුක්ත කලාප ඇතුළු සිවිල් වැසියන් සිටි ප්‍රදේශවලට උඩින් වෙඩි හුවමාරු වුණු අවස්ථා පවතින බව යි.

9.34 මානව පලිහකට මුවා වී ආරක්ෂාව සොයමින් සිටි, මරා ගෙන මැරෙන ලබ්ධියක් පදනම් කර ගත් ත්‍රස්තවාදී කණ්ඩායමක් අක්‍රිය කිරීමේ සංකීර්ණ අභියෝගයට ආරක්ෂක හමුදා මුහුණ දුන් ආකාරය කොමිසම අගය කොට සලකයි. එමෙන් ම, ආරක්ෂක හමුදාවන් සහ අනෙක් බලාධිකාරයන් ප්‍රමුඛතාව දුන්නේ සහ සැබවින් ම ඔවුන්ගේ නිසග වුවමනාව වූයේ 'මළ මිනී ගණන් කිරීම නො ව ජීවිත බේරා ගැනීම' ය යන්න ද කොමිසමේ අගැයීමට ලක් වේ. කෙසේ වුව ද, සිවිල් මරණ සහ තුවාලකරුවන් සම්බන්ධයෙන් ප්‍රදේශයේ සිවිල් පරිපාලන බලාධිකාරවලින් හෝ ආරක්ෂක බලාධිකාරවලින් නිල වාර්තාවක් හෝ පශ්චාත් ගැටුම් තක්සේරුවක් සපයා නොමැති බව කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. තම තුවාලකරුවන් පිළිබඳ සංඛ්‍යා සහ එල්ටීටීඊ මරණ සහ තුවාලකරුවන් පිළිබඳ තක්සේරුවක් ආරක්ෂක හමුදා සතුව ඇතත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සැපයුණු සීමිත දත්ත හැරුණු විට සිවිල් මරණ සහ තුවාලකරුවන් සම්බන්ධයෙන් විශ්වසනීය වාර්තාවක් නොමැතිකම, විවිධ ආයතන, මාධ්‍ය ආයතන සහ බලාධිකාර වෙතින් සිවිල් මරණ සහ තුවාලකරුවන් පිළිබඳව පුළුල් ලෙස විවිධ තක්සේරු සංඛ්‍යා ඉදිරිපත් වීමට හේතු වී ඇත.

9.35 සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් සිවිල් පරිපාලනයෙන් හෝ මිලිටරියෙන් ක්‍රියාත්මක කිසිදු නිසි ක්‍රියාවලියක් නොපැවතියේ ය යන කරුණ, මරණ සහ තුවාලකරුවන් පිළිබඳ සංඛ්‍යා සම්බන්ධයෙන් ඉහළින් ම අනුමානාත්මක ස්වභාවයක් ගත්, සත්‍යාසත්‍යතාව පරීක්ෂා නොකළ පුළුල් සාමාන්‍යකරණයන් ඉදිරිපත් වීමට දායක වී ඇත.

.

9.36 කෙසේ වුව ද, කොමිසම පරිස්සමින් සිතා බලා ඇති කර ගත් අදහස නම්, ඇසින් දුටු සාක්ෂිකරුවන් සැපයූ විස්තරවලින් සහ පවත්නා වෙනත් තොරතුරුවලින්, ගැටුමේ අවසන් අදියරවල දී සැලකිය යුතු සිවිල් අනතුරු සංඛ්‍යාවක් සැබවින් ම සිදු විණැයි පෙන්වා දෙන බව යි. වෙඩි හුවමාරු, එල්ටීටීඊය සිවිල් වැසියන් ඉලක්ක කර ගැනීම සහ හිතාමතා ඔවුන්ට වෙඩි තැබීම, එමෙන් ම ගැටුම් තත්ත්වයේ බලපෑම්, භූගෝලීය කලාපයේ උවදුරු, එල්ටීටීඊය සිවිල් වැසියන් මානව පලිහක් ලෙස යොදා ගැනීම සහ එල්ටීටීඊය සරණාගතයන්ට හානිවලින් බේරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම නිසා මෙය සිදු වුණු බව පෙනේ.

9.37 එම නිසා, පහත සඳහන් දේ සඳහා පියවර ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී:

අ. 4.359 vi. (අ) සහ (ආ) නිරීක්ෂණවල දී සඳහන් කෙරෙන සුවිශේෂ සිදුවීම් සහ හිතාමතා සිවිල් වැසියන්ට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව වාර්තාගත ඕනෑ ම සිදුවීමක් පරීක්ෂා කිරීම. පරීක්ෂණවලින් කවර හෝ අපරාධයක් එළිදරව් වන්නේ නම් වැරදිකරුවන්ට චෝදනා ඉදිරිපත් කිරීම/දඬුවම් පැමිණවීම සඳහා අදාළ නීතිමය පියවරයන් ගත යුතු ය.

ආ. ගැටුම් කාල පරිච්ඡේදය තුළ දී සිදු වුණු සිවිල් මරණවල සහ තුවාලවල මෙන් ම දේපළ හානිවල පරිමාණය ඍජුව සොයා දැන ගැනීම සඳහා, බලපෑමට ලක් වුණු සියලු පවුල් ආවරණය කරමින් දිවයිනේ සියලු කොටස්වල වෘත්තීය වශයෙන් සැලසුම් කළ කුටුම්බ සමීක්ෂණයක් සිදු කිරීම.

**'චැනල් ෆෝ වීඩියෝව' පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ**

9.38 හතර වන පරිච්ඡේදයේ V වන කොටසෙහි අඩංගු චැනල් ෆෝ වීඩියෝව පිළිබඳ සලකා බැලීම්වලට අදාළව කොමිසම සතුව පහත දැක්වෙන නිරීක්ෂණ/නිර්දේශ ඇත.

.

අ. රූපාවලියෙහි එන සිදුවීම් 'සැබෑ' ඒවා වුණත් 'නිර්මිත' ඒවා වුණත්, එහි අඩංගු ඡායාරූප සැබවින් ම බිහිසුණු ය, මහත් පිළිකුල උපදවයි.

ආ. වීඩියෝව කෘත්‍රිම ලෙස සිදුවීම් ගොඩ නැගීමට උත්සාහ දරති යි ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ප්‍රබලව කියා සිටියත්, එක්සත් ජාතීන්ගේ විශේෂ සබැඳියාකරුවන් විසින් පත් කෙරුණු ශිල්පීය විශේෂඥයන් අවධාරණය කරන්නේ, සිර භාරයට ගැනුණු බව පෙනෙන ජනයා නීතිමය පටිපාටියකින් තොරව වහා ම මරණයට පත් කිරීම සහ ලිංගික අඩන්තේට්ටම්වලට ලක් කිරීම පිළිබඳව පිළිගත හැකි සේ හැඟෙන තොරතුරු වීඩියෝව සම්පාදනය කරන බව යි. කෙසේ වුව ද, ආණ්ඩුව මෙන් ම සබැඳියාකරුවන්ගේ විශේෂඥයන් ද පෙන්වා දෙන්නේ පැහැදිලි නොකළ ශිල්පීය සංශයන් කිහිපයක් වීඩියෝවෙහි පවතින බව යි.

ඇ. ස්වාධීන විශේෂඥයන්, එනම් ආචාර්ය චතුර ද සිල්වා සහ මහාචාර්ය ඊ.ඒ. ෆැන්ටිස් අවධාරණය කළ තවත් ශිල්පීය ගැටලු සහ අධිකරණ වෛද්‍ය ප්‍රශ්න පවතී. වීඩියෝවේ සත්‍යතාව පිළිබඳව, විශේෂයෙන් ම වීඩියෝව තුළ ඉලෙක්ට්‍රොනිකව වෙනස්කම් කිරීමට සහ කෘත්‍රිමව 'බ්ලඩ් ඉෆෙක්ට්' නිර්මාණය කිරීමට තිබෙන ඉඩකඩ ගැන ඔවුහු සැලකිය යුතු සැකයන් පළ කරති.

ඇ. විකාශනය කරන ලද රූපාවලියේ පිටපතක් නොමැතිකම, එවැනි ශිල්පීය සංශයන් පිළිබඳව තීරණාත්මක පැහැදිලි කිරීමක් සොයා යාමේ දී උදව්වක් වී නැත.

ඉ. එම නිසා, මෙම වීඩියෝවේ සත්‍යතාව සහ එහි අන්තර්ගතයේ විශ්වසනීයත්වය පිළිබඳව සැලකිය යුතු සැකයන් ප්‍රකාශයට පත් කරන බැරෑරුම් ස්වභාවයක වෙහෙසකර ශිල්පීය සහ අධිකරණ වෛද්‍යමය ප්‍රශ්න පවතින බව කොමිසම නිශ්චය කර ගනී. ගොදුරු වූවන්ගේ සිරුරුවල පැහැදිලිව පෙනෙන ප්‍රබල කම්පනය, යොදා ගත් ආයුධ වර්ගයට සහ වෙඩි තැබීම සිදු වුණු බව පෙනෙන සමීප පරාසයට අනුරූප බවක් නො පෙනෙතැයි ද නිරීක්ෂණය කරනු ලැබේ. කෙසේ වුව ද, යමෙකු මෙම ඡායාරූප සහ වීඩියෝව පටිගත කර නොහොත් නිෂ්පාදනය කර අදාළ විකාශකයාට ලබා දෙන්නට ඇතැයි සඳහන් කිරීමට ද කොමිසම කැමැති ය. කොමිසම විසින් පත් කෙරුණු එක් විශේෂඥයෙකු නිරීක්ෂණය කරන්නේ, 'රූපාවලියේ කොටස් ස්වාභාවික පරිසරයක් තුළ පටිගත කරන ලදැයි පෙනෙන' බව සහ ගොදුරු වූවන් යැයි කියනු ලබන ඇතැමුන්ගේ සිරුරු කායිකව හෝ ඩිජිටල් උපක්‍රමවලින් 'හසුරුවා කෘත්‍රිමව නිර්මිත කිසිවක්' පෙන්නුම් නොකරන බව යි.

ඊ. වඩා පුළුල් තොරතුරු සම්පාදනය කරන ලෙස කොමිසම කළ ඉල්ලීමට විකාශකයා ධනාත්මකව ප්‍රතිචාර නොදැක්වීම පිළිබඳව කොමිසම කනගාටුව පළ කරයි. රූපවාහිනී මධ්‍යස්ථාන වෙත මෙම වීඩියෝ ඡායාරූප සම්පාදනය කළ සංවිධානය සහ මෙම රූපාවලිය විකාශය කළ නිෂ්පාදකයා/විකාශකයා වඩා පුළුල් සහයෝගයක් දැක්වීම මෙම සිදුවීමට අදාළ කරුණු තහවුරු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය ය.

9.39 පවත්නා තොරතුරු පදනම් කර ගන්නා සහ ඉහත තැකීම් සැලකිල්ලට ගන්නා කොමිසම, සත්‍යය තහවුරු කිරීම සඳහා මෙම කාරණය සම්බන්ධයෙන් නොහොත් වීඩියෝ රූපාවලියෙන් මතු වන චෝදනා පිළිබඳව ආණ්ඩුව ස්වාධීන පරීක්ෂණයකට මුල පිරිය යුතු යැයි නිර්දේශ කිරීමට කැමැති ය.

9.40 හේතු දෙකක් නිසා මෙම ක්‍රියා මාර්ගය අවශ්‍ය සහ හදිසි යැයි කොමිසම සලකයි:

අ. පළමුව, ඡායාරූප සැපයූ තොරතුරු දෙන්නන් සහ ඇල්ස්ටන් සහ හේන්ස් මහත්වරුන් පත් කළ විශේෂඥයන් පවසන පරිදි, රූපාවලිය සිර භාරයට ගැනුණු සහ ලිංගික දූෂණයට ගොදුරු වුණා විය හැකි පුද්ගලයන් නීතිමය පටිපාටියකින් තොරව වහා ම මරා දැමීම පිළිබඳ සැබෑ සිදුවීම් පිළිබඳ සාක්ෂි පිළිබිඹු කරන්නේ නම්, මේවා පැහැදිලිව ම නීති විරෝධී ක්‍රියාවන් නිසා පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම අත්‍යවශ්‍ය ය. එමෙන් ම, ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කළ සොල්දාදුවන්ගේ සහ විශේෂයෙන් ම සටනේ දී අතිශය ම්ලේච්ඡ උපායන් යොදා ගත් පුළුල් හෙළා දැකීමකට ලක් වුණු ත්‍රස්තවාදී කණ්ඩායමකට එරෙහිව නිවැරදිව සහ වෘත්තීය ආකාරයෙන් තම සටන් රාජකාරි ඉටු කරමින් මිය ගිය සොල්දාදුවන් දහස් ගණනකගේ හොඳ නම විදහා පෑම සහ ගෞරවය සහ වෘත්තීය කීර්තිය ආරක්ෂා කිරීම ද ආණ්ඩුවේ යුතුකමක් වේ. යම් අපරාධයක් කර ඇත් නම්, කිහිප දෙනෙකු කළ අපරාධවලට සේවාවේ මාහැඟි ම සම්ප්‍රදායන් දරා සිටි බොහෝ දෙනෙකුගේ ගෞරවය කෙලෙසීමට ඉඩ දිය නොහැකි ය.

ආ. දෙවනුව, තවත් අතකින් විශේෂඥයන් කිහිප දෙනෙකු තර්ක කරන පරිදි, රූපාවලිය කෘත්‍රිම ලෙස නිර්මාණය කළ එකක් නම් හෝ සිදුවීම් නිර්මිත ඒවා නම්, කාරණය වඩා බරපතළ තත්ත්වයට පත් වන අතර, මෙම කාරණය පිළිබඳව කරුණු තහවුරු කිරීමේ අවශ්‍යතාව, බල කරනසුලු වේ. වීඩියෝවේ අව්‍යාජ භාවය පිළිබඳව ප්‍රකාශිත සැලකිය යුතු සැකයන්ගෙන් සමහරක් කොමිසමට ද තිබෙන අතර, තත්ත්වය වූයේ එය නම්, හිතාමතා අතිශය නින්දිත බොරු ප්‍රචාරය කිරීමේ බරපතළ සිද්ධිය සම්බන්ධයෙන් මෙම වීඩියෝව නිර්මාණය කළ අය සහ එය විකාශය කළ සංවිධානය වගකීම දැරිය යුතු යැයි කොමිසම දැඩි ලෙස හඟී. එවැනි කල්ක්‍රියාවක්, ශ්‍රී ලංකාවේ මහජනතාවට ද එල්ටීටීඊ ග්‍රහණයෙන් අනෙක් අහිංසක ජීවිත බේරා ගනු පිණිස වෘත්තීය ආකාරයෙන් සටන් වැදුණු සහ තම ජීවිත කැප කළ සොල්දාදුවන්ට ද කරන බරපතළ හානියක් සහ අසාධාරණයක් වනු ඇත. එමෙන් ම, එය අදහස් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ මතය ලද දරුණු පරාජයක් ද වනු ඇත. මුදුන් පමුණුවා ගත හැකි සමගි සන්ධාන, සමාදාන සහ යළි ගොඩ නැගීමේ ක්‍රියාවලියක් ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සහ තහවුරු කිරීම සඳහා ජාතිකව සහ ජාත්‍යන්තරව දැන් දරමින් තිබෙන පරිශ්‍රමයන්ට, එවන් ක්‍රියාවන් බරපතළ ලෙස අවාසි පමුණුවන බව සහ මහා බාධාවන් ඇති කරන බව ගැන ද තම බලතල අනුව කොමිසම සැලකිලිමත් වේ.

9.41 එම නිසා, සත්‍යය හෝ නැතහොත් මෙම චෝදනාවල සත්‍යය තහවුරු කිරීමේ සහ රටේ නීතියට අනුකූලව පියවර ගැනීමේ දැක්මකින් යුතුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මෙම ගැටලුව සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් නියම කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. එමෙන් ම, තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සහ තොරතුරු දෙන්නන්ගේ ආරක්ෂාවට පහසුකම් සැපයීම සඳහා විධිවිධාන යෙදිය යුතු යැයි ද කොමිසම හඟී. මෙම කටයුත්තට පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමෙන් මුළුමනින් ම සහයෝගය දැක්විය යුතු යැයි අදාළ සියල්ලන්ගෙන්, විශේෂයෙන් ම මුල් ඡායාරූප සම්පාදනය කළ සංවිධානයෙන් සහ විකාශය කළ සංවිධානයෙන් කොමිසම දැඩි ලෙස ඉල්ලා සිටී.

***පස් වන පරිච්ඡේදය: මානව හිමිකම් පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ***

**සාමාන්‍ය**

9.42 ප්‍රසිද්ධ සභා වාරවල දී සහ ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ වෙත කළ ක්ෂේත්‍ර චාරිකාවල දී, ගැටුමේ බලපෑමට ලක් වුණු ජනයාගේ මූලික අයිතිවාසිකම් සහ නිදහසවල් උල්ලංඝනය කිරීම පිළිබඳව චෝදනා කරමින් කොමිසම හමුවේ ප්‍රකාශ විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරිණ. මේවාට ඇතුළත් වූයේ, පැහැර ගෙන යාම්; බලාත්කාරී නොහොත් අනිච්ඡානුග අතුරුදන් කිරීම්; අත්තනෝමතික ලෙස රඳවා ගැනීම්; වයස නොසැපිරූ දරුවන් බලෙන් හමුදාවට බඳවා ගැනීම්; අධිකරණයෙන් බැහැරව, නීතිමය පටිපාටියකින් තොරව වහා ම හෝ අත්තනෝමතිකව මරණ දඬුවම් පැමිණවීම්; අදහස් ප්‍රකාශනයේ, යාමේ ඊමේ සහ සමාගමයේ නිදහස, ආගමික නිදහස සහ මාධ්‍යයේ ස්වාධීනත්වය උල්ලංඝනය කිරීම ආදිය යි. අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ සහ කාන්තාවන්, ළමයින් සහ ආබාධිතයන් වැනි ගොදුරු විය හැකි අනෙක් කණ්ඩායම්වල අයිතිවාසිකම්වලට අදාළ ගැටලු පිළිබඳව ද ප්‍රකාශ ඉදිරිපත් විය. මෙම මානව හිමිකම් ගැටලු පිළිබඳ තම නිර්දේශ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට තීරණාත්මක ලෙස අදාළ යැයි කොමිසම සලකයි.

**සොයා ගත නොහැකි පුද්ගලයන්, අතුරුදන් වීම් සහ පැහැර ගෙන යාම් සම්බන්ධ චෝදනා**

9.43 ප්‍රසිද්ධ සභා වාරවල දී සහ ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ වෙත කළ ක්ෂේත්‍ර චාරිකාවල දී, ගැටුමේ බලපෑමට ලක් වුණු ජනයාගේ මූලික අයිතිවාසිකම් සහ නිදහසවල් උල්ලංඝනය කිරීම් පිළිබඳව චෝදනා කරමින් ඉදිරිපත් කෙරුණු ප්‍රකාශ විශාල සංඛ්‍යාවකින් කොමිසම කනස්සල්ලට පත් කරනු ලැබිණ. එල්ටීටීඊය කළ පැහැර ගෙන යාම් සහ අතුරුදන් කිරීම් පිළිබඳව කෙරුණු සැලකිය යුතු චෝදනා සංඛ්‍යාවක් ද කොමිසමට අසන්නට ලැබිණ. ප්‍රකාශ විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරුණේ, පැහැර ගෙන යාම්, නීති විරෝධී අත් අඩංගුවට ගැනීම්, අත්තනෝමතික ලෙස රඳවා ගැනීම් සහ අනිච්ඡානුග අතුරුදන් කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතැම් විට වසර ගණනාවක් තිස්සේ ආගිය තැනක් නොදන්නා අය සම්බන්ධයෙනි.

9.44 ප්‍රකාශ ඉදිරිපත් කළ බොහෝ පුද්ගලයන් කොමිසමට අවධාරණය කළේ, අතුරුදන් කිරීම් යැයි චූදිත සිදුවීම්වලට එරෙහිව තීරණාත්මක පියවර ගැනීම මෙන් ම ඒවා වැළැක්වීම සඳහා පියවර ගැනීම ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කරනු ඇති බව යි. අතීත සිදුවීම් යළි සිදුවීම වළක්වනු පිණිස අතීත අත්දැකීම්වලින් පාඩම් උගන්නා බව සහතික කිරීම සඳහා පවතින මූලික අවශ්‍යතාව පිළිබඳව යළි යළිත් මතක් කිරීම් ද ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ දී කරනු ලැබිණ.

9.45 දේශපාලනික මැදිහත් වීම් නිසා අපරාධ පරීක්ෂණ, නීතිය බලාත්මක කිරීම සහ පොලිස් පරිපාලනය හානිකර බලපෑමකට ලක්ව ඇති බවට ද, එහි ප්‍රතිඵලයක් ලෙස අපරාධ යුක්ති පද්ධතිය සම්බන්ධ විශ්වාසය ඛාදනය වී ඇති බවට ද ප්‍රකාශ ඉදිරිපත් කළ මහජන සාමාජිකයන් අතර දැඩි උත්සුක වීමක් පැවතිණ.

9.46 ප්‍රසිද්ධ සභා වාරවල දී සහ ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ වෙත කළ චාරිකා ද ඇතුළු ක්ෂේත්‍ර චාරිකාවල දී, පැහැර ගෙන යාම්, බලාත්කාරී නොහොත් අනිච්ඡානුග අතුරුදන් කිරීම් සහ අත්තනෝමතික ලෙස රඳවා ගැනීම පිළිබඳව චෝදනා කරමින් කළ ප්‍රකාශ විශාල සංඛ්‍යාවකින් කොමිසමට කනස්සල්ලට පත් කරනු ලැබිණ. බොහෝ සිදුවීම්වල දී, පොලිස් ස්ථාන වෙත, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වෙත විධිමත් පැමිණිලි කර තිබෙන බව හෙළිදරව් විය. ඇතැම් සිදුවීම් සම්බන්ධයෙන් පූර්ව පරීක්ෂණ කොමිසම් වෙත ද ප්‍රකාශ ඉදිරිපත් කර තිබිණ. එහෙත්, සොයා ගත නොහැකි බොහෝ පුද්ගලයන් ආගිය තැනක් තව මත් නොදන්නා බවට සමීප ඥාතීහු දිගින් දිගට ම පැමිණිලි කරති. එම නිසා, මෙම චෝදනා පිළිබඳව නිසි පරිදි පරීක්ෂණ පවත්වන බවත්, අපරාධකාරයන් නීතිය හමුවට පමුණුවන බවත් සහතික කිරීම සඳහා වහා ම පියවර ගත යුතු යැයි නීතිය බලාත්මක කරන බලාධිකාරවලට නිර්දේශ කිරීමට ආණ්ඩුව යු9. තුකමින් බැඳී සිටී.

9.47 යටත් වීම හෝ අත් අඩංගුවට ගැනීම හරහා ආණ්ඩුවේ බලාධිකාරවලින් අත් අඩංගුවට ගැනුණු කවර පුද්ගලයෙකුගේ වුව ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම රාජ්‍යයේ වගකීම බව අවධාරණය කිරීමට කොමිසම කැමැති ය.

9.48 සොයා ගත නොහැකි පුද්ගලයන් පිළිබඳ ගැටලුව සියල්ලන් සම්බන්ධ කර ගත් සහ දිගු කාලීන කවර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියකට වුව බරපතළ බාධාවක් විය හැකි බැවින්, හදිසි කටයුත්තක් ලෙස සලකා, එම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා පුළුල් පිවිසුමක් ඇති කර ගත යුතු ය. රටේ විවිධ කොටස්වල සිදු වුණු අතුරුදන් වීම් පිළිබඳ අතීත සිදුවීම් සහ ඒ සම්බන්ධයෙන් දරන ලද පරීක්ෂණාත්මක පරිශ්‍රමයන් සැලකිල්ලට ගත් අතීත කොමිසම්, අනෙකුත් දෑ අතර, මෙම ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා සහ අනාගත සිදුවීම් වැළැක්වීම සඳහා විශේෂ යන්ත්‍රණයක් ද නිර්දේශ කර ඇති බව සඳහන් වේ. මානව හිමිකම් සම්බන්ධයෙන් මතු වී ඇති සහ අනුපිළිවෙළින් බලයට පත් ආණ්ඩු ක්‍රියාත්මක කර නැති මෙම බරපතළ ගැටලුවට විසඳුම් සෙවීම සඳහා උදව් වන නිසා මෙම නිර්දේශ වහා ම ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කරයි. අතීත කොමිසම්වල එවන් තීරණාත්මක නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එක දිගට ම අසමත් වීම, ආණ්ඩුව පත් කරන කොමිසම් සම්බන්ධයෙන් විවේචනයක් සහ සංශයක් උපදවයි. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ පරීක්ෂණ කොමිසම ද මෙම විවේචනයෙන් සහ සංශයෙන් ගැළවී නැත.

9.49 සොයා ගත නොහැකි තම ආදරණීයයන් ආගිය තැන් දැන ගැනීමට ඒ පුද්ගලයන්ගේ සමීප ඥාතීන්ට අයිතිය ඇතැයි ද කොමිසම අවධාරණය කර සිටී. එවන් පුද්ගලයන්ට සිදු වූයේ කුමක් ද යන්න පිළිබඳව සත්‍යය දැන ගැනීමට සහ හිත හදා ගැනීමට ද ඔවුන්ට අයිතිය ඇත. ප්‍රතිසන්ධානය යනු ක්‍රියාවලියකි. ඔවුන් ගැටුමේ ගොදුරු වුව ද, එල්ටීටීඊ ත්‍රස්තවාදයේ ගොදුරු වුව ද, හිත හදා ගැනීම යනු එම දීර්ඝ සහ සංකීර්ණ ගමනේ පළමු දුෂ්කර භාවමය පියවර යි. මෙය වන්දි ලබා ගැනීම ඇතුළු අදාළ නීතිමය සහන ඉල්ලා සිටීම සඳහා ද ඔවුන්ට හැකියාව ලබා දෙනු ඇත.

9.50 සොයා ගත නොහැකි පුද්ගලයන් ආගිය තැන් සොයා ගැනීමට සහ ඔවුන් ඔවුන්ගේ පවුල් සමග යළි එක් වන බව සහතික කිරීමට, අදාළ ආයතනවල විශේෂයෙන් ම ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහයෝගය

ඇතිව, නීතිය බලාත්මක කරන බලාධිකාරයන් සියලු පරිශ්‍රමයන් දැරිය යුතු ය. මේ සම්බන්ධයෙන් සිදු වෙමින් තිබෙන ප්‍රගතිය පිළිබඳව පවුල් දැනුවත් කළ යුතු ය.

9.51 ගැටලුවේ සංකීර්ණත්වය සහ පරිමාණය ද, අතුරුදන් වී ඇති බව කියන පුද්ගලයන් සංඛ්‍යාව සහ අදාළ පරීක්ෂණ සඳහා කාලය ගත වන බව ද සැලකිල්ලට ගෙන, සිදු වුණු බව කියන අතුරුදන් වීම් පිළිබඳව පරීක්ෂා කොට සුදුසු පරිදි අපරාධ පරිපාටිකරණයට මුල පිරීම සඳහා නීතිපතිවරයා වෙත තොරතුරු සැපයීමට විශේෂ පරීක්ෂණ කොමසාරිස්වරයෙකු පත් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. පරීක්ෂණ සහ නීතිමය පියවර ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම සහ පිළියෙළ කිරීම සඳහා කොමසාරිස්වරයාගේ කාර්යාලයට පළපුරුදු පරීක්ෂකයන් සම්පාදනය කළ යුතු ය. සොයා ගත නොහැකි පුද්ගලයන් සම්බන්ධයෙන් වර්තමානයේ දී විවිධ ආයතනවලින් නඩත්තු කෙරෙන සියලු තොරතුරු එක් තැනකට ගෙන, මධ්‍යගත ජාතික මට්ටමේ දත්ත රැස් කිරීමේ පද්ධතියක් සැලසුම් කිරීමට ද මෙම යන්ත්‍රණය ක්‍රියා කළ යුතු ය.

9.52 අවශ්‍ය අවස්ථාවල දී මරණ සහතික සහ මූල්‍ය වන්දි නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුත්තේ අදාළ ජාත්‍යන්තර මිනුම් දඬු සැලකිල්ලට ගනිමින් සහ ප්‍රමුඛතාව පිළිබඳ කාරණයක් ලෙස සලකමිනි. මේ සම්බන්ධයෙන් ගත් කල, මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ පණතෙහි මෑත දී සිදු කළ සංශෝධනය යටතේ, සොයා ගත නොහැකි යැයි වාර්තා වන සහ සාමාන්‍යයෙන් ඔහු/ඇය පිළිබඳව තොරතුරු දන්නා අය වසරකට වැඩි කාලයක් තිස්සේ තොරතුරක් නොදන්නා පුද්ගලයෙකු සම්බන්ධයෙන් මරණ සහතිකයක් ඉල්ලුම් කිරීමට සමීප ඥාතීන්ට හැකියාව ලැබෙන බවත්, ඔහුගේ/ඇයගේ අතුරුදන් වීම ශ්‍රී ලංකාව තුළ සිදු වුණු ඕනෑ ම ත්‍රස්තවාදී හෝ කඩාකප්පල්කාරී ක්‍රියාවකට හෝ සිවිල් කෝලාහලයකට පැවරිය හැකි බවත් කොමිසම සඳහන් කර සිටී. ප්‍රකාශිත කාල සීමාව තුළ, පරිපාලන මට්ටමේ දී, මෙම නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු පියවරයන් ගත යුතු ය. විශේෂයෙන් ම, මෙම පණත යටතේ සම්පාදනය වන ක්‍රියා පටිපාටි සහ සහන ලබා ගැනීමට පහසුකම් සපයනු පිණිස, වෙසෙසින් ම ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශවල දී, මාධ්‍යය, ග්‍රාම නිලධාරීන් යනාදීන් හරහා මෙම පණතේ අදාළ විධිවිධානවලට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු ය.

9.53 කිසිදු නිල වාර්තාවක් නොමැතිව පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම සම්බන්ධ චෝදනා ගණනාවක් කොමිසමට අසන්නට ලැබිණ. එම නිසා, පුද්ගලයන් අත් අඩංගුවට ගන්නා අවස්ථාවල දී, අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විධිමත් කුවිතාන්සියක් නිකුත් කිරීම සහ රඳවා සිටින ස්ථානය පිළිබඳ තොරතුරු සැපයීම වැනි අදාළ නීතිමය විධිවිධාන, නීතිය බලාත්මක කරන බලාධිකාරයන් විසින් පිළිපැදිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. එවන් පුද්ගලයන් රඳවා තැබිය යුත්තේ නීතිය යටතේ ප්‍රකාශිත විධිමත් රැඳවුම් ස්ථානවල පමණකි. සමීප ඥාතීන්ට පැමිණ ඔවුන් හමු වීමේ ඉඩකඩ ද ලබා දෙමින්, එවැනි බලය ලත් රැඳවුම් ස්ථානවලට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු වේ.

9.54 අදාළ මානව හිමිකම් මෙවලම්වල දී ශ්‍රී ලංකාව භාර ගෙන ඇති වගකීම්වලට අනුකූලව සහ ජාතික නීතියේ අවශ්‍යතාවලට අනුකූලව පහත සඳහන් පියවරයන් ගත යුතු යː

අ. නීතියට අනුව කටයුතු කිරීම සඳහා, අත් අඩංගුවට ගැනෙන පුද්ගලයා වහා ම මහේස්ත්‍රාත්වරයෙකු හමුවට පැමිණවිය යුතු ය.

ආ. රැඳවුම් ස්ථානය සම්බන්ධයෙන් සිදු වන කවර වෙනසක් වුව, අත් අඩංගුවට ගැනුණු පුද්ගලයාගේ පවුල සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත වහා ම දැනුම් දිය යුතු ය.

ඇ. මහේස්ත්‍රාත්වරුන් සෑම මසක ම රැඳවුම් ස්ථාන වෙත චාරිකා කළ යුතු ය.

ඈ. රැඳවුමෙන් නිදහස් කිරීම කළ යුත්තේ උසාවි හරහා ය.

9.55 අත් අඩංගුවට ගැනීමක්, රඳවා ගැනීමක් හෝ සිටින ස්ථානය මාරු කිරීමක් වාර්තා කිරීමට හෝ පැහැර ගැනීම් පිළිබඳ පැමිණිලි සටහන් කර ගැනීමට පොලීසිය අසමත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට අසමත් වීම සාපරාධී අපරාධයකට සමාන වන අතර, එවන් වැරදි කළවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ක්‍රියා කළ යුතු ය.

9.56 පුද්ගලයන් ගණනාවක් අත් අඩංගුවට ගෙන, ඒ ඇතැම් සිදුවීම්වල කරුණු මහජන ආරක්ෂාවට අදාළ කිසිදු වරදක් අනාවරණය නොකරන නමුත් හදිසි නීතිය යටතේ රඳවා ගෙන සිටින බවට කෙරෙන චෝදනා ද කොමිසමට අසන්නට ලැබිණ. මේ සම්බන්ධයෙන් ගත් කල, ප්‍රතිසන්ධානය සහ සාමාන්‍ය තත්ත්වය යළි ඇති කිරීම උදෙසා වන වැදගත් සහ සාධනීය පියවරක් ලෙස හදිසි නීතිය ඉවත් කිරීමට ආණ්ඩුව ගත් තීරණය පිළිබඳව කොමිසම පරිස්සම් සහගත අවධානයක් යොමු කරයි. එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් වීමත් සමග මහජනයාගේ කැමැත්ත වූයේ නීතිය රජයීමේ උත්තරීතරත්වයට අනුකූල රටේ සාමාන්‍ය නීතිය යටතේ පාලන කටයුතු සිදු වීම බවට, කොමිසම හමුවේ ඉදිරිපත් කෙරුණු බොහෝ ප්‍රකාශ පැහැදිලි අදහසක් ලබා දුන්නේ ය. එමෙන් ම, හදිසි නීතිය ඉවත් කිරීමේ පූර්ණතම ප්‍රතිලාභය සිවිල් ජන ජීවිතයට ලැබෙනු ඇතැයි සහ තවත් නීති පනවා එවන් ප්‍රතිලාභ පූර්ණ ලෙස භුක්ති විඳීමට හානියක් නොකරනු ඇතැයි යන බලාපොරොත්තුව ද කොමිසම ප්‍රකාශයට පත් කර සිටී.

9.57 ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත (PTA) යටතේ දිගු කාලයක් තිස්සේ අත් අඩංගුවේ රඳවා ගෙන සිටින පුද්ගලයන් පිළිබඳ සිදුවීම් කොමිසම නිරීක්ෂණය කර ඇත. මේ සම්බන්ධයෙන් ගත් කල, මහජන ආරක්ෂක පණත හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ පැනෙන කවර හෝ නීතියක් යටතේ අත් අඩංගුවට ගැනුණු පුද්ගලයන් සම්බන්ධ රැඳවුම සහ අත් අඩංගුවට ගැනීම නිරීක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීම සඳහා ස්වාධීන උපදේශක කමිටුවක් පත් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.58 ඇතැම් සිදුවීම්වල දී, වසර ගණනාවක් තිස්සේ තම පවුලේ සාමාජිකයන් ආගිය තැන් නො දැන සිටීම නිසා ඇති වන ප්‍රබල කම්පනය සමනය කර ගැනීමට පවුල්වලට සහාය විය යුතු ය. සොයා ගත නොහැකිව තිබෙන පුද්ගලයන් පවුලේ ජීවිකාව සරි කරන්නන්ව සිටි තැන්වල දී, ඔවුන්ට මූල්‍යමය වශයෙන් ද සහාය විය හැකි ය. අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවල දී නීතිමය සහාය ද සැපයිය යුතු ය.

9.59 මෙම ගැටලුවට පුළුල්ව විසඳුම් සෙවීම පිණිස සහ අනාගතයේ දී මෙම සංසිද්ධිය තුරන් කර දැමීම පිණිස මෙන් ම පවත්නා හිදැස පිරවීම පිණිස, බලාත්කාරී නොහොත් අනිච්ඡානුග අතුරුදන් කිරීම් විශේෂිතව සාපරාධීකරණය කිරීමට දේශීය නීති සකස් කළ යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී.
9.60 මෙම අතීත සිදුවීම් යළි සිදු නොවන ආකාරයට ඒවායින් පාඩම් උගන්නා බව සහතික කිරීමේ මූලික අවශ්‍යතාවක් ද පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල, පාසල් ළමයින්, තරුණයන්, ආරක්ෂක හමුදාවල සාමාජිකයන් සහ පොලීසිය යනාදීන් ඉලක්ක කර ගනිමින්, පුළුල්ව, දීප ව්‍යාප්තව පවත්වන මානව හිමිකම් අධ්‍යාපනික වැඩ සටහන්වල අවශ්‍යතාව ද කොමිසම අවධාරණය කර සිටී.

**රැඳවියන්ට සැලකීම**

9.61 පුනරුත්ථාපන මධ්‍යස්ථාන කිහිපයකට චාරිකා කළ කොමිසම, වැඩ සටහන් පැවැත්වෙන වෘත්තීය සහ කාරුණික ආකාරයෙන් විස්මයට පත් විය. මෙම වැඩ සටහන් නිසා ඇති වන කාරුණික හැඟීම සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස සිදු වන වෘත්තීය හැකියාවන් ගොඩ නැඟීම නිසැකව ම ප්‍රතිසන්ධානයට දායක වනු ඇත.

9.62 රැඳවුම් ස්ථාන ගණනාවකට ද චාරිකා කළ කොමිසම, නේවාසිකයන් සමග මෙන් ම අදාළ නිලධාරීන් සමග ද සාකච්ඡා කළේ ය. දැඩි මතධාරී එල්ටීටීඊ සැකකරුවන් රඳවා තිබෙන බූස්ස රැඳවුම් මධ්‍යස්ථානයේ දී රැඳවියන් ඉදිරිපත් කළ ප්‍රකාශ අතර, එල්ටීටීඊය තමන් බලෙන් හමුදාවට බඳවා ගත් වාතාවරණ, එල්ටීටීඊයේ දැඩි ග්‍රහණයෙන් මිදී පලා යාමට තමන් දැරූ ප්‍රයත්න සහ තමන් යළි බඳවා ගත් ආකාරය පිළිබඳව තරුණ නේවාසිකයන් කිහිප දෙනෙකු කළ ප්‍රකාශ පැවතිණ. තමන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කරනු ලැබීමකින් තොරව ඔවුන් දිගු කාලයක් තිස්සේ රැඳවුමෙහි ගත කර තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ අධ්‍යාපනික අපේක්ෂාවලට දැඩි බලපෑමක් සිදු වී ඇත. කොමිසමේ අන්තර්වාර නිර්දේශ යටතේ මෙම කාරණයට දැනට මත් අවධානය යොමු කර ඇති අතර, සිදුවීමෙන් සිදුවීම එවැනි සිදුවීම් විභාග කිරීම සඳහා විශේෂ යන්ත්‍රණයක් නිර්මාණය කළ යුතු යැයි එහි දී නිර්දේශ කළ කොමිසම, සුදුසු පරිදි එක් එක් සිදුවීම විභාග කොට හමාර කිරීමට අදාළ ක්‍රියා මාර්ගයක් නිර්දේශ කර සිටී.

9.63 රඳවා ගෙන සිටින තම පවුල් සාමාජිකයන් පිළිබඳව හෝඩුවාවක් දැන ගැනීමට රැඳවියන්ගේ සමීප ඥාතීන්ට මූලික අයිතිවාසිකමක් ඇත. එම නිසා, රැඳවියන්ගේ ලැයිස්තුවක් සහිත මධ්‍යගත පුළුල් දත්ත පදනමක අවශ්‍යතාවක් පවතී. රැඳවියන්ගේ නම්, රැඳවුම් ස්ථානය මෙන් ම සිටින ස්ථානය මාරු කිරීම් පිළිබඳ වාර්තාවක් සහිතව එම ලැයිස්තුව සමීප ඥාතීන්ට ලබා ගැනීමට තැබිය යුතු ය. එවිට, පවුල්වලට එවැනි තොරතුරු ලබා ගත හැකි ය.

9.64 රැඳවියන්ට අදාළ සියලු අන්තර්වාර නිර්දේශ පූර්ණ ලෙස ක්‍රියාත්මක කරන බව සහතික කරන්නැයි අදාළ බලාධිකාරයන්ට නිර්දේශ කිරීම සඳහා ආණ්ඩුව උනන්දු කිරීමට කොමිසම බලාපොරොත්තු වේ.

9.65 රැඳවියන් හමු වීමට සමීප ඥාතීන්ට අයිතියක් ඇත. එම නිසා, මෙම මූලධර්මය උල්ලංඝනය කරන ඕනෑ ම පිළිවෙතක් ඉවත් කළ යුතු ය. ඇතැම් සමීප ඥාතීන්ට තොරතුරු සැපයෙන්නේ වාචිකව පමණක් බව කොමිසම නිරීක්ෂණය කර ඇත. තව ද, බොහෝ දුර ගෙවා පැමිණි පසුව ඇතැම් පවුල් සාමාජිකයන්ට බන්ධනාගාරයෙහි සිටින රැඳවියන් මුණ ගැසීමට ඉඩ දී නැත. අදාළ බලාධිකාරයන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහ ස්වේච්ඡා සංවිධානවල සහයෝගය ඇතිව, රැඳවුම් ස්ථානවල සිටින තම පවුල් සාමාජිකයන් වෙත චාරිකා කිරීමට සමීප ඥාතීන්ට ලබා දෙන වත්මන් ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.66 කොමිසම රැඳවුම් ස්ථාන කිහිපයකට, විශේෂයෙන් ම ඕමන්තේ සහ බූස්සේ පිහිටි අධිආරක්ෂිත ස්ථාන වෙත චාරිකා කළේ ය. එතැන් පටන් ඕමන්තේ මධ්‍යස්ථානය වසා දමා ඇති බව කොමිසම සඳහන් කර සිටී. මෙම මධ්‍යස්ථානවල සිටින නේවාසිකයන් කෙරෙහි බලාධිකාරයන් දක්වන කාරුණික ආකල්පය සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට රැඳවියන් පෞද්ගලිකව හමු වීම සඳහා ද ඇතුළුව මෙම රැඳවුම් ස්ථාන වෙත පිවිසීමේ හැකියාව තිබෙන්නේ ය යන කරුණ කොමිසම අගය කිරීමෙන් යුතුව සඳහන් කර සිටී. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සමග සහයෝගී වීමේ මෙම ප්‍රතිපත්තිය සාදරයෙන් පිළිගන්නා කොමිසම, ආණ්ඩුව මෙම සහයෝගී ප්‍රතිපත්තිය පුළුල් කළ යුතු යැයි ද, රැඳවියන්ගේ සුභසාධනය සහතික කිරීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ ඒ හා සමාන වෙනත් මානුෂීය සංවිධාන සමග ඵලදායී එකඟතාවකට පැමිණිය යුතු යැයි ද දැඩි ලෙස නිර්දේශ කර සිටී.

.

9.67 සියලු රැඳවුම් ස්ථාන බලය ලත් රැඳවුම් ස්ථාන ලෙස නිල වශයෙන් නම් කළ ඒවා විය යුතු අතර, බලය ලත් රැඳවුම් ස්ථානවල හැර අන් කවර හෝ ස්ථානයක කිසි ම පුද්ගලයෙකු නො රැඳවිය යුතු ය. පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමේ දී, අත් අඩංගුවට ගැනීම පිළිබඳව විධිමත් කවිතාන්සියක් නිකුත් කිරීම සහ රැඳවුම් ස්ථානය පිළිබඳ තොරතුරු සැපයීම වැනි දැඩි නීතිමය විධිවිධාන, නීතිය බලාත්මක කරන බලාධිකාරයන් විසින් අනුගමනය කළ යුතු ය.

9.68 තරුණ රැඳවියන් කෙරෙහි, විශේෂයෙන් ම එල්ටීටීඊය බලෙන් හමුදාවට බඳවා ගැනීම හේතු කොට ගෙන අධ්‍යාපනය කඩාකප්පල් වී ඇති අය සහ තම විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන අය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. ඔවුන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ පරීක්ෂණවලට සහ ඒවා අප්‍රමාදීව හමාර කිරීමට ප්‍රමුඛතාව දිය යුතු ය. මේ සම්බන්ධයෙන් ගත් කල, පුනරුත්ථාපන වැඩ සටහන බොහෝ රැඳවියන්ට ජාතික විභාගවලට පෙනී සිටීමේ හැකියාව ලබා දී තිබෙන බව කොමිසම අගය කිරීමෙන් යුතුව සඳහන් කර සිටී.

9.69 තරුණ ළමයින්, කායික ආබාධිතයන් සහ තුවාලවලින් සුවය ලබමින් සිටින අය සම්බන්ධ සිදුවීම් වැනි විශේෂ සිදුවීම් සහ වෛද්‍යමය මැදිහත් වීම් හඳුනා ගැනීම සඳහා නිසි පිරික්සුම් ක්‍රියාවලියක් පැවතිය යුතු ය. ඔවුන්ට අවශ්‍ය විය හැකි විශේෂ සහායන් සම්පාදනය කළ යුතු ය. දිගු කලක් තිස්සේ රඳවා ගෙන සිටීම නිසා සහ ඥාතීන් හමු වීමට නොහැකි වීම නිසා ඇතැම් නේවාසිකයන්ට උපදේශනය අවශ්‍ය වන අවස්ථා ද පැවතිය හැකි ය.

9.70 කොමිසමේ අන්තර්වාර නිර්දේශ මත පදනම් වෙමින්, රැඳවියන් සැලකිය යුතු සංඛ්‍යාවකට අදාළ සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආණ්ඩුව පියවර ගෙන තිබෙන බව කොමිසම අගය කිරීමෙන් යුතුව සඳහන් කර සිටී. කෙසේ වුව ද, ඇතැම් රැඳවියන් චෝදනා ඉදිරිපත් නො කර දිගු කාලයක් තිස්සේ සිරගත කර තැබීම සම්බන්ධයෙන් කොමිසම උත්සුකතාව පළ කර සිටී. ඔවුන්ට චෝදනා ඉදිරිපත් කර හෝ කිසිදු සාපරාධී වරදක් කර ඇති බවට කිසි ම සාක්ෂියක් නොමැති අවස්ථාවල දී ඔවුන් නිදහස් කර, මෙම සිදුවීම්වලට අදාළ නීතිමය කටයුතු හමාර කිරීම සඳහා තීරණාත්මක පියවර ගත යුතු යැයි කොමිසම යළිත් අවධාරණය කර සිටී.

9.71 පුනරුත්ථාපනය කර තිබෙන අය සම්බන්ධයෙන් ගත් කල, ඔවුන් ප්‍රධාන ප්‍රවාහයේ සිවිල් ජීවිතයට ඒකාබද්ධ කෙරෙන බව සහතික කිරීම සඳහා ආණ්ඩුව වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය. මෙම අරමුණ ඉටු කර ගැනීමේ දී, ඒ සඳහා මූල්‍යමය සහ මානව සම්පත් සැපයිය හැකි සිවිල් සාමාජීය සංවිධාන වඩා විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට දිරි ගැන්වීම සඳහා ආණ්ඩුව ක්‍රියාත්මකව කටයුතු කළ යුතු බව කොමිසමේ අදහස යි.

**නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්**

9.72 විශේෂයෙන් ම සමාලෝචනයට ලක් වන කාල පරිච්ඡේදය තුළ දී නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් කළ ක්‍රියාකාරකම් පිළිබඳව කොමිසම බරපතළ උත්සුකතාවක් පළ කර සිටී. ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ වෙත කළ ක්ෂේත්‍ර චාරිකාවල දී කොමිසම හමුවේ ඉදිරිපත් කෙරුණු ප්‍රකාශ ගණනාවකට අනුව, එවැනි කණ්ඩායම්වල ආධිපත්‍යධාරී පෙනී සිටීම සහ ක්‍රියාකාරකම් පොදු ජනතාව අතර භීතියක් නිර්මාණය කර ඇති අතර, දඬුවම් නො ලැබ ගැළවී යාමේ වාතාවරණයකට දායක වෙමින් පවතින බව පෙනී ගියේ ය. මෙම කණ්ඩායම් කළ බවට චූදිත පැහැර ගෙන යාම්, අයුතු සිර කර තැබීම් සහ බලෙන් මුදල් ලබා ගැනීම් සම්බන්ධ සිදුවීම් ගණනාවක් පවතින නිසා, ඔවුන් කරන ඇතැම් නීති විරෝධී ක්‍රියාවන් ජීවත් වීමේ අයිතිය වැනි මූලික මහජන අයිතිවාසිකම් කෙරෙහි බලපා ඇත. පැහැර ගැනුණු බොහෝ දෙනා පිළිබඳ හෝඩුවාවක් තව මත් නො දන්නා අතර, තවත් ඇතැම් අය ඉන් පසුව මිය ගිය බව සොයා ගෙන ඇත. මෙම ක්‍රියාවන් සත්‍ය බව සනාථ වුව හොත්, මහජනයාගේ මූලික නිදහසවල් සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට සමාන වන්නේ ය.

9.73 සත්‍යය සොයා දැන ගැනීමේ සහ ප්‍රමාණවත් සාක්ෂි සොයා ගත හැකි සිදුවීම්වල දී වැරදිකරුවන්ට එරෙහිව අපරාධ පටිපාටිකරණයට මුල පිරීමේ දැක්මකින් යුතුව නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්වලට එරෙහි චෝදනා සම්බන්ධයෙන් නිසි පරීක්ෂණ පැවැත්විය යුතු බව කොමිසමේ අදහස යි.

9.74 මෙම කණ්ඩායම් නිරායුධ කිරීම සඳහා සහ ඒවායේ නීති විරෝධී ක්‍රියාකාරකම් අවසන් කිරීම සඳහා ද පියවර ගත යුතු ය. එසේ නො කළ හොත්, දැන් සිදු වෙමින් පවත්නා ප්‍රතිසන්ධාන බරපතළ බාධාවක් සිදු වනු ඇත. මේ සම්බන්ධයෙන් ගත් කල, සියලු නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් නිරායුධ කළ යුතු යැයි ඉල්ලා සිටින තම අන්තර්වාර නිර්දේශය කොමිසම බැරෑරුම් ලෙස යළි ප්‍රකාශයට පත් කර සිටී. මේ සම්බන්ධයෙන් ඇතැම් පියවර ගෙන ඇතැයි සඳහන් කරන කොමිසම, කිසිදු තීරණාත්මක පියවරක් ගෙන නොතිබීම පිළිබඳව කනගාටුව පළ කර සිටී. නියමිත කාලයක් සහිත සහ සත්‍යාසත්‍යතාව පරීක්ෂා කළ හැකි ක්‍රියාවලියක කොටසක් ලෙස මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා තීරණාත්මක පියවර ගැනීම අත්‍යවශ්‍ය ය. කොමිසමේ අන්තර්වාර නිර්දේශ සම්බන්ධයෙන් කාලීන පියවර ගෙන තිබුණේ නම්, *උදයන්* පුවත්පතේ කර්තෘවරයාට එල්ල කෙරුණු මෑත ප්‍රහාරය වැනි බැරෑරුම් සිදුවීම් වැළකෙන්නට ඉඩ තිබුණු බව කොමිසමේ අදහස යි.

**ළමයින් බලෙන් හමුදාවට බඳවා ගැනීම**

9.75 ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ වෙත කළ ක්ෂේත්‍ර චාරිකාවල දී, ළමයින් බලෙන් හමුදාවට බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රකාශ ගණනාවක් කරනු ලැබුණු අතර, දෙමාපියන් පවසන පරිදි මෙම ළමයින්ගෙන් බොහෝ දෙනෙකු ආගිය තැනක් තව මත් නො දනී. ළමයින් බලෙන් හමුදාවට බඳවා ගැනීම, ගැටුම් සමය තුළ දී එල්ටීටීඊය කළ දරුණු ම අපරාධවලින් එකකි.

9.76 එල්ටීටීඊය හැර වෙනත් කණ්ඩායම් නැගෙනහිර දී වයස නොසැපිරුණු ළමයින් බඳවා ගැනීම පිළිබඳව ද උත්සුකතා පැවතිණ. මෙම තත්ත්වය තුළ දී, "තමිල් මක්කල් විඩුදලෛයි පුලිකල්හි ළමයින් බඳවා ගැනීමේ පිළිවෙත නතර කරන බව සහ එම සන්නද්ධ කණ්ඩායම බඳවා ගත් හෝ යොදා ගත් සියලු ළමයින් නිදහස් කරන බව සහ යළි සමාජයට ඒකාබද්ධ කිරීමට සහාය වන බව සහතික කිරීම" සඳහා, 2008 දෙසැම්බර් මාසයේ දී, තමිල් මක්කල් විඩුදලෛයි පුලිකල් (TMVP), පුනරුත්ථාපන කටයුතු පිළිබඳ මහ කොමසාරිස්වරයා සහ යුනිසෙෆ් ආයතනය අතර අත්සන් කෙරුණු ත්‍රෛපාර්ශ්වීය ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව සඳහන් කිරීමට කොමිසම කැමැති ය.

9.77 ආසන්නතම පශ්චාත් යුද අදියරේ දී ආණ්ඩුවේ ඉහළ ම ප්‍රමුඛතාව විය යුත්තේ හිටපු ළමා සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම යි. හිටපු ළමා සටන්කරුවන් සිය ගණනක් පුනරුත්ථාපනය කොට යළි සමාජයට ඒකාබද්ධ කළ ආණ්ඩුවේ පුනරුත්ථාපන වැඩ සටහන සහ විශේෂයෙන් ම ළමාරක්ෂණ සහ පරිවාස කටයුතු පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වුණු ප්‍රජා පාදක නිවැරදි කිරීමේ වැඩ සටහනේ පිවිසුම පිළිබඳව කොමිසම සඳහන් කරන්නේ සතුටිනි. රාජ්‍ය නොවන සංවිධානවල සහ සිවිල් සාමාජීය සංවිධානවල සහයෝගය ඇතිව හිටපු ළමා සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා එම ප්‍රජා පාදක පිවිසුම ම යොදා ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.78 පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී, පුනරුත්ථාපන වැඩ සටහන සම්පූර්ණ කළ වහා ම ළමයින්ට තම පවුල් සමග ජීවත් වීමට ඉඩ දෙන බව සහ ජීවනෝපායක් සරි කර ගැනීමට ඔවුන්ට උදව් වන බව සහ තම විධිමත් හෝ නොවිධිමත් අධ්‍යාපනය අඛණ්ඩව කර ගෙන යාමට ඔවුන්ට සහාය වන බව සහතික කරන ලෙස, අදාළ පුනරුත්ථාපන බලාධිකාරවලින් කොමිසම ඉල්ලා සිටී. මේ සම්බන්ධයෙන් ගත් කල, ළමයින් තම ප්‍රජාවන් තුළ තම දෙමාපියන් සමග සහ/හෝ විස්තෘත පවුල් සාමාජිකයන් සමග සිටීමේ වැදගත්කම කොමිසම

අවධාරණය කර සිටී. සංස්කෘතික සම්ප්‍රදායන්හි නො වෙන් කළ හැකි කොටසක් වන එම සිරිතට ගරු කළ යුතු ය. දිගු කාලයේ දී ඔවුන් තම පවුල් සහ ප්‍රජාවන් සමග යළි ඒකාබද්ධ කිරීමට ද මෙය උදව් වනු ඇත.

9.79 සටන්කරුවන් ලෙස ළමයින් බලෙන් බඳවා ගැනීම පිළිබඳව පිළිගත හැකි සාක්ෂි තිබෙන අවස්ථාවල දී, චෝදනා කරනු ලබන එවැනි ඕනෑ ම සිදුවීමක් පිළිබඳව පරීක්ෂා කළ යුතු අතර, වැරදිකරුවන් නීතිය හමුවට පැමිණවිය යුතු ය. මේ සම්බන්ධයෙන් ගත් කල, නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්/එල්ටීටීඊයට හෝ කවර හෝ දේශපාලන පක්ෂයකට අනුබද්ධ කණ්ඩායම් ළමයින් බඳවා ගත් බවට කෙරෙන පැමිණිලි, එම පිළිවෙත අනාගතයේ දී ඇති නොවන බව සහතික කිරීම සඳහා වැරදිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ දැක්මකින් යුතුව පරීක්ෂාවට ලක් කළ යුතු ය. තමිල් මක්කල් විඩුදලෙයි පුලිකල්, පුනරුත්ථාපන කටයුතු පිළිබඳ මහ කොමසාරිස්වරයා සහ යුනිසෙෆ් ආයතනය අතර ඇති කර ගත් ක්‍රියාකාරී සැලැස්ම ක්ෂණිකව බලපවත්වන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කළ යුතු යැයි කොමිසම ඉල්ලා සිටී. එවිට, තමිල් මක්කල් විඩුදලෙයි පුලිකල්හි ළමයින් බඳවා ගැනීමේ පිළිවෙත නතර වෙයි, බඳවා ගැනුණු ළමයි නිදහස ලබති, පුනරුත්ථාපනයෙන් පසුව ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවන් සමග යළි ඒකාබද්ධ කෙරෙති.

.

9.80 අදාළ බලාධිකාරයන් පෞද්ගලික අංශයේ උපදෙස් විමසා කලින් ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ තුළ වැඩි රැකියා අවස්ථා සම්පාදනය කළ යුතු යැයි කොමිසම උදක් ම ඉල්ලා සිටී. පාසල අත් හැරී ඇති ළමා සටන්කරුවන් කෙරෙහි යම් නම්‍යශීලී බවක් පළ කළ යුතු ය. තව ද, වැටුප් ලබන රැකියාවක නිරත වන ගමන් තම විධිමත් අධ්‍යාපනික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට මෙම හිටපු ළමා සටන්කරුවන් දිරි ගැන්විය යුතු ය, ඒ සඳහා ඔවුන්ට පහසුකම් සැපයිය යුතු ය.

9.81 සන්නද්ධ ගැටුමට නිරාවරණය වුණු ළමයින් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ දැනුම සහ අත්දැකීම ඇති අදාළ එක්සත් ජාතීන්ගේ ආයතනවලින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවෙන්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලින්, රාජ්‍ය නොවන සංවිධානවලින් සහ සිවිල් සාමාජීය සංවිධානවලින්, විශේෂයෙන් ම යුනිසෙෆ් ආයතනයෙන් සහාය ලබා ගැනීමේ හැකියාව ගැන ද ආණ්ඩුව සොයා බැලිය යුතු ය. මෙම තත්ත්වය තුළ දී, යුනිසෙෆ් ආයතනයේ සහාය ඇතිව පවුල් සොයා යාමේ සහ යළි එකමුතු කිරීමේ (FTR) ඒකකය පිහිටුවීම සහ ළමයින් පිළිබඳ දත්ත තුලනය කිරීම සම්බන්ධයෙන් එය අත් කර ගෙන තිබෙන ප්‍රගතිය ධනාත්මක පියවරක් යැයි කොමිසම සඳහන් කර සිටී. ආණ්ඩුව මෙම මුල පිරීම ක්‍රියාත්මකව දිරි ගැන්වීමත් ඊට සහාය දීමත් කළ යුතු අතර, සියලු ආයතන, විශේෂයෙන් ම ආරක්ෂක ආයතන මෙම ක්‍රියාවලියේ දී සහයෝගී විය යුතු ය. එවිට, දත්ත තුලනය ළමයින් තම පවුල් සමග සැබවින් ම යළි එකමුතු වීමට හේතු විය හැකි ය. ළමයින් සොයා යාමේ පුළුල් වැඩ සටහනක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා, ජාතික, ආණ්ඩුවෙන් මෙහෙයවෙන, බහුවිෂයීය කාර්ය බලකායක් පිහිටුවීම පිළිබඳව ද ආණ්ඩුව සලකා බැලිය යුතු ය.

9.82 සිදුවීමෙන් සිදුවීම පරීක්ෂා කිරීමට ප්‍රමුඛතාව දිය යුතු ය. තරුණ එල්ටීටීඊ සැකකරුවන් සම්බන්ධ සිදුවීම්, පමාවකින් තොරව නීතිමය පියවරයන්ට මුල පිරීමේ හෝ ඔවුන් පුනරුත්ථාපනය කිරීමේ සහ/හෝ නිදහස් කිරීමේ දැක්මකින් යුතුව පරීක්ෂා කළ යුතු ය.

**ගොදුරු විය හැකි කණ්ඩායම්**

**සාමාන්‍ය**

.

9.83 කාන්තාවන්, ළමයින්, අභ්‍යන්තරව අවතැන් වූවන් සහ ආබාධිතයන් වැනි ගොදුරු විය හැකි කණ්ඩායම්වලට අදාළව ගැටුම බොහෝ ගැටලු උපදවා ඇත. සැලකිය යුතු ලෙස පීඩාවට පත් වුණු මෙම කණ්ඩායම් පිළිබඳව ප්‍රකාශ කිහිපයක් කොමිසමට අසන්නට ලැබිණ. මෙම කණ්ඩායම්වල මූලික අවශ්‍යතා සැපිරීම, වත්මන් පශ්චාත් ගැටුම් වාතාවරණයේ දී ආණ්ඩුවේ ප්‍රමුඛතාවක් විය යුතු අතර, මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව කල් පවත්නා විසඳුම් සොයා ගත යුතු ය. මන්ද, ඉන් තොරව තිරසර සහ සියලු කණ්ඩායම් සහභාගි කර ගත් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් මුදුන් පමුණුවා ගත නොහැකි බැවිනි.

9.84 කොමිසමේ ක්ෂේත්‍ර චාරිකා අතරතුර දී, ජීවිත බරපතළ ලෙස කඩා බිඳ වැටෙමින් ගැටුමේ ප්‍රධාන පහරට ලක්ව ඇති ජන කොටස් වන්නේ කාන්තාවන්, ළමයින් සහ වයස්ගතයන් බව පැහැදිලි විය. බොහෝ කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන් අහිමි වී ඇත, නැතහොත් ඔවුන් ආගිය තැනක් නො දනිති. එවන් ප්‍රබල කම්පනයක් සහ දුෂ්කරතාවක් තිබිය දීත්, තරුණ ළමයින් සහ වයස්ගත දෙමාපියන් සහිත තම පවුල්වලට

ඔවුහු අඛණ්ඩව සහාය වෙති. මෙම පරිශ්‍රමයන්හි දී, තමන් ජීවත් වන්නේ සුරක්ෂිත වාතාවරණයක බවත්, තම මානව අභිමානය ආරක්ෂා කෙරෙන බව සහ සුරක්ෂිත කෙරෙන බවත් කාන්තාවන්ට හැඟී යා යුතු ය.

9.85 පවුලක් බලාපොරොත්තු වන එක ම දෙය නම් තම ආදරණීයයන් ජීවත්ව සිටින්නේ ද නැත් නම් මිය ගොස් ද යන්න තහවුරු කර ගැනීම බවටත්, එවිට ඒ අනුව තමන්ට තම සංස්කෘතික සහ ආගමික වතාවත් ඉටු කොට තම ජීවිත පෙරට ගෙන යා හැකි බවටත් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් කළ ප්‍රකාශයක් විශේෂයෙන් ඉස්මතු කර දැක්වීමට කොමිසම කැමැති ය. එම ප්‍රකාශ කෙරෙහි සානුකම්පික වන කොමිසම, අවසානයක් පිළිබඳ හැඟීමක් ඇති කිරීමේ අවශ්‍යතාවක් පවතින බව හඳුනා ගනී. මෙම හැඟීම, ඕනෑ ම අර්ථාන්විත සමාදාන සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් උදෙසා වැදගත් දායක සාධකයක් වනු ඇත.

**කාන්තාවෝ**

9.86 බොහෝ කාන්තා මූලික කුටුම්බයන්ට සහ ඔවුන් නියෝජනය කළ සංවිධානවලට සවන් දුන් සහ ගැටුමේ විපාකයක් ලෙස රට තුළ එවැනි කාන්තාවන් විශාල සංඛ්‍යාවක් සිටින්නේ ය (ආණ්ඩුවේ මූලාශ්‍රවලට අනුව 59,000කට වැඩි ය) යන කරුණ සැලකිල්ලට ගත් කොමිසම, එම කාන්තාවන්ගේ සහ කාන්තා ගෘහ මූලික කුටුම්බවල සුභසාධනය වූකලි, ප්‍රතිසන්ධානය උදෙසා දරන සාමූහික පරිශ්‍රමයක දී ආණ්ඩුව සහ අනෙක් සියලු පාර්ශ්වකරුවන් ප්‍රමුඛ කාරණයක් ලෙස සලකා විසඳුම් සෙවිය යුතු ප්‍රධාන පශ්චාත් යුද අභියෝගයක් ලෙස හඳුනා ගනී.

.

9.87 බොහෝ කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන් අහිමි වී ඇත, නැත් නම් ඔවුන් ආගිය තැනක් නො දනිති. ඇතැම් අවස්ථාවල දී, ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් දිගු සහ අනිශ්චිත කාලයක් තිස්සේ රැඳවුම් කඳවුරුවල රඳවා තබා ගෙන ඇත. එවන් ප්‍රබල කම්පනයක් තිබිය දීත්, කාන්තාවන් තම පවුල්වලට සහාය විය යුතු යැයි අපේක්ෂා කරනු ලැබේ. එවැනි බොහෝ පවුල්වල තරුණ ළමයි සහ වයස්ගත දෙමාපියෝ සිටිති. ඉහත දක්වන ලද කරුණු පෙරදැරි කොට ගෙන, කාන්තාවන්ගේ, විශේෂයෙන් ම ඉතා බොහෝ අවස්ථාවල දී තම කුටුම්බවල ගෘහ මූලිකයන් බවට පත්ව සිටින වැන්දඹු කාන්තාවන්ගේ හදිසි අවශ්‍යතා සැපිරිය යුතු ය. මෙම හදිසි අවශ්‍යතාවලට ඇතුළත් වන්නේ, වර්තමානයේ දී ඔවුන් සහ ඔවුන්ගේ පවුල් දරා ගෙන ජීවත් වන දැවැන්ත ආර්ථික දුෂ්කරතා සහ දරිද්‍රතාව අඩු කර ගැනීමට හැකි වන පරිදි ජීවනෝපාය ක්‍රම සහ වෙනත් ආදායම් උත්පාදන ක්‍රම සම්පාදනය කර ආර්ථික සහාය සැපයීම යි.

9.88 මෙම කර්තව්‍යයේ දී සහාය කර ගැනීම සඳහා මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥතාවක් සහ සම්පත් තිබෙන අදාළ ජාත්‍යන්තර සංවිධානවල සහ සිවිල් සාමාජීය කණ්ඩායම්වල සේවාවන් ලබා ගැනීම සහ යොදා ගැනීම සඳහා ආණ්ඩුව වඩා පුළුල් සහ තිරසර පරිශ්‍රමයන් දැරිය යුතු ය. වඩාත් ම වැදගත් වන්නේ, පවුල්වලට සහ ගම්මානවලට සහාය වීම හරහා ප්‍රජාවන්ට උදව් වන ප්‍රජා මට්ටමේ සංගම්වලට සහ සහායක කණ්ඩායම්වලට, මේ සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කළ හැකි වීම යි. එවැනි සම්බන්ධකම් හරහා, මෑතක දී යළි පදිංචි කෙරුණු තනිකඩ මව්වරුන්ට සහ ආබාධිත මව්වරුන්ට තමන් මුහුණ පාන ගැටලු විසඳා ගැනීම සඳහා සාමූහික පරිශ්‍රමයන් දැරිය හැකි ය, පළාත් පාලන ආයතනවල, දේශපාලන නායකත්වයේ සහ රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සාමාජීය සංවිධාන වැනි වෙනත් සහායක ව්‍යුහයන්ගේ අවධානය තමන් වෙත යොමු කරවා ගත හැකි ය. එවන් ප්‍රජා මට්ටමේ සහායක කණ්ඩායම්වලට, ගැටුම පුරා තමන් දිවි ගෙවා ඇති දුෂ්කර තත්ත්වයන් සහ පෞද්ගලික ඛේදවාචකයන් නිසා ප්‍රබල කම්පනයකට ගොදුරු වී සිටින මහජනයාගේ භාවමය සහ ආධ්‍යාත්මික අවශ්‍යතාවන්ට ද විසඳුම් සෙවිය හැකි ය. ආණ්ඩුව එවන් සහයෝගිතාවන් දිරි ගැන්විය යුතු යැයි ද ඒවාට පහසුකම් සැපයිය යුතු යැයි ද කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී.

9.89 දිග් ගැසුණු ගැටුම නිසා සහ පවුලෙහි පිරිමින් සොයා ගත නොහැකිව තිබීම නිසා තම විධිමත් අධ්‍යාපනය අඛණ්ඩව කර ගෙන යා නොහැකි බොහෝ කාන්තාවෝ සිටිති. පශ්චාත් යුද වාතාවරණයක දී, තම විධිමත් අධ්‍යාපනය අඛණ්ඩව කර ගෙන යාම සඳහා හෝ රැකියාවක් සොයා ගැනීමේ දී සහ/හෝ වෙනත් ජීවනෝපාය ක්‍රියාකාරකම්වල යෙදීමේ දී පහසුකමක් විය හැකි, වෙනත් නොවිධිමත් අධ්‍යාපන සහ/හෝ වෘත්තීය පුහුණු කටයුතුවල නිරත වීම සඳහා, එවන් කාන්තාවන්ට අවස්ථාවන් සහ විකල්පයන් සම්පාදනය කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.90 තමන් ජීවත් වන්නේ සුරක්ෂිත වාතාවරණයක බව සහ තම මූලික මානව අභිමානය ආරක්ෂා කෙරෙන බව සහ සුරක්ෂිත කෙරෙන බව කාන්තාවන්ට හැඟී යා යුතු ය. රටේ සියලු ප්‍රදේශවල, විශේෂයෙන් ම ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශවල, ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතාවක් ලෙස

සලකා එවන් උපකාරී වාතාවරණයක් නිර්මාණය කිරීමට ආණ්ඩුවට වගකීමක් ඇතැයි යනු කොමිසමේ අදහස යි.

9.91 සොයා ගත නොහැකි පුද්ගලයන්, පැහැර ගෙන යාම්, අත්තනෝමතික රඳවා තැබීම්, දිගු සහ අනිශ්චිත රඳවා තැබීම් සහ අතුරුදන් වීම් සම්බන්ධ ගැටලු කාන්තාවන්ට ඍජුව බලපා ඇත. මන්ද, බොහෝ විට ඒවාට ගොදුරු වී ඇත්තේ, සාම්ප්‍රදායික කුටුම්බයක් තුළ දී දිවි පෙවෙත සරි කරන්නන් ලෙස මෙන් ම ආරක්ෂාව සපයන්නන් ලෙස ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරන සිය ස්වාමිපුරුෂයන්, පුතුන්, පියවරුන් සහ සහෝදරයන් යනාදීන් බැවිනි. ඒ නිසා ම, රටේ සමපුරවැසියන් ලෙස මෙම කාන්තාවන්ට තම ආදරණීයයන් ආගිය තැනක් දැන ගැනීමට අයිතියක් ඇතැයි, සත්‍යය දැන ගැනීමට සහ නීතිමය සහන ලැබීමට අයිතියක් ඇතැයි පිළිගෙන ප්‍රමුඛතාව දිය යුතු කාරණයක් ලෙස සලකා මෙම ගැටලුවලට විසඳුම් සෙවිය යුතු ය. මේවා ඕනෑ ම සාර්ථක, කල් පවත්නා සහ සියලු දෙනා සම්බන්ධ කර ගත් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් සඳහා පූර්වාවශ්‍යතාවන් ය.

9.92 මෙම අතිවිශාල අභියෝගයට මුහුණ දිය හැක්කේත්, කල් පවත්නා විසඳුම් සොයා ගත හැක්කේත්, බොහෝ අන්තර් සම්බන්ධිත ගැටලුවලට සහ අවශ්‍යතාවන්ට විසඳුම් සොයමින් අන්තර් ආයතනික සම්බන්ධීකරණය හරහා දැරෙන පරිශ්‍රමයකින් පමණක් බව කොමිසමේ අදහස යි. මේ අනුව, ගැටුමේ බලපෑමට ලක් වුණු කාන්තාවන්ගේ, ළමයින්ගේ, වයස්ගතයන්ගේ සහ ආබාධිතයන් වැනි ගොදුරු විය හැකි වෙනත් කණ්ඩායම්වල අවශ්‍යතාවන්ට පුළුල් ආකාරයකින් විසඳුම් සෙවීම සඳහාත්, අවශ්‍ය සහන සැපයීම සඳහාත් විධිනියෝග සහිත අන්තර් ආයතනික කාර්ය බලකායක් නො පමාව පිහිටුවිය යුතු ය.

**ළමයි**

9.93 ළමයින්ට, විශේෂයෙන් ඔවුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් උපකාර කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් විය යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. පාසල්, ගුරුවරුන්, පාසල්වලට වුවමනා ද්‍රව්‍ය, ශිෂ්‍යත්ව වැනි මූල්‍යමය සහ වෙනත් ස්වරූපයේ සහායන් සම්පාදනය කිරීම මෙහි ලා සැලකිල්ලට ගත යුතු ය. එමෙන් ම, වඩා යහපත් අධ්‍යාපනික සහ සෞඛ්‍යමය පහසුකම් සැපයීම සහ ළමා නිවාසවලට සහ අනත්දරු නිවාසවලට අඛණ්ඩව මූල්‍යමය සහ ද්‍රව්‍යමය සහාය සැපයීම ද මෙම පරිශ්‍රමයේ දී ඉතා වැදගත් ය.

9.94 ප්‍රචණ්ඩ ගැටුමට නිරාවරණය වී ඇති නිසා සහ තම ආදරණීයයන් - ඇතැම් විට තම පියා, මව යනාදීන් - අහිමි වී ඇති නිසා, ප්‍රබල කම්පනයෙන් සහ වෙනත් මනෝ විද්‍යාත්මක අපහසුතාවලින් පීඩා විඳින ළමයින් ඉන්නා බව කොමිසම සඳහන් කර සිටී. මෙය ඔවුන්ගේ වැඩීමට සහ අධ්‍යාපනයට දරුණු ලෙස බාධා කළ හැකි ය. විධිමත් අධ්‍යාපන පද්ධතිය හරහා මෙන් ම එවැනි ක්ෂේත්‍රවල ක්‍රියාකාරී වෙනත් ප්‍රජා, සිවිල් සාමාජීය කණ්ඩායම් හරහා ප්‍රමුඛතාව දිය යුතු කාරණයක් ලෙස සලකා, ආණ්ඩුව විශේෂ අවධානයක් අවශ්‍ය කරන එවැනි ළමයින් හඳුනා ගත යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. අවශ්‍ය අවස්ථාවල දී, මෙම ළමයින්ට වෘත්තීය උපදේශනය ද ඇතුළුව විශේෂ අවධානයක් සහ රැකවරණයක් සම්පාදනය කළ යුතු ය. කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන කුටුම්බවල ජීවත් වන ළමයින් හඳුනා ගැනීම මෙම ගැටලුවට විසඳුම් සෙවීමේ එක් ක්‍රමයක් විය හැකි ය.

9.95 පාසල්, වඩා යහපත් සෞඛ්‍ය රැකවරණ පහසුකම්, ක්‍රීඩාංගන, සහ ළමා උද්‍යාන වැනි විනෝදායන පහසුකම්වලින් පහසුවෙන් ප්‍රයෝජන ලැබීමේ හැකියාව ඇතුළු ළමා හිතකාමී වාතාවරණයන් ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ තුළ නිර්මාණය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට, කොමිසම ආණ්ඩුව, පළාත් පාලන බලාධිකාරයන් සහ ප්‍රජා සහ සිවිල් සාමාජීය සංවිධාන ඇතුළු අනෙක් පාර්ශ්වකරුවන් දැඩි ලෙස දිරි ගන්වා සිටී.

**වයස්ගතයෝ**

9.96 ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශවල වෙසෙන වයස්ගතයන් අප්‍රමාණ ලෙස පීඩා විඳ ඇති බවත්, ඇතැම් විට තම දරුවන් සහ මුණුබුරු මිණිබිරියන් ගැටුමේ ඍජු ගොදුරු බවට පත්ව ඇති නිසා ගැටුම මුළුල්ලෙහි වසර ගණනාවක් තිස්සේ ඔවුන්ට තම විස්තෘත පවුල් රැක බලා ගැනීමේ වගකීම දැරීමට සිදු වුණු බවත් කොමිසම හඳුනා ගනී. සමාජයේ මෙම කොටසට දැරීමට සිදුව ඇති කායික දුෂ්කරතා, ප්‍රබල මානසික කම්පනය සහ ආර්ථික දුෂ්කරතා මීට වඩා වැඩියෙන් හඳුනා ගත යුතු ය. එම නිසා, කොමිසම පහත සඳහන් පියවරයන් දැඩි ලෙස නිර්දේශ කර සිටීඃ

අ. ගැටුමේ බලපෑමට ලක් වුණු පවුල්වල තත්ත්වයන් වැඩි දියුණු කිරීම අරමුණු කර ගත් වැඩ සටහන්වලට, තම විස්තෘත පවුල් නඩත්තු කිරීම සහ රැක බලා ගැනීම සම්බන්ධයෙන් වයස්ගතයන් මත පැටවී ඇති බර අඩු කිරීම සඳහා වන විධිවිධාන ඇතුළත් විය යුතු ය.

ආ. ආබාධිතත්වය සහ ගැටුමට සම්බන්ධිත ප්‍රබල කම්පනය ඇතුළු දිගු කලක් තිස්සේ නො තකා හැරුණු වෙනත් සෞඛ්‍ය ගැටලු නිසා වයස්ගතයන්ට තිබෙන විශේෂ අවශ්‍යතා කෙරෙහි ආණ්ඩුව සහ පාර්ශ්වකරුවන් අවධානය යොමු කළ යුතු ය.

9.97 පහසුවෙන් සහ අබාධිතව ආධ්‍යාත්මික සහ සංස්කෘතික ක්‍රියාකාරකම්වලට සහභාගි වීම සඳහා පහසුකම් සැපයීම, ප්‍රබල කම්පනයට විසඳුම් සොයා ගැනීමෙහි ලා වයස්ගතයන්ට උදව් වනු ඇති බව කොමිසමේ අදහස යි. මේ සම්බන්ධයෙන් ගත් කල, වයස්ගතයන්ට සහාය වීමේ දී ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කිරීමට, කොමිසම ප්‍රජා සහ සිවිල් සාමාජීය සංවිධාන, විශේෂයෙන් ම විශේෂඥතාව සහ සම්පත් සහිත සංවිධාන දිරි ගන්වා සිටී. දේශීය ආගමික ආයතන සහ පූජනීය ස්ථාන සහ පූජකයන් ද මේ සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළ යුතු යැයි කොමිසම ඉල්ලා සිටී. ආණ්ඩුව එවැනි පරිශ්‍රමයන්ට පහසුකම් සැපයිය යුතු ය.

### ආබාධිත පුද්ගලයෝ

9.98 ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශවල වෙසෙන, බොහෝ අවස්ථාවල දී තම පවුල්වල දිවි පෙවෙත සරි කරන්නන්ව සිටි ආබාධිත පුද්ගලයන්ට සහාය වීමේ හදිසි අවශ්‍යතාවක් පවතින බව කොමිසම හඳුනා ගනී. ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන්ට සහාය වීම සම්බන්ධයෙන් අත්දැකීමක් සහ විශේෂඥතාවක් සහිත ජාත්‍යන්තර සංවිධානවලින් සහ සිවිල් සාමාජීය සංවිධානවලින් මේ සඳහා සහාය ලබා ගත යුතු වේ. එමෙන් ම, බොහෝ අවස්ථාවල දී ආබාධිත තත්ත්වය පවුලේ නො නැසී පැවැත්ම කෙරෙහි බරපතළ ආර්ථික බලපෑමක් කරන නිසා, ප්‍රමුඛතාව දිය යුතු කාරණයක් ලෙස සලකා, ආණ්ඩුව ආබාධිත සාමාජිකයන් සහිත පවුල්වල ආර්ථික අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කිරීම ද කළ යුතු ය. ආබාධිතයාගේ සාමාජීය, සංස්කෘතික සහ ආධ්‍යාත්මික අවශ්‍යතාවන් කෙරෙහි ද බලාධිකාරවල විශේෂ සහ හදිසි අවධානය යොමු විය යුතු ය.

9.99 බලාධිකාරයන්, ප්‍රජා කණ්ඩායම් ලෙස සංවිධානය වී ගැනීමට ආබාධිත තත්ත්වයන් සහිත ජනයා දිරි ගැන්විය යුතු ය. අන්‍යෝන්‍ය සහාය සඳහා පහසුකම් සැපයීමටත්, මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂඥතාවක් සහ සම්පත් සහිත ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සාමාජීය කණ්ඩායම් හරහා අවශ්‍ය සහාය ලබා ගැනීමටත් එය උදව් වනු ඇත.

9.100 ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ජාතික නීති, ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව සම්පාදනය කර තිබිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. එවැනි ක්‍රියාවකින්, විශේෂයෙන් ම ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශවල වෙසෙන ආබාධිත පුද්ගලයන් විශාල සංඛ්‍යාවකට බලපාන කාරණා සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට හැකි වීම ද ඇතුළු ධනාත්මක බලපෑමක් සිදු වනු ඇත.

### අභ්‍යන්තරව අවතැන් වූවෝ

9.101 අභ්‍යන්තරව අවතැන් වූවන්ට අදාළ ගැටලු පිළිබඳව කොමිසම වෙත ප්‍රකාශ ගණනාවක් ලැබිණ. වාර්තාව ලියන සමය වන විට, ගැටුමේ අවසන් අදියරේ දී අවතැන් වුණු අභ්‍යන්තරව අවතැන් වූවන්ගෙන් බොහෝ දෙනා යළි පදිංචි කර ඇති බව කොමිසම සඳහන් කරන්නේ සතුටිනි. කෙසේ වුව ද, යළි පදිංචි කර ඇති සහ තම ජීවිත යළි ගොඩ නගා ගැනීමට පරිශ්‍රම දරමින් සිටින ජනයාට අඛණ්ඩ පැන නගින අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම තව මත් අත්‍යවශ්‍ය ය.

9.102 ගැටුමේ අවසන් අදියරේ දී අවතැන් වුණු අභ්‍යන්තරව අවතැන් වූවන් ආපසු යැවීමේ ක්‍රියාවලිය බොහෝ දුරට සම්පූර්ණ කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවට සහ අනෙක් පාර්ශ්වකරුවන්ට ප්‍රශංසාව හිමි විය යුතු ය. කෙසේ වුව ද, යළි පදිංචි කළ ජනයාට අඛණ්ඩව පැන නගින අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

9.103 බොහෝ ජනයා තව මත් ජීවත් වන්නේ තාවකාලික වාසස්ථානවල නිසා ස්ථිර නිවාස අලුත්වැඩියා කර ගැනීම හෝ ගොඩ නගා ගැනීම සඳහා ආපසු පැමිණියවුන්ට සහාය සැපයිය යුතු ය. මේ සම්බන්ධයෙන් ගත් කල, "ශ්‍රමදාන" වැනි ස්වයං උපකාරක සහ අන්‍යෝන්‍ය සහායක වැඩ සටහන්වලට දිරි දිය යුතු වේ. ජනයා

යළි පදිංචි කර ඇති ප්‍රදේශවල මාර්ග, පාසල් සහ රෝහල් වැනි යටිතල පහසුකම් අවශ්‍යතා සම්පාදනය කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු ය. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ සටහන් පිළිබඳව තෘප්තිමත් හැඟීමෙන් යුතුව සඳහන් කරන කොමිසම, රාජ්‍ය නොවන සංවිධාන සහ ආධාර දෙන ප්‍රජාව ඇතුළු අනෙක් පාර්ශ්වකරුවන් සමග සහයෝගීව මෙම ක්ෂේත්‍රයට අඛණ්ඩව ප්‍රමුඛතාව දීමට බලාධිකාරයන් උනන්දු කර සිටී. විශේෂයෙන් ම, නිවාස සැපයීම පිළිබඳ ක්ෂේත්‍රයේ දී සිවිල් සමාජය වැනි ස්වේච්ඡා කණ්ඩායම්වල සහාය සහ සහයෝගය ද දිරි ගැන්විය යුතු බව කොමිසමේ අදහස යි.

9.104 යළි පදිංචි කර ඇති අයට ඉඩමේ නීතිමය හිමිකම ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවක් පවතී.

9.105 තම ජීවිත ප්‍රතිනිර්මාණය කර ගැනීමට සහ ගොඩ නගා ගැනීමට සාමූහික පරිශ්‍රමයක් දරමින් සිටින ප්‍රජාවන්ට උදව් කිරීම සඳහා ප්‍රජා මූල මට්ටමේ ප්‍රජා සංවර්ධන කටයුතුවල යෙදී ගැනීමට සිවිල් සමාජය දිරි ගැන්විය යුතු ය.

9.106 ස්වේච්ඡාමය ආපසු පැමිණීමෙහි ලා බලපවත්වන ජාත්‍යන්තරව පිළිගත් මූලධර්මවලට අනුකූලව, තම මුල් පදිංචි ස්ථානවල යළි පදිංචි වීම සඳහා පුද්ගලයෙකුට තිබෙන යාමේ ඊමේ නිදහසට ගරු කිරීමේ අවශ්‍යතාවක් පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල, මහජනයාට යළි පදිංචි වීම සඳහා ලබා ගත හැකි ප්‍රදේශ සම්බන්ධ තම ප්‍රතිපත්තිය පිළිබඳව ආණ්ඩුවට පැහැදිලිකමක් තිබිය යුතු අතර, එවන් ප්‍රතිපත්ති සහ ඔවුන්ට පවතින විකල්ප පිළිබඳව මහජනයා අතර වැඩි දැනුවත්කමක් ඇති කළ යුතු ය. යළි පදිංචි වීම සඳහා මහජනයාට පවතින විකල්ප පිළිබඳව එලෙස සියුම් ලෙස අර්ථදක්වන ලද සහ මැනවින් සකස් කරන ලද ප්‍රතිපත්තියක් පැවතීම, යළි පදිංචි කිරීමේ වැඩ සටහන සම්බන්ධයෙන් පවතින ඇතැම් වැරදි වැටහීම් සහ සැකයන් මග හැරීමට උදව් වනු ඇත.

9.107 ආරක්ෂක අවශ්‍යතා ඇතුළු මහජන අවශ්‍යතාවලට එළඹිය යුත්තේ භීතියේ, තැති ගැනීමේ හෝ අවිශ්වාසයේ වාතාවරණයකට තුඩු නොදෙන ආකාරයකිනි. යළි පදිංචි කිරීමේ ප්‍රතිලාභ අව්‍යාජ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් උදෙසා ප්‍රයෝජනයට ගත හැකි වන්නේ ආරක්ෂාව සහ විශ්වාසය පිළිබඳ එවන් වාතාවරණයක් තුළ දී පමණකි.

9.108 ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට සහ ස්වේච්ඡාවෙන් යළි පදිංචි වීමට කැමැති ඉන්දියාවෙහි ජීවත් වන අවතැන් වූවන්ට ආණ්ඩුව පහසුකම් සැපයිය යුතු ය, ඔවුන් දිරි ගැන්විය යුතු ය. මේ සම්බන්ධයෙන් ගත් කල, ඔවුන් ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමට නම් අත්‍යවශ්‍ය පහසුකම් සපයා දීමට සිදු වනු ඇත. මෙම වාර්තාව ලියන සමය වන විට ඉන්දියාවේ සිට ආපසු පැමිණෙන්නන්ගේ ගැලීම අඛණ්ඩව සිදු වෙමින් තිබුණු බව කොමිසම සඳහන් කර සිටී. ඉන්දියාවේ සිට ආපසු පැමිණෙන්නන් සඳහා සහ තම ඉඩම් කරා ආපසු යන දේශීයව අභ්‍යන්තරව අවතැන් වූවන් සඳහා පවතින පහසුකම්වල දී වෙනස්කම් කිරීමකට ඉඩක් නැති බව සහතික කිරීම ද වැදගත් ය. ශ්‍රී ලංකාවට ආපසු පැමිණීම සම්බන්ධයෙන් හිතාමතා තීරණයක් ගැනීමට අවතැන් වූවන්ට හැකියාව ලබා දීම සඳහා, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර නිල ද්විපාර්ශ්වීය උපදේශන ක්‍රියාවලියක් සිදු විය යුතු යැයි ද නිර්දේශ කරනු ලැබේ.

**උතුරෙහි සහ නැගෙනහිරෙහි මුස්ලිම් ප්‍රජාව සම්බන්ධ උත්සුකතා**

.

9.109 එල්ටීටීඊ තර්ජන නිසා 1990 ඔක්තෝබර් තරම් ඈත දී දිස්ත්‍රික්ක පහකින් (යාපනය, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් සහ වව්නියාව) අවතැන් වුණු මුස්ලිම් අභ්‍යන්තරව අවතැන් වූවන් පිළිබඳ ගැටලුව පශ්චාත් යුද අභියෝගයන්ගෙන් එකක් ලෙස පවතින අතර, එය ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි ද සැලකිය යුතු බලපෑමක් කරයි. දශක දෙකකටත් වැඩි කාලයක් තිස්සේ ඛේදනීය තත්ත්වයන් යටතේ ජීවත් වන මෙම අභ්‍යන්තරව අවතැන් වූවන් මුහුණ පා සිටින අවාසනාවන්ත තත්ත්වය පිළිබඳව කොමිසම හමුවේ ප්‍රකාශ විශාල සංඛ්‍යාවක් කරනු ලැබිණ.

.

9.110 උතුරෙන් පලවා හැරුණු මුස්ලිම්වරුන් සම්බන්ධ අභ්‍යන්තරව අවතැන් වීම පිළිබඳ මෙම දිගු කාලීන ගැටලුව විසඳීම සඳහා කල් පවත්නා විසඳුම් සොයා ගත යුතු බව කොමිසමේ අදහස යි. මෙම ගැටලු නො විසඳුව හොත්, ඒවා විසංවාදයට සහ මතභේදයට හේතු වනු ඇත.

9.111 ශ්‍රී ලංකාව තුළ දිග් ගැසුණු ගැටුමෙන් පැන නැගි අභ්‍යන්තරව අවතැන් වූවන් පිළිබඳ දිගු කාලීන ගැටලුවලින් එකක් ලෙස සලකා මුස්ලිම් ප්‍රජාවේ අවාසනාවන්ත තත්ත්වයට පිළියම් යෙදීම සඳහා විසඳුම් සොයා ගත යුතු ය. මෙම අභ්‍යන්තරව අවතැන් වූවන් යළි පදිංචි කිරීම සහ/හෝ ඔවුන් සත්කාරක ප්‍රජාවට

ඒකාබද්ධ කිරීම අරමුණු කර ගත් සමරූපී රාජ්‍ය ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම හරහා මෙය මුදුන් පමුණුවා ගත හැකි ය. තමන් වාසය කළ මුල් ස්ථානවල හෝ සත්කාරක ප්‍රජාවන් තුළ තමන්ට පවත්නා යළි පදිංචි වීමේ විකල්ප සම්බන්ධයෙන් හිතාමතා තීරණයක් ගත හැකි වන පරිදි මෙම ප්‍රතිපත්තිය අභ්‍යන්තරව අවතැන් වූවන් වෙත සන්නිවේදනය කළ යුතු ය.

9.112 එවැනි රාජ්‍ය ප්‍රතිපත්තියකට, මූල්‍යමය සහාය සහ නිවාස ඉදි කිරීම සඳහා සහාය වැනි වෙනත් ද්‍රව්‍යමය සහායන් ඇතුළු සහායක පැකේජයක් ද ඇතුළත් කළ යුතු ය.

9.113 අභ්‍යන්තරව අවතැන් වූවන්ගෙන් සහ සත්කාරක ප්‍රජාවන්ගෙන් පුළුල්ව අදහස් ලබා ගැනීමෙන් පසුව, කල් පවත්නා විසඳුම් පිරික්සා බැලීම සඳහා සහ ගැටලුව පිළිබඳව පුළුල් රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කළ යුතු ය.

**අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු සඳහා පවතින අයිතිය**

9.114 පුවත්පත් කලාවේදීන්ට සහ මාධ්‍ය ආයතනවලට ප්‍රහාර එල්ල කිරීම සහ පුවත්පත් කලාවේදීන් ඝාතනය කිරීම සම්බන්ධ වාර්තා අඛණ්ඩව ලැබීමෙන් සහ මෙම සිදුවීම් පිළිබඳව නිශ්චිතව පරීක්ෂණ පවත්වා වැරදිකරුවන් නීතිය හමුවට පමුණුවා නැත යන කරුණෙන් කොමිසම අතිශයින් කැලඹීමට පත් විය. කොමිසමේ සභා වාරයන් තව මත් පැවැත්වෙමින් තිබිය දී, යාපනයෙහි *උදයන්* පුවත්පතේ කර්තෘවරයාට එල්ල වුණු නින්දිත ප්‍රහාරයෙන් ද කොමිසම කනස්සල්ලට පත් විය. එවැනි ක්‍රියා කවර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියකට වුව නිශ්චිතව බාධාවන් පිහිටුවයි. පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමෙහි ලා සිදු වන ඕනෑ ම අසමත් වීමකින් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට සහ නීතියේ රජැයීමට වළ කැපෙනු ඇත.

9.115 මූලික මානව අයිතිවාසිකම් ලෙස විශ්වීයව සැලකෙන අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු සඳහා පවතින අයිතිය කවර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක දී වුව ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. එම නිසා, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට සහ අදාළ මූලික අයිතිවාසිකම් බැඳීම්වලට අනුකූලව මාධ්‍ය නිදහස වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය ය. මන්ද, මාධ්‍ය නිදහස මත පැනවෙන ඕනෑ ම සීමාවකින් සිදු වන්නේ ජනවාර්ගික කණ්ඩායම් අතර අවිශ්වාසයේ සහ භීතියේ වාතාවරණයකට දායක වීම පමණක් බැවිනි. මෙය දැනට සිදු වෙමින් පවතින ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට දරුණු සීමාවන් පනවමින් ඵලදායී තොරතුරු සහ අදහස් හුවමාරුව වළක්වනවා පමණකි. කොමිසම පහත සඳහන් පියවරයන් දැඩි ලෙස නිර්දේශ කර සිටී:

අ) මාධ්‍ය කාර්ය මාණ්ඩලිකයන්ට සහ ආයතනවලට අඩන්තේට්ටම් කිරීම සහ ප්‍රහාර එල්ල කිරීම වැළැක්වීම සඳහා සියලු පියවරයන් ගත යුතු ය.

ආ) එවැනි අපරාධ සම්බන්ධයෙන් නිවාරක දඬුවම් පැනවීමට පියවර ගත යුතු අතර, අපරාධ යුක්ති පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ගොඩ නැගීම සඳහා, එවැනි සිදුවීම් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට, චෝදනා ඉදිරිපත් කිරීමට සහ තීන්දු දීමට ද ප්‍රමුඛතාව දිය යුතු ය.

ඇ) එවැනි ක්‍රියාවන් පිළිබඳ අතීත සිදුවීම් නිසි ලෙස පරීක්ෂාවට ලක් කළ යුතු ය. මෑත අතීතයේ දී පුවත්පත් කලාවේදීන් සහ මාධ්‍ය ආයතන ගණනාවකට ප්‍රහාර එල්ල කර ඇති බව කොමිසම උත්සුකතාවෙන් යුතුව නිරීක්ෂණය කර සිටී. එවැනි අපරාධ අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බාදනය කර දමයි. එම නිසා, පමාවකින් තොරව වැරදිකරුවන්ගෙන් නිදහසට කරුණු විමසිය හැකි වන පරිදි කඩිනමින් පරීක්ෂණ හමාර කිරීමට පියවර ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

ඈ) ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට දායක වන තොරතුරු හුවමාරු කර ගැනීමෙහි ලා උදව් වන බැවින් ආණ්ඩුව උතුර සහ නැගෙනහිර තුළ මාධ්‍ය කාර්ය මාණ්ඩලිකයන්ගේ යාමේ ඊමේ නිදහස සහතික කළ යුතු ය.

e
ඉ) තොරතුරු සඳහා පවතින අයිතිය සහතික කිරීම සඳහා නීති පැනවිය යුතු ය.

**තමන් කැමැති ආගමක් ඇදහීමේ, සමාගමයේ සහ යාමේ ඊමේ නිදහස**

9.116 කවර විශ්වසනීය සහ තිරසර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් සඳහා වුව නිදහසේ තම ආගම ඇදහීම සඳහා මහජනයාට ඇති අයිතියට සහ සමාගමයේ සහ යාමේ ඊමේ නිදහස වැනි අනෙක් නිදහසවලට ගරු කරන, ඒවා ප්‍රවර්ධනය කරන සහ ආරක්ෂා කරන වාතාවරණයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. අව්‍යාජ සහ සියලු දෙනා සහභාගි කර ගත් ක්‍රියාවලියක් ලෙස දැන් ක්‍රියාත්මක වෙමින් තිබෙන ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මහජනයා තබා තිබෙන උසස් බලාපොරොත්තු සහ විශ්වාසය වැඩි දියුණු කරන නිසා, මහජනයා ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශවල ජීවත් වන අවස්ථාවල දී මෙම නිදහසවල් විශේෂයෙන් ම වැදගත් වේ. එම නිසා, කිසිදු රාජ්‍ය ආයතනයකින්, විශේෂයෙන් ම ආරක්ෂක හමුදාවලින් සහ පොලීසියෙන් එවැනි අයිතිවාසිකම් අත්තනෝමතික ලෙස සීමා කිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් නොකෙරෙන බව ආණ්ඩුව සහතික කළ යුතු ය. මෙම අයිතිවාසිකම් පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගැනීමට සහ භුක්ති විඳීමට මහජනයාට සහාය වීමේ දී, එවැනි ආයතන වෙනස ඇති කරන නියෝජිතයන් ලෙස කටයුතු කරමින් තිරසර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් සහතික කළ යුතු යැයි කොමිසම දැඩි ලෙස හඟී. ආගමික ක්‍රියාකාරකම්වලට කිසිදු බාධාවක් නො කර ආගමික උත්සවවලට පැමිණීමට පහසුකම් සැපයීමෙන් ගොදුරු වූවන් අතර පවතින අවිනිශ්චිතතාව පිළිබඳ හැඟීම අවසන් කිරීමේ අවශ්‍යතාව කොමිසම අවධාරණය කර සිටී.

9.117 බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කරන සීමාවන් හැර පූජනීය ස්ථාන වෙත චාරිකා කිරීම සම්බන්ධයෙන් කවර හෝ සීමාවක් ඉතිරිව තිබෙන්නේ නම් ඒවා ඉවත් කිරීමට ආණ්ඩුව ක්ෂණික පියවර ගත යුතු ය. අධිආරක්ෂිත කලාප තුළ පිහිටි ආගමික පූජනීය ස්ථාන වෙත පිවිසුම ද මීට ඇතුළත් කළ යුතු ය. ආරක්ෂක විධිවිධාන අවශ්‍ය තැන්වල දී පොලීසියේ සහාය සැපයිය හැකි ය.

9.118 සීමා පැනවීමකින් තොරව සාමකාමී උත්සව සහ රැස්වීම් සංවිධානය කිරීමට මහජනයාට, ප්‍රජා නායකයන්ට සහ ආගමික නායකයන්ට නිදහස තිබිය යුතු ය.

9.119 කිසිදු අනිසි සීමා පැනවීමකින් තොරව, මෑතක දී යළි පදිංචි කෙරුණු ප්‍රදේශවල ජීවත් වන තම මිතුරන් සහ ඥාතීන් වෙත චාරිකා කිරීමට විදේශවලින් පැමිණෙන සංචාරකයන්ට ඉඩ දිය යුතු ය.

**අතීත පරීක්ෂණ කොමිසම්වල වාර්තා පිළිබඳ පසු විපරම් ක්‍රියාව**

9.120 "2005 අගෝස්තු මාසයේ සිට පැන නගින බරපතළ මානව හිමිකම් උල්ලංඝන පිළිබඳව කෙරෙන චෝදනා පරීක්ෂා කිරීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා පත් කෙරුණු ජනාධිපති පරීක්ෂණ කොමිසම් වාර්තාවේ" නිර්දේශ, විශේෂයෙන් ම 2006 ජනවාරි මාසයේ දී ත්‍රිකුණාමලයේ දී සිදු වුණු සිසුන් 5 දෙනෙකුගේ සහ මරණය සහ 2006 අගෝස්තු මාසයේ දී ඇක්ෂන් කොන්ත්‍රෙ ලා ෆෙයිම් සංවිධානයේ සේවකයන් 17 දෙනෙකුගේ මරණය පිළිබඳ සිදුවීම්වලට සම්බන්ධ වැරදිකරුවන් පිළිබඳව තව දුර පරීක්ෂණ පැවැත්වීමට සහ ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. එවැනි පියවරක් නීතියේ රජයීමට ගරු කරන බව සහතික කරන බලගතු සංඥාවක් යවනු ඇති අතර, එය සමාදාන ක්‍රියාවලියට දායක වනු ඇත.

***හය වන පරිච්ඡේදය: ඉඩම් ගැටලු පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ: ආපසු යාම සහ යළි පදිංචි කිරීම***

9.121 දිගු ගැසුණු ගැටුමකින් පසුව වහා ම රටක් තුළ ගැටුමට පෙර පැවති තත්ත්වය යළි ඇති කිරීම පහසු කටයුත්තක් නොවුණ ද, නීති විරෝධී ඉඩම් පැවරීම් සහ ප්‍රචණ්ඩත්වයෙන් මුල පිරෙන අන්සතු කිරීමත්, බිය ගැන්වීම සහ ජනවාර්ගික ශුද්ධයත් චිරස්ථායී කිරීමට හෝ ආයතනගත කිරීමට ඉඩ නොදෙන බව සහතික කිරීම වැදගත් බව කොමිසම හඳුනා ගනී. නො විසඳී තිබෙන්නට හැරිය හොත් අනාගත ගැටුම්වලට මුල පුරන කරුණු බවට පරිවර්තනය වන නිසා, ජනවාර්ගික සුසංවාදය සහ ජාතික ප්‍රතිසන්ධානය පෝෂණය කිරීම සඳහා මෙය තීරණාත්මක ය.

9.122 විවිධ සමාජ-දේශපාලනික-සංස්කෘතික තත්ත්වයන් තුළ අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ ආපසු යාම සහ යළි පදිංචි කිරීම පිළිබඳව සාරා පන්තුලියානෝ කළ පර්යේෂණය, ශ්‍රී ලංකාවෙහි සිදු වන ආපසු යාමේ සහ යළි පදිංචි කිරීමේ වැඩ සටහන් සමාලෝචනය කරන්නන්ට ඥානය සම්පාදනය කරන්නක් විය හැකි ය ...... " මහජනතාවන් ඉඩම්වලට හිමිකම් කීමට සහ ඉඩම් ආපසු ලබා ගැනීමට උත්සාහ කරන නිසා, පශ්චාත් ගැටුම් කාල පරිච්ඡේදවල දී ඉඩම් ගැටලු බොහෝ විට කැපී පෙනෙන්නට පටන් ගනී ................. 'පශ්චාත් යුද' යැයි කියනු ලබන වාතාවරණයක දී පවා, සරණාගතයන් ආපසු සිය රට බලා පැමිණීම සරල ක්‍රියාවලියක් නො වේ ....... මෙය සංකීර්ණ ගැටලුවක් වන අතර, සෑම තත්ත්වයක් ම විවිධ ය, ගැටුම යනු ඉහළින් ම පරිණාමනීය ක්‍රියාවලියකි, අභිමත වුවත් කිසි විටෙක යුද්ධයට පෙර පැවති තත්ත්වය සම්පූර්ණයෙන් ම තහවුරු කළ නොහැකි ය" - Sara Pantuliano, Unchartered Territory, Land Conflict and Humanitarian Action (වර නොලත් භූමි ප්‍රදේශ, ඉඩම් ගැටුම් සහ මානුෂීය ක්‍රියාව) විදේශීය මානුෂීය ක්‍රියා සංවර්ධන ආයතනය, 2009 නොවැම්බර්.

9.123 ඉහත තර්කනය ශ්‍රී ලංකාව තුළ පශ්චාත් ගැටුම් තත්ත්වයට ද සමාන ප්‍රබලතාවකින් යුතුව අදාළ වන අතර, කොමිසමේ නිර්දේශ මෙම යථාර්ථය සැලකිල්ලට ගනී.

9.124 ශ්‍රී ලංකාවේ ඕනෑ ම පුරවැසියෙකුට, රටේ නීතිවලට සහ රෙගුලාසිවලට අනුකූලව රටේ ඕනෑ ම කොටසක ඉඩම් අත්පත් කර ගැනීමට, සහ කවර හෝ ආකාරයකින් පැනවෙන කවර හෝ සීමා කිරීමකින් හෝ පාලනය කිරීමකින් තොරව ඔහු/ඇය තෝරා ගන්නා ඕනෑ ම ප්‍රදේශයක පදිංචි වීමට අහිමි කළ නොහැකි අයිතිය ඇත. ආණ්ඩුවල ඉඩම් ප්‍රතිපත්තිය කිසි යම් පළාතක ජන විකාශ රටාවෙහි අස්වාභාවික වෙනස්කම් ඇති කිරීම සඳහා වන මෙවලමක් නො විය යුතු ය. අන්තර් පළාත් වාරිමාර්ග හෝ ඉඩම් නිරවුල් කිරීමේ යෝජනා ක්‍රමවල දී රාජ්‍ය ඉඩම් බෙදා හැරීම කර ගෙන යා යුත්තේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති පරිදි ය.

9.125 අවතැන් වුණු පුද්ගලයන් ආපසු යාම සහ යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කරන ඉඩම් ප්‍රතිපත්තිය කොමිසම අගය කරයි. එමෙන් ම, ඊට සම්බන්ධිතව 2011 ජූලි මාසයේ දී යෝජනා කෙරුණු, ඉඩම් ප්‍රලේඛනය සහ හිමිකම සම්බන්ධ ආරාවුල් සහ අවතැන් වූවන්ගේ පරිශීලක අයිතිවාසිකම් පිළිබඳ ගැටලු විසඳීමට සැලසුම් කළ, 'උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් නියාමනය කිරීම' නම් වැඩ සටහන ද කොමිසමේ අගය කිරීමට ලක් වේ. වැඩ සටහන නව්‍ය විධික්‍රම හඳුන්වා දෙන බවත්, නිලධාරිවාදී බවින් අඩු සහ ප්‍රධාන වශයෙන් නොවිධිමත් සහ - නඩු කියන්නන්ට සංකීර්ණ, කාලය ගත වන සහ මිල අධික - විධිමත් උසාවි පද්ධතිය යොදා ගැනීමට සිදු වීමෙන් අවතැන් වූවන්ගෙන් අතිවිශාල බහුතරය නිදහස් කිරීම සඳහා සැලසුම් කළ යන්ත්‍රණයන් සුදුසු අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීමට උත්සාහ කරන බවත් කොමිසම සඳහන් කර සිටී.

9.126 කෙසේ වුව ද, ප්‍රශ්නයට ලක්ව තිබෙන ඉඩම/ඉඩම් සම්බන්ධ තම උරුමකම පිළිබඳ වලංගු නීතිමය ඔප්පුකරයක් ජනයාට හිමි අවස්ථාවල දී, මෙම වැඩ සටහන සහ ඊට සම්බන්ධිත යන්ත්‍රණයන් අධිකරණ පිහිටට ආදේශකයක් නොවන බවත්, එය උත්සාහ කරන්නේ ආපසු පැමිණෙන සියලු අභ්‍යන්තරව අවතැන් වූවන්ට, විශේෂයෙන් ම ගැටුමට සම්බන්ධිත හේතු නිසා ලේඛනගත ඔප්පුකරයක් නොමැති අයට හැකි තරම් කඩිනමින් ඉඩම් ලබා දීම බවත්, තිසි ප්‍රචාරණ පරිශ්‍රමයක් හරහා මහජනතාවට මුළුමනින් ම පැහැදිලි කළ යුතු යැයි ද සහතික කළ යුතු යැයි ද අදාළ බලාධිකාරයන්ට දැඩි ලෙස නිර්දේශ කිරීමට කොමිසම කැමැති ය. මෙම වැඩ සටහනේ අරමුණු පිළිබඳව තොරතුරු හිඟකම ගැන ජනයා තුළ පැවතිය හැකි උත්සුකතාවන් සමහන් කිරීම සඳහා මෙය අවශ්‍ය වේ.

9.127 ක්‍රියාත්මක කිරීමේ ඵලදායකත්වය සහ ප්‍රතිඵල සහතික කිරීම සඳහා කොමිසම පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.

9.128 වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී, සැලසුම් කළ පරිදි සම්පූර්ණ කෙරෙන බව සහ මතු වන කවර ගැටලුවක් සහ බාධාවක් වුව ඵලදායීව සහ අප්‍රමාදීව විසඳා ගන්නා බව සහතික කිරීම සඳහා වන බලගතු දේශපාලන අධිෂ්ඨානයක් සමග බැඳුණු දේශපාලනයෙන් තොර පිවිසුමක් යොදා ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. වැඩ සටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මානව සහ මූල්‍ය සම්පත් ආණ්ඩුව සම්පාදනය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.129 ක්‍රියාත්මක කිරීමේ දී අපක්ෂපාතිත්වය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා නිලධරයේ ඉහළ ම මට්ටම්වලින් ආරම්භ වී සිවිල් පරිපාලනය පැත්තෙන් බලගතු පරිපාලනමය අධිෂ්ඨානයක් පැවතීම ද තීරණාත්මක වනු ඇත. අපක්ෂපාතිත්වය සහ විනිවිද භාවය සහතික කිරීම සඳහා, වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යය පැවරෙන සිවිල් පරිපාලන නිලධාරීන් ක්‍රියාත්මකව අධීක්ෂණය කිරීම අදාළ දිසාපතිවරුන් විසින් ද, ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම ජාතික මට්ටමේ දී ඉඩම් පිළිබඳ මහ කොමසාරිස්වරයා විසින් ද කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.130 වැඩ සටහනේ සාර්ථකත්වය සැලකිය යුතු ලෙස රඳා පවතිනු ඇත්තේ, දේශපාලන නායකයන්, ක්‍රියාත්මක කරන්නන්, මේ අවස්ථාවේ දී නම් විවිධ ක්‍රියාත්මීකරණ කමිටුවල සාමාජිකයන් වන රජයේ නිලධාරීන් සහ ප්‍රජා නායකයන් සහ ප්‍රතිලාභීන්, එනම් ආපසු පැමිණි/යළි පදිංචි කෙරුණු අවතැන් වූවන්ගේ කුටුම්බවල ගෘහ මූලිකයන් වැඩ සටහනේ මූලධර්ම, අරමුණ, පරමාර්ථ සහ ක්‍රමවේදය පැහැදිලිව සහ නිසැකව අවබෝධ කර ගැනීම මත යැයි කොමිසම විශ්වාස කරයි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිසම කැමැති ය. (i) බොහෝ දුරට යහපත් අභිප්‍රායෙන් කළ නමුත්, යෝජිත නව වැඩ සටහන පිළිබඳව මේ දක්වා පතළව තිබෙන ප්‍රසිද්ධ තොරතුරු යෝජිත වැඩ සටහනේ අරමුණ සහ ක්‍රමවේදය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලිකමක් ඇති කර නැත. මෙම තත්ත්වය ඇති වීමට පහත

දැක්වෙන සාධක දායක වී තිබිය හැකි යි - (අ) මාධ්‍යය මෙන් ම විවිධ දේශපාලනික පුද්ගලයන් නව වැඩ සටහන පිළිබඳව පර්යේෂණයට ලක් නොකළ හෝ අප්‍රමාණවත් ලෙස පර්යේෂණය කළ තොරතුරු පතළ කිරීම; (ආ) යෝජිත නව වැඩ සටහනේ අන්තර්ගතය සහ විධික්‍රම, ඉඩම් අමාත්‍යාංශය යටතේ වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් තිබෙන ඉඩම් හිමිකම් අයිතිය සහ පරිශීලක අයිතිය තහවුරු කිරීමේ වෙනත් ඇතැම් වැඩ සටහන් සමග නොසැලකිල්ලෙන් කලවම් කිරීම. ඉඩම් පිළිබඳ මහ කොමසාරිස්වරයා, යෝජිත නව වැඩ සටහන පිළිබඳ මෑත ප්‍රචාරක දැන්වීම මුද්‍රිත මාධ්‍යය තුළ භාෂා තුනෙන් ම බහා තිබීමෙන් යම් පැහැදිලිකමක් සම්පාදනය කෙරුණත්, මිශ්‍ර පණිවුඩ ඉවත් කිරීම නුසුදුසු විය හැකි අතර, මාධ්‍යය, වෙබ් පිටු සහ දේශපාලනික මත ප්‍රකාශ හරහා ඇතැම් විට ලැබෙන්නේ ව්‍යාකූල තොරතුරු ය.

9.131 නව වැඩ සටහන පිළිබඳව දේශපාලනික ආකල්පවලින් තොර නිවැරදි සහ පැහැදිලි අදහසක් ප්‍රක්ෂේපණය කිරීමට මාධ්‍යයට හැකියාව ලබා දීම සඳහා, යෝජිත නව වැඩ සටහන පිළිබඳව මනා ලෙස සැලසුම් කළ මාධ්‍ය සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට හැකි යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.132 ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ අදාළ දිසාපතිවරුන්, විවිධ කමිටු සඳහා තෝරා ගැනෙන සියලු නිලධාරීන් සහ ප්‍රජා නායකයන් උදෙසා මැනවින් සැලසුම් කළ පුහුණු වැඩ සටහන් පැවැත්විය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. පුහුණුව සර්වසම බවත්, සියලු කොට්ඨාස සහ දිස්ත්‍රික්ක තුළ පැවැත්වෙන පුහුණු ක්‍රියාකාරකම්වල දී බෙදා හැරෙන්නේ සමාන පණිවුඩ බවත් සහතික කරනු පිණිස, පුහුණුව කෙටි සහ සරල නමුත් ලිඛිත අත්පොතක් මත පදනම් විය යුතු ය. ගැටලු විසඳීම නිරූපණය කිරීම සඳහා යොදා ගැනෙන භූමිකා නිරූපණ හෝ ඒ හා සමාන පුහුණු විධික්‍රම සහිතව, ක්ෂේත්‍රයෙහි පවතිතැයි අපේක්ෂිත ගැටලුවලට අදාළව විය හැකි විවිධ තත්ත්වයන් පිළිබඳව කෙටි සිද්ධි අධ්‍යයන වර්ධනය කළ හැකි ය. මෙය ක්ෂේත්‍රය තුළ පවතින සැබෑ ගැටලුවලට උර දීමට සිදු වන නිලධාරීන්ගේ සහ ප්‍රජා නායකයන්ගේ නිපුණතා සහ ආත්ම විශ්වාසය වැඩි දියුණු කරනු ඇත. ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට සහ දිසාපතිවරුන්ට හවුල් වීම සඳහා, විවිධ විෂයයන්හි රජයේ නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධයෙන් විශේෂඥතාවක් සහ අත්දැකීමක් තිබෙන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වැනි, විශේෂ පුහුණු ආයතනයක් පිහිටුවිය හැකි ය. මේවා අතිරේක වියදමක් මෙන් ම කාලයක් ද වැය කරනු ඇති නමුත්, නිශ්චිතව ම වැඩ සටහනේ ඵලදායකත්වයත් ඵලයත් වැඩි දියුණු කරනු ඇත.

9.133 වැඩ සටහනෙන් සැපයෙන විවිධ සේවාවන් සම්බන්ධයෙන් අවතැන් වූවන් ගත යුත්තේ කවර විශේෂිත පියවරක් ද යන්න පිළිබඳව තොරතුරු ඇතුළත් කොට, මැනවින් සැලසුම් කළ, පදිංචිකරුවන් කේන්ද්‍ර කර ගත්, ප්‍රධාන වශයෙන් සරල දෙමළ භාෂාවෙන් මෙන් ම සිංහල භාෂාවෙන්, සන්නිවේදන ව්‍යාපාරයක් දියත් කළ යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. සන්නිවේදන ව්‍යාපාරයේ සැලසුම සේවාලාභීන්ගේ දැනුම් මට්ටම සහ බුද්ධි මට්ටම මෙන් ම ඔවුන් සතුව පවත්නා සන්නිවේදන ජාල ද සැලකිල්ලට ගත යුතු ය; 'කරන්නේ කොහොම ද' සහ 'කරන්නේ කුමක් ද' යන තොරතුරු පැහැදිලි සහ සරල භාෂාවෙන් ඇතුළත් කළ යුතු ය. විශ්වාසයෙන් යුතුව වැඩ සටහනෙන් ප්‍රතිලාභ ලැබීම සඳහා පෙරට ඒමට, අවතැන් වූවන්ට මෙය උදව් වනු ඇත.

9.134 ඉඩම් ප්‍රලේඛනය සහ පරිශීලක අයිතිය පිළිබඳ ගැටලු සමාලෝචනය කිරීම සඳහා පිහිටුවීමට යෝජිත කමිටු දෙකට ආරක්ෂක හමුදා නිලධාරියෙකු වන ප්‍රාදේශීය සිවිල් සම්බන්ධීකරණ නිලධාරියෙකු නම් කළ යුතු යැයි වැඩ සටහන අපේක්ෂා කරයි. ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් කමිටු දෙකේ සභාපතිත්වය දරනු ඇතැයි ද, සාමාජිකයන්ගෙන් බහුතරය උකහා ගනු ලබන්නේ සිවිල් පරිපාලනයෙන් යැයි ද කොමිසම සඳහන් කර සිටී. ආරක්ෂක හමුදා හැකි තරම් ඉක්මනින් සිවිල් පරිපාලනය හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම්වලින් ඉවත් විය යුතු යැයි, කොමිසම ප්‍රතිපත්තියක් ලෙස ආණ්ඩුවට දැඩිව උපදෙස් දෙයි, නිර්දේශ කරයි. යෝජිත ඉඩම් හිමිකම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාවලියෙහි ලා ආරක්ෂක හමුදා නිලධාරීන් සහභාගි වීම සම්බන්ධයෙන් ගත් කල, ඇතැම් ඉඩම් වර්තමානයේ දී ආරක්ෂක අරමුණු උදෙසා ප්‍රයෝජනයට ගැනෙමින් තිබීමෙන් රෙකමදාරු කෙරෙන්නේ, ආරක්ෂක තැකීම් සැලකිල්ලට ගන්නා නමුත් තමන්ට පහසු ප්‍රදේශවල පදිංචි වීමට මහජනයාට ඉඩ සැලසීමේ ප්‍රතිපත්තිමය අරමුණේ ප්‍රථමතාව සලකමින්, එම සහභාගිත්වය එවන් ඉඩම් උපරිම ප්‍රමාණයක් මුදා හැරීමට සීමා විය යුතු බව සහ මුදා හැරීම ඉක්මන් කිරීම සඳහා ප්‍රශස්ත ලෙස යොදා ගත යුතු බව ය යන කරුණ පිළිබඳව කොමිසම දැනුවත් වෙමින් සිටී.

9.135 නව වැඩ සටහන, පළමු (පරීක්ෂණ) කොමිසමට සහ දෙවන (පරීක්ෂණ) කොමිසමට සම්බන්ධ නිරීක්ෂණ කමිටු හරහා ප්‍රජා උපදෙස් ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් හඳුන්වා දී ඇති බව කොමිසම සඳහන් කර සිටී. ප්‍රජා සාමාජිකයන්ගෙන් සමන්විත නිරීක්ෂණ කමිටු පරීක්ෂණවල තීන්දු ක්‍රියාවලිය නිරීක්ෂණය කළ යුතු යැයි ද, අවශ්‍ය පරිදි, කමිටු දෙක වෙත ප්‍රදේශයට විශේෂිත තොරතුරු සම්පාදනය කළ යුතු යැයි ද අපේක්ෂා කෙරේ. ප්‍රජා උපදෙස් ලබා ගැනීමේ යම් වැඩ පිළිවෙළක් සඳහා සපයා ඇති අවස්ථාව අගය කරන කොමිසම, ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රදේශවල පළමු කමිටු, පළමු කමිටු පරීක්ෂණ ක්‍රියාවලිය දියත්

කිරීමට කලින්, මැනවින් ප්‍රසිද්ධ කළ 'ප්‍රජා උපදෙස් විමසුම් රැස්වීමක්' සංවිධානය කර පැවැත්විය යුතු යැයි නිර්දේශ කර සිටී. මෙය, තමන්ට තිබෙන ගැටලු සහ බාධාවන් ප්‍රකාශයට පත් කිරීමට මෙන් ම පරීක්ෂණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රයෝජනවත් සහ ඵලදායක යෝජනා ඉදිරිපත් කිරීමට, අදාළ ප්‍රදේශවල සිටින ආපසු පැමිණි/යළි පදිංචි කෙරුණු ප්‍රජාවන්ට අවස්ථාවක් සපයනු ඇත. එමෙන් ම, ඉඩම් ගැටලු සම්බන්ධ පරීක්ෂණ පැවැත්වෙන ආකාරයත්, තම ගැටලුවලට සෑහෙන තරම් කඩිනමින් විසඳුමක් ලබා ගැනීමට පහසුකම් සැපයීමක් වශයෙන් ඒ ඒ අනාගත අයැදුම්කරු කොට්ඨාසය තෝරා ගත යුත්තේ කවර විශේෂිත ක්‍රියාවන් සහ ක්‍රියා පටිපාටීන් ද යන්නත් ප්‍රජාවට පැහැදිලි කිරීම සඳහා පළමු කම්ටුවට මෙම සංවාද මණ්ඩපය යොදා ගත හැකි ය. මෙය, තමන්ටත් ඇහුම්කන් දෙනු ලබන්නේ ය යන විශ්වාසී හැඟීමක් මහජනයා තුළ ඇති කරනු ඇත. පළමු කම්ටුව, තමන්ට අදාළ ප්‍රදේශවල දී බලාපොරොත්තු විය යුත්තේ කවර මාදිලියේ ගැටලු ද යන්න පිළිබඳව පෙරහුරුවක් ද ලබා ගනු ඇත. එවැනි ප්‍රජා උපදෙස් විමසුම් රැස්වීම් සැලසුම් කිරීම සහ පැවැත්වීමේ දී සාම්ප්‍රදායික ඉඩම් කච්චේරි ක්‍රමයේ අත්දැකීම් පදනම් කර ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.136 ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා, 'ප්‍රජා උපදෙස් විමසුම් රැස්වීම්' හරහා ඉදිරිපත් කෙරෙන ඵලදායක යෝජනා ඉක්මනින් සලකා බැලීම සඳහාත්, වැඩ සටහනේ ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රමවේදය තව දුර වැඩි දියුණු කිරීමට මෙම යෝජනා යොදා ගැනීම සුදුසු දැයි සලකා බැලීම සඳහාත් යන්ත්‍රණයක් පිහිටුවිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී.

9.137 තාවකාලික අනුයුක්ත කිරීම් සහ/හෝ සුදුසුකම් සහ නිපුණතා සහිත විශ්‍රාමික කාර්ය මණ්ඩල කොන්ත්‍රාත් පදනම යටතේ සම්බන්ධ කර ගැනීම හරහා ද, වැඩ සටහන ඵලදායීව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ගිවිස ගත් කාල පරිච්ඡේදයකට අලුතින් බඳවා ගැනීම සහ/හෝ අනුයුක්ත කිරීම මාර්ගයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අතිරේක පරිපාලන සේවා කාර්ය මණ්ඩල පත් කිරීම හරහා ද, ක්‍රියාත්මක කිරීමේ සෑම මට්ටමක දී ම මානව සම්පත් කණ්ඩායම් ශක්තිමත් කිරීමට විධිවිධාන යෙදිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.138 ඉහත සඳහන් කරන ලද ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක මූල්‍ය වෙන් කිරීම් සහ පෙරටු කාලයක් අවශ්‍ය බව කොමිසම වටහා ගනී. එහෙත්, යෝජිත අතිරේක ක්‍රියාකාරකම් වැඩ සටහන ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කරනු ඇති බව සහ ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ වැඩි කරනු ඇති බව කොමිසමේ අදහස යි.

9.139 නව වැඩ සටහන උතුරෙහි සහ නැගෙනහිරෙහි සැබවින් ම ඉඩම් නොමැති පවුල්වලට ඉඩම් ප්‍රදානය කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන බව ද කොමිසම සඳහන් කර සිටී. එල්ටීටීඊයේ ආඥාවෙන් හෝ ආඥාවෙන් තොරව ද්විතීයික පදිංචිකරුවන්ව සිටින සියලු පවුල්වලට, පරීක්ෂණ කොමිසමේ තීන්දුවල ප්‍රතිඵලයක් ලෙස ඔවුන් වර්තමානයේ පදිංචි වී සිටින ඉඩම් සැබෑ මුල් අවසරපත් දරන්නන් වෙත ප්‍රදානය කෙරෙන්නේ නම්, ඉඩම් හිමි විය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. කෙසේ වුව ද, කිසිදු සදාචාරාත්මක තැකීමකින් තොර ඇතැම් පුද්ගලයන් සංක්‍රාන්ති සමයේ දී තවත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ද්විතීයික පදිංචිය යොදා ගත හැකි නිසා ද්විතීයික පදිංචිකරුවන්ට සැබවින් ම ඉඩම් නැත් දැයි පරීක්ෂණ කොමිසම් සැකයකින් තොරව පැහැදිලි කර ගත යුතු ය.

9.140 යෝජිත වැඩ සටහන ක්‍රියාත්මක කෙරෙන තෙක්, වෙනත් අනුමත අරමුණු සඳහා රාජ්‍ය ඉඩම් අවශ්‍ය කරන අවස්ථාවල දී හැර, අභ්‍යන්තරව අවතැන් වූවන් සඳහා හැර වෙනත් අයට කවර හෝ රාජ්‍ය ඉඩම් පවරා දීමක් සිදු වීම වැළැක්වීම සඳහා දැඩි පාලන විධි යොදා ගත යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. ව්‍යාජ ඔප්පු මාර්ගයෙන් රාජ්‍ය ඉඩම් පැවරීම සම්බන්ධ තොරතුරු පවතින බැවින්, එවන් නීති විරෝධී ක්‍රියාවන් සිදු කරන ඕනෑ ම රජයේ නිලධාරියෙකුට, නීතිඥයෙකුට හෝ නොතාරිස්වරයෙකුට හෝ එවැනි ක්‍රියාවන්ට ආධාර කරන සහ අනුබල දෙන වෙන යම් ඕනෑ ම පුද්ගලයෙකුට එරෙහිව, උචිත අවස්ථාවල දී එවැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට සහ නීතිමය පියවරයන් නියම කිරීමට අදාළ බලාධිකාරයන්ට හැකි වන පරිදි නීතිමය විධිවිධාන සම්පාදනය කළ යුතු ය.

9.141 බහුපාර්ශ්වීය හෝ ද්විපාර්ශ්වීය සංවර්ධන හවුල්කරුවන් හරහා ජාතික සගයාගේ අරමුදල් ඌනපූරණය කිරීම සඳහා ගළපා ගැනෙන ජාත්‍යන්තර මූල්‍ය සහාය, වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී උදව් විය හැකි යැයි කොමිසම විශ්වාස කරයි. උතුරු සහ නැගෙනහිර පළාත්වල සංවර්ධනය සඳහා වන තරගකාරී ඉල්ලීම් ඉඩම් අංශයට මුදල් වැය කිරීම කෙරෙහි සෘණාත්මක ලෙස බලපෑ හැකි නිසා, එවන් සහායක වැඩ පිළිවෙළකට වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු වන කවර මන්දගාමී වීමක් වුව වැළැක්විය හැකි ය. වැඩ සටහන් ප්‍රතිපත්තිය, තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම දරන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ය යන අවබෝධය මත, වැඩ සටහනට සහාය වීම සඳහා සංවර්ධන හවුල්කරුවෙකුගේ සහයෝගය ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ක්‍රියාත්මකව උත්සාහ දැරිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.142 පලාලිහි සහ ත්‍රිකුණාමල-සාම්පූර්හි අධිආරක්ෂිත කලාප දෙක අනුපිළිවෙළින් කුඩා කර තිබීමත්, තක්සේරු කර ඇති පරිදි පුද්ගලයන් 21,491ක් ආපසු ගම්බිම් කරා යවා තිබීමත් කොමිසම අගය කරයි. කෙසේ වුව ද, තක්සේරු කර ඇති පරිදි, කුඩා කරන ලද අධිආරක්ෂිත කලාප ප්‍රදේශ දෙකෙහි තව මත් පුද්ගලයෝ 26,755ක් අවතැන්ව සිටිති. පලාලිහි සහ ත්‍රිකුණාමල-සාම්පූර්හි පවත්නා අධිආරක්ෂිත කලාප දෙක මෙන් ම දිස්ත්‍රික්ක තුළ දී වර්තමානයේ ආරක්ෂක අරමුණු උදෙසා ප්‍රයෝජනයට ගැනෙන සුලු පෞද්ගලික ඉඩම් ප්‍රමාණය ද, ජාතික ආරක්ෂක අවශ්‍යතා සැලකිල්ලට ගන්නා අතර ම වැඩි ඉඩම් ප්‍රමාණයක් මුදා හැරීමේ දැක්මකින් යුතුව සමාලෝචනය කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. නිල අධිආරක්ෂිත කලාප නිසා හෝ වෙනත් නොනිල හෝ තත්කාර්යමය ආරක්ෂක අවශ්‍යතා නිසා ඉඩම් සහ හෝ නිවාස අහිමිව සිටින සියලු පවුල්වලට විකල්ප ඉඩම් ලබා දිය යුතු යැයි සහ හෝ අදාළ නීතිවලට අනුව වන්දි ගෙවිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. විකල්ප ඉඩම් සැපයීම සහ හෝ වන්දි ගෙවීම නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතු යැයි ද කොමිසම තව දුරටත් නිර්දේශ කර සිටී.

9.143 ආණ්ඩුව, සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ඇතිව, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, අවශ්‍යතාව පරිදි, සැලසුම් කෙරුණාට වඩා දිගු කලක් තිස්සේ, 'අලුතින් අභ්‍යන්තරව අවතැන් වුණු' පවුල්වලට ජීවනෝපාය සහාය පිරිනැමිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. උතුරු පළාතෙහි ඇතැම් ප්‍රදේශවල දී, මුලින් පැවති 6 මසක කාල පරිච්ඡේදයේ සිට 9 මසක කාල පරිච්ඡේදයක් දක්වා ජීවනෝපාය සහාය මුල පිරීම දීර්ඝ කර තිබීම පිළිබඳව කොමිසම සඳහන් කරන්නේ සතුටිනි. ග්‍රාමීය ගොවි කණ්ඩායම් සඳහා ක්ෂුද්‍ර ණය සැපයීමේ යෝජනා ක්‍රම සහ ගොවි සමුපකාර සඳහා ට්‍රැක්ටර් සැපයීම ඇතුළු ජීවනෝපාය සහාය තව දුරටත් පුළුල් කළ යුතු යැයි ද, එමෙන් ම උතුරෙහි වාරිමාර්ග නොමැති ප්‍රදේශවල දී උස්බිම් බෝග වගා කිරීමට අදාළ වියළි ගොවිතැන් ක්‍රම යොදා ගැනීම පිළිබඳව කළ හැකි නියමු ව්‍යාපෘති හඳුන්වා දීම වැනි උපදෙස් සහ වෙනත් සහායන් පුළුල් කළ යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. උතුරු පළාතෙහි වාරි සම්පාදන ජලාශවලින් සැලකිය යුතු ප්‍රමාණයක් දැන් ක්‍රියාත්මක බව (උතුරු පළාතෙහි දිසාපතිවරුන් ඉදිරිපත් කළ දත්ත අනුව) කොමිසම සඳහන් කර සිටී. පළාත තුළ මේ වන විට වාරි සම්පාදන ජලාශ අලුත්වැඩියා කෙරෙමින් තිබෙන වේගය, ඇතැම් විට එක්සත් ජාතීන්ගේ පද්ධතියේ සහාය ද ලැබ, ඉතිරි කුඩා වාරි සම්පාදන ජලාශ ද ක්‍රියාත්මක තත්ත්වයට පත් කෙරෙන තුරු අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.144 නැගෙනහිරෙහි ගැටුම අවසන් වී වසර 4කට ආසන්න කාලයක් ගත වී ඇතත්, නැගෙනහිරෙහි, විශේෂයෙන් ම මඩකලපුව දිස්ත්‍රික්කයෙහි සිදුව ඇත්තේ ඉතා සුලු ප්‍රගතියක් නිසා, නැගෙනහිර පළාතෙහි පිහිටි සිය කෘෂිකාර්මික ඉඩම්වලින් එල්ටීටීඊය බලාත්කාරයෙන් නෙරපා හළ සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජීවන තත්ත්වයන් උග්‍ර ලෙස පිරිහී ඇති මුස්ලිම් පවුල්වල ඉඩම් ගැටලු ඵලදායී ලෙස සහ කඩිනමින් විසඳිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.145 යාපනය දිස්ත්‍රික්කයෙන් සිංහල පවුල් පලවා හැරීම සම්බන්ධ නිල දත්ත වැරදි සහිත බව පෙනෙතැයි සඳහන් කරන කොමිසම, වඩා නිශ්චිත දත්ත ලබා ගනු පිණිස, කවර හෝ වාර්ගික රාගයක් හෝ ආතතීන් ඇවිස්සීමකින් තොරව, අගති විරහිතව සහ හික්මීමෙන් යුතුව නමුත් ක්‍රමානුකූල ආකාරයෙන් මෙම පැතිකඩ සමාලෝචනයට ලක් කළ යුතු යැයි නිර්දේශ කර සිටී. යාපනයෙන් උතුරු පළාතේ අවශේෂ ප්‍රදේශවලින් පලවා හැරුණු සහ ආපසු යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිංහල පවුල් ඔවුන්ට අයිති ඉඩම් කරා ආපසු යැවීමේ හෝ විකල්ප ඉඩම්වල යළි පදිංචි කිරීමේ ප්‍රගතිය අසතුටුදායක නිසා හැකි තරම් කඩිනමින් එය ඉටු කළ යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී.

9.146 යාපන, මන්නාරම් සහ මුලතිව් දිසාපතිවරුන් සැපයූ තොරතුරුවලට අනුව, යාපනයෙන් සහ උතුරු පළාතෙන් පලවා හළ මුස්ලිම් පවුල් ආපසු යාම සහ යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් මනා ප්‍රගතියක් අත් කර ගෙන ඇතැයි කොමිසම සඳහන් කර සිටී. යාපනයට සහ උතුරු පළාතට ආපසු යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ඉතිරි මුස්ලිම් පවුල් ආපසු යාම සහ යළි පදිංචි කිරීම ඉක්මන් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.147 පෙර පැවති තර්ජිත ගම්මානවල ජීවත් වන ඇතැම් පවුල්වල, විශේෂයෙන් ම එල්ටීටීඊ ප්‍රහාරවල දී පවුලේ දිවි පෙවෙත සරි කරන්නන් ඝාතනයට ලක් වුණු හෝ පවුලේ ආරක්ෂාව පතා 'රාත්‍රියේ අවතැන් වීමට' බල කෙරුණු පවුල්වල ඉඩම් ගැටලු සහ ජීවනෝපාය ගැටලු බොහෝ දුරට අමතක කර දමා සහ නො විසඳා ඇත. කොමිසම කනගාටුවෙන් සඳහන් කර සිටී. මෙම පවුල්වල වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාව සකස් කරන සමය තෙක් කොමිසමට ප්‍රමාණවත් තොරතුරු නොලැබුණු අතර, ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක ගෘහ මූලිකත්වය දරන්නේ කාන්තාවන්, ආච්චිලා හෝ සීයලා, වැඩිහිටි සහෝදර සහෝදරියන් සහ තනිකඩ පියවරුන් ය. පවත්නා ආණ්ඩුමය පරිපාලන යන්ත්‍රණයට මෙන් ම පරිණාමීය ජාතික පශ්චාත් ගැටුම් සංවර්ධන න්‍යාය පත්‍රයට බලපෑම් කිරීම සඳහා දේශපාලනික අනුග්‍රහයක් හෝ බලයක් මෙම පවුල්වලට නොමැති නිසා, ඔවුන්ගේ වත්මන් ගැටලු කඩිනමින් විසඳීමේ විශේෂ යන්ත්‍රණයක් සැලසුම් කිරීමේ දැක්මකින් යුතුව, පෙර පැවති තර්ජිත ගම්මානවල ගැටලුවල සහ පවුල් අවතැන් වීමේ විශේෂ ස්වභාවය අධ්‍යයනය කිරීම අරමුණ කොට ගත් ආයතනයක් නම් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.148 උතුරෙහි සහ නැගෙනහිරෙහි පෞද්ගලික ඉඩම්වලින් බලාත්කාරයෙන් පලවා හැරීම සහ ද්විතීයික පදිංචිය නීත්‍යානුකූල වීම වළකනු පිණිස, ගැටුම් කාල පරිච්ඡේදයේ දී ක්‍රියාත්මක වුණු ඉඩම් පැවරීම/පදිංචිය සම්බන්ධයෙන් යොදා ගැනීමේ දී නියෝග පැනවීමට අදාළ නීති සංශෝධනය කළ යුතු බව කොමිසමේ අදහස යි.

9.149 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්' යැයි කියනු ලබන - 2008 අප්‍රේල් මාසයට කලින් අවතැන් වුණු සහ සැලකිය යුතු ප්‍රමාණයක් 1980 ගණන්වල සිට අවතැන්ව සිටින - ජනයා මුහුණ දෙන තත්ත්වය පිළිබඳව කොමිසම උත්සුකතාව පළ කර සිටී. රාජ්‍යය සහ අනෙක් පාර්ශ්වකරුවන් ක්‍රියා නොකිරීම නිසා හෝ මන්දගාමීව ක්‍රියා කිරීම නිසා, වෙනස්කම් කිරීමෙන් තමන් පීඩාවට පත්ව ඇතැයි පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ට හැඟේ. 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්' ආපසු යාම සහ යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් රෙකමදාරු කරන සම්බන්ධීකාරක නිර්දේශය වන මෙම නිර්දේශය, 9.151, 9.153, 9.154, 9.155 සහ 9.156 නිර්දේශවලට සම්බන්ධ ය. ආණ්ඩුව 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ' ගැටලුවල පරිමාණය සොයා දැන ගත යුතු බව ද, එක්සත් ජාතීන්ගේ සහාය ඇතිව ස්වේච්ඡාවෙන් ආපසු යාමට කැමැති මෙම අවතැන් වූවන් ආපසු යැවීම සහ යළි පදිංචි කිරීම සඳහා වැඩ සටහනක් ආරම්භ කළ යුතු බව ද කොමිසමේ අදහස යි. ඉහත [9.138] විස්තර කෙරුණු යෝජිත ව්‍යාපෘතිය, පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ ස්වේච්ඡාමය ආපසු යාම හෝ යළි පදිංචි වීම සඳහා සහ ඔවුන්ගේ ගෙවත්ත සහ කෘෂිකාර්මික ඉඩම් යළි ලබා ගැනීමට සහාය වීම සඳහා ද ප්‍රයෝජනයට ගත හැකි ය. අසාධාරණත්වය සහ වෙනස්කම් කිරීම පිළිබඳව ඔවුන්ගේ හදවතින් සහ මනසින් පැන නගින කවර හැඟීමක් වුව, ජනවාර්ගික සුසංවාදය සහ ජාතික ප්‍රතිසන්ධානය පෝෂණය කිරීම කෙරෙහි හානිකර ලෙස බලපානු ඇත. අවතැන් වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශක මූලධර්ම සහ අවතැන් වූවන්ගේ ඉඩම් හිමිකම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශක මූලධර්ම, අවතැන් වුණු කාල පරිච්ඡේදය හෝ අවතැන් වීමට බලපෑ හේතු පදනම් කර ගෙන අවතැන් වූවන්ට යෝග්‍යතාවක් ලබා නොදෙන බව සඳහන් කිරීම ද මෙහි දී උචිත වේ. මූල්‍ය සීමාසහිතකම්, දේශපාලනික උත්සුකතාවන් හෝ ජාත්‍යන්තර පීඩනය නිසා ප්‍රතිලාභ සීමා කිරීමට සුවපහසු පරිපාලනමය නිර්වචන ප්‍රබන්ධ කෙරුණත්, සියලු අවතැන් වූවන්ට සමාන අයිතිවාසිකම් හිමි ය.

9.150 යෝග්‍ය අනාගත ජාතික ඉඩම් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ යෝජනා කරනු පිණිස ආණ්ඩුව ජාතික ඉඩම් කොමිසමක් (NLC) පිහිටුවීමේ ක්‍රියාව ඉක්මන් කළ යුතු බව කොමිසමේ අදහස යි. යෝජිත ජාතික ඉඩම් කොමිසම, ඉඩම් ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී රාජ්‍ය ඉඩම් සාධාරණ ලෙස බෙදා හැරීම පිළිබඳ මාර්ගෝපදේශ ඊට ඇතුළත් කර ගත යුතු ය. දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ මෙය අවශ්‍යතාවක් බවට පත් කෙරුණත්, කෙටුම්පත් පණතක් සකස් කර ඇතත්, අනුපිළිවෙළින් බලයට පත් ආණ්ඩු පාර්ලිමේන්තුව හරහා එය සම්මත කර ගැනීමට අසමත්ව ඇතැයි කොමිසම කනගාටුවෙන් සඳහන් කර සිටී.

9.151 වත්මන් සහ අනාගත පරම්පරාවල ජීවිතයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ දැක්මකින් යුතුව, පරිසරය සහ ජෛව විවිධත්වය, තිරසර ආර්ථික සංවර්ධනය, විවේක සහ විනෝදායන ප්‍රමිති, ආගමික, සංස්කෘතික සහ පුරා විද්‍යාත්මක අඩවි ආරක්ෂා කිරීම සහතික කරනු පිණිස ඉඩම් සංරක්ෂණය සහ පැවරීම සම්බන්ධයෙන් පරිපාලනයට මග පෙන්වීම සඳහා, අදාළ විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් උකහා ගැනෙන දිස්ත්‍රික්ක සහ ජාතික විශේෂඥයන්ගේ සහභාගිත්වයෙන්, උතුරෙහි සහ නැගෙනහිරෙහි ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා ඉඩම් පරිහරණ සැලැස්මක් සකස් කළ යුතු බව කොමිසමේ අදහස යි.

9.152 'වන්නියෙහි සහ යාපනයෙහි අවතැන් වූවන්ගේ සහ උතුරු පළාතෙහි සහ නැගෙනහිර පළාතෙහි කෘෂිකාර්මික ඉඩම් සහ තර්ජිත ගම්මානවල නිවාස අහිමි වූවන්ගේ ඉඩම් හිමිකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම' (එනම්, 'පැරණි' සහ 'නව' යන දෙකොට්ඨාසයට ම) ජාතික ගැටලුවක් ලෙස හඳුනා ගන්නා බවටත්, ආණ්ඩුවේ සහ විපක්ෂයේ දේශපාලන පක්ෂ එය පටු දේශපාලන වාසි තකා මෙවලමක් ලෙස යොදා නො ගන්නා බවටත්, ද්විපාර්ශ්වීය අවබෝධයකට එළඹිය යුතු යැයි කොමිසම සියලු දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටී, සියලු දේශපාලන පක්ෂවලට නිර්දේශ කර සිටී. ජාතික ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමේ දී එවන් ද්විපාර්ශ්වීය පිවිසුමක් ඇති කර ගැනීම අවශ්‍යයෙන් ම කළ යුත්තක් බව කොමිසමේ දැඩි අදහස යි.

***හත් වන පරිච්ඡේදය: හිමිකම් ප්‍රතිෂ්ඨාපනය/වන්දි සහන පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ***

9.153 හිමිකම් ප්‍රතිෂ්ඨාපනය නීතිමය මූලධර්මයක් ලෙස ප්‍රථමතාවක් භුක්ති විඳින නමුත්, වන්දි සහ මූල්‍ය සහන වැනි අනෙක් සහන ස්වරූප ද පොදුවේ බලාපොරොත්තු වන බව මැනවින් හඳුනා ගෙන ඇත. යළි පදිංචි කිරීම සහ ප්‍රතිසන්ධානය සඳහා පහසුකම් සැපයීමේ දී වන්දි සහන, පවත්නා ව්‍යුහයන් සහ ගෙවීම්වල වත්මන් තත්ත්වය ඉටු කරන විශේෂ කාර්ය භාරය කොමිසම සැලකිල්ලට ගෙන ඇත. ගෙවීම් ලැබීම සඳහා සුදුසුකම් සහිත අයට සැලකිය යුතු කාල රාමුවක් තුළ ඒවා ලබා ගත හැකි බව සහතික කිරීමට කොමිසමේ නිර්දේශ උත්සාහ දරයි.

9.154 ත්‍රස්තවාදී ප්‍රචණ්ඩත්වය සහ ආණ්ඩුවේ ආරක්ෂක හමුදාවල මෙහෙයුම් නිසා අහිමි වීමෙන්/හානි වීමෙන් පීඩාවට පත්ව සිටින පුද්ගලයා/පුද්ගලයන් සඳහා වන්දි සහන ලබා දීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම දරන විශේෂඥ ආයතනය වනුයේ පුද්ගලයන්, දේපොළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය (REPPIA) යි. රෙපියා ආයතනයේ සභාපතිවරයා රෙපියා ආයතනයෙන් සැපයෙන වන්දි සහන සංකල්පගත කළේ 'සැනසීම සහ සහනය' ලෙස ය. එහි අරමුණ වන්නේ ක්‍රියාත්මකව තිබෙන නානාවිධ සහන සහ යළි ගොඩ නැගීම් වැඩ සටහන් ඌනපූරණය කිරීම යි.

9.155 කොමිසම හමුවේ ඉදිරිපත් කෙරුණු ප්‍රකාශ සහ වන්දි සහනවලට අදාළ සම්මතයන් සහ ප්‍රමිතීන් පිළිබඳ කොමිසමේ සලකා බැලීම් පදනම් කර ගෙන, පශ්චාත් ගැටුම් අවශ්‍යතා සැපිරීමට උර දීමේ දී රෙපියා ආයතනය සතු කාර්ය භාරය සහ සම්පත් වඩා කාර්යක්ෂම කිරීමේ සහ වර්ධනය කිරීමේ දැක්මකින් යුතුව රාජ්‍යය එහි කාර්ය භාරය සහ ධාරිතාව සමාලෝචනයට ලක් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.156 බලපෑමට ලක් වුණු පුද්ගලයන්ට සහන සැපයීමෙහි ලා පවතින වඩාත් ම තීරණාත්මක තනි ගැටලුව වන්නේ සුදුසුකම් ලබා ඇති ගෙවීම් සපුරා ලීම සඳහා අවශ්‍ය කරන අරමුදල් දැඩි ලෙස හිඟ වීම යි. කවර හෝ ප්‍රගතියක් අත් කර ගැනීමට නම් මෙම ගැටලුවට හදිසි විසඳුමක් සැපයීම අත්‍යවශ්‍ය ය. අනෙක් පරිපාලනමය බාධාවන්, පහසුවෙන් පාලනය කර ගත හැකි මට්ටමක පවතින බව පෙනී යයි.

9.157 පූර්ණ වශයෙන් සහ නියමිත වේලාවට ගෙවීම්වලට ප්‍රමුඛතාව දීම සම්බන්ධයෙන් ආණ්ඩුව වගකීම භාර ගත යුතු ය. අතපසු වුණු ගෙවීම් බේරීම සඳහා සහ අනාගතයේ දී ඇති වන පමාවන්ට සහ නොගෙවීම්වලට අරමුදල් හිඟය හේතු වීම වැළැක්වීම සඳහා අරමුදල් සපයා ගත යුතු ය.

9.158 ගෙවීම් සහතික කිරීමේ වගකීම රෙපියා ආයතනය භාර ගත යුතු ය. තම හිමිකම් ලබා ගැනීම පුද්ගලයන්ගේ වගකීමක් නො විය යුතු ය. සියලු හිමිකම් සැපිරෙන බව සහතික කිරීම සඳහා, රෙපියා ආයතනය විසින් ම ඉලක්ක කාල රාමුවක් නියම කර ගත යුතු ය.

9.159 ගැටුමේ අවසානය දක්වා විදි පාඩු සඳහා ගෙවීම් සම්පූර්ණ කිරීමට කාල සීමාවක් නියම කළ යුතු ය. හේතු දෙකක් නිසා මෙය කළ යුතු ය: 1) ගෙවීම් සඳහා හිමිකම් ඇති අයට උග්‍රතම මූල්‍ය අවශ්‍යතා පවතින අවස්ථාවේ දී ඒවා ලබා ගත හැකි වීම. 2) ගැටුමේ බලපෑමට ලක් වූවන් සම්බන්ධයෙන් රෙපියා ආයතනයට තිබෙන වගකීම් සම්පූර්ණ කිරීම.

9.160 ගෙවීම් සම්පූර්ණ කළ යුතු කාල සීමාවක් නියම කිරීමේ දී පහත සඳහන් දෑ සැලකිල්ලට ගත යුතු වේ: 1) අයැදුම්පත් ඉදිරිපත් කරන්නන් සඳහා යුක්ති සහගත කාලයක් ලබා දිය යුතු ය. කාල සීමාවක් තීරණය කිරීමේ දී, අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ සහ එල්ටීටීඊය ආධිපත්‍යය දැරූ ප්‍රදේශවල ජීවත් වූවන්ගේ විශේෂ තත්ත්වයන් සැලකිල්ලට ගත යුතු ය. 2) රෙපියා ආයතනයේ හැකියාව සහ අනෙක් අදාළ සාධක පදනම් කර ගෙන, අයැදුම්පත් සහ ගෙවීම් පිළියෙළ කිරීම සඳහා යුක්ති සහගත අවම සහ උපරිම කාලයක් සලකා බැලිය යුතු ය. හිමිකම් තිබෙන සියලු පුද්ගලයන් අයැදුම් කරන බව සහතික කිරීම සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දිය යුතු ය.

9.161 බලපෑමට ලක් වුණු ප්‍රදේශවල ජනයාගේ අවශ්‍යතා සැපිරීම සඳහා අධ්‍යාපනික සහ ජීවනෝපාය ව්‍යාපෘති තීරණාත්මක බව කොමිසම පිළිගන්නා නමුත්, රෙපියා ආයතනයේ ප්‍රධාන අවධානය විය යුත්තේ ගැටුමේ බලපෑමට ලක් වුණු පුද්ගලයන් සඳහා වන්දි සහන සැපයීම යි. ඒ නිසා ම, අදාළ වෙනත් රාජ්‍ය බලාධිකාරයන් විසින් ඌනපූරක ව්‍යාපෘති භාර ගත යුතු ය.

9.162 මරණ, තුවාල සහ නිවාසකරණ හිමිකම්වලට අදාළව 'පොදු මහජනතාව' සහ 'රජයේ සේවකයන්' වෙත කළ යුතු ගෙවීම්වලට රෙපියා ආයතනය වහා ප්‍රමුඛතාව දිය යුතු ය. රාජ්‍ය නොවන සංවිධානවල සහන වැඩ සටහන්වල දී, විශේෂයෙන් ම නිවාසකරණය සඳහා සැපයෙන සහායේ දී, සුදුසුකම් නොමැති ගැටලුවක් බවට පත් කර ඇති රජයේ සේවකයන් පිළිබඳ ගැටලුව යළි සලකා බැලිය යුතු ය.

9.163 වන්දි ප්‍රමාණය වැඩි කරන ලෙස රෙපියා ආයතනයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. කෙසේ වුව ද, අතපසු වුණු ගෙවීම් සහ තව මත් තීරණයක් ගෙන නොමැති අයැදුම්පත් අනුමත කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය කැප කිරීම සැලකිල්ලට ගන්නා කොමිසම, ප්‍රමාණය වැඩි කිරීම ඉටු කළ හැකි පියවරක් යැයි නො සලකයි. තව ද,

වන්දි මූලධර්ම සැලකිල්ලට ගන්නා කල ආණ්ඩුව සම්බන්ධයෙන් වඩා යුක්ති සහගත ක්‍රමෝපාය වනු ඇත්තේ, යළි ගොඩ නැගීම සහ යළි පදිංචි කිරීම සහතික කිරීම සඳහා ඌනපූරක යෝජනා ක්‍රම සම්පාදනය කිරීම යි.

9.164 එල්ටීටීඊයට සම්බන්ධව සිටි අයගේ මරණ සහ තුවාල සඳහා වන්දි සහන සැපයීම පිළිබඳව තීරණයක් ගත යුතු ය. පුළුල් ප්‍රතිසන්ධාන දැක්මෙන් න්‍යායිකව සලකන කල කොමිසමේ අදහස වන්නේ හිටපු සටන්කරුවන් සහ සමීප ඥාතීන් ද වන්දි සහන සඳහා සුදුස්සන් ලෙස සැලකිය යුතු බව යි. කෙසේ වුව ද, රෙපියා ආයතනයේ ප්‍රමුඛතාව විය යුත්තේ වඩාත් ම අගහිඟකම්වලින් පෙළෙන බලපෑමට ලක් වුණු සිවිල් වැසියන් ය.

9.165 නිවාස අවශ්‍යතාවලට වහා විසඳුම් සෙවිය යුතු ය. නිවාසකරණය යනු ආපසු පැමිණෙන අභ්‍යන්තරව අවතැන් වූවන් සම්බන්ධ, විශේෂ අවධානයක් අවශ්‍ය කරන, වන්දි සහනවල විෂය පථයෙන් සහ රෙපියා ආයතනයේ විධිනියෝගවලින් ඔබ්බට යන මූලික ගැටලුවකි. අවශ්‍ය නිවාස සංඛ්‍යාව සහ ඒ සඳහා යන අධික වියදම සැලකිල්ලට ගෙන, ආණ්ඩුව හැකි සියලු ජාතික සහ ජාත්‍යන්තර ආයතනික සහ පෞද්ගලික සහාය මූලාශ්‍ර වෙත එළඹිය යුතු ය.

9.166 සමාප්ති වශයෙන්, වන්දි සහන සැපයීම එකලාව සලකා බැලිය නොහැකි යැයි කොමිසම නිරීක්ෂණය කර සිටී. වන්දි සහන ඉටු කරන විශේෂිත කාර්ය භාරය තේරුම් ගත යුත්තේ ගැටුමේ කේන්ද්‍රයව තිබුණු ප්‍රදේශවල ක්‍රියාත්මක වන සමස්ත යළි පංදිවි කිරීම් සහ සංවර්ධන ක්‍රමෝපාය සමග සසඳමිනි. සෞඛ්‍යය, අධ්‍යාපනය, ආහාර, ජලය සහ කෘෂිකර්මය, යටිතල පහසුකම් වැනි මූලික ජාතික සුභසාධන සේවාවන්හි ක්‍රියාකාරිත්වය මෙන් ම ජීවනෝපාය සංවර්ධන සහ ග්‍රාම සංවර්ධන වැඩ සටහන් වැනි ඌනපූරක රාජ්‍ය වැඩ සටහන් ද මේවාට ඇතුළත් ය.

***අට වන පරිච්ඡේදයඃ ප්‍රතිසන්ධානය - I වන කොටසඃ පශ්චාත් යුද ප්‍රතිසන්ධානය කෙරෙහි බලපාන ගැටලු පිළිබඳ නිරීක්ෂණ***

9.167 කොළඹ සහා වාරවල දී සහ විශේෂයෙන් ම ක්ෂේත්‍ර චාරිකාවල දී, ගැටුම නිසා ඍජුව හෝ වක්‍රව බලපෑමට ලක් නොවුණු පුද්ගලයන්ට අදාළ ගැටලු පිළිබඳ ප්‍රකාශ කොමිසම හමුවේ ඉදිරිපත් කරනු ලැබිණ.

9.168 මෙම ගැටලු සලකා බැලිය යුත්තේ ප්‍රතිසන්ධානය සහ මිත්‍රත්වය සහ ජාතික සුසංවාදය පිළිබඳ තත්ත්වය තුළ යැයි කොමිසම කල්පනා කරයි. එදිනෙදා ජීවිතයට ඍජුව අදාළව ඉස්මතු කෙරුණු ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් කොමිසම සිවිල් පරිපාලකයන්ගෙන් (දිසාපතිවරුන්ගෙන්) සහ ආරක්ෂක හමුදාවලින් යාවත්කාල කළ තොරතුරු බලාපොරොත්තුවෙන් සිටින අතර, සමස්තයක් ලෙස ගත් විට මතු කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇති බව සහ එම ප්‍රගතිය අඛණ්ඩව පෙරට යමින් පවතින බව පෙන්නුම් කරන, 2011 වසරේ දී නිකුත් කරන ලද උතුරු පළාතේ යළි පදිංචි කිරීම්, සංවර්ධනය සහ ආරක්ෂාව සම්බන්ධ ජනාධිපති කාර්ය බලකා වාර්තාව, මහ බැංකුවේ සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා මෙන් ම මානුෂීය කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) සකස් කළ මානුෂීය සහ කල් තියා යථා තත්ත්වයට පත් වීම පිළිබඳ ඒකාබද්ධ යාවත්කාල වාර්තා ද කොමිසමේ සලකා බැලීමට ලක් වේ.

9.169 දිසාපතිවරුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර ඇතුළු පරීක්ෂා කළ තොරතුරු පදනම් කර ගෙන කොමිසම මෙසේ සඳහන් කර සිටීඃ

- යළි පදිංචි කිරීම්, ජීවනෝපාය, අධ්‍යාපන, වෛද්‍ය, ප්‍රවාහන සහ ස්ථිර නිවාස පිළිබඳ මහජන අවශ්‍යතාවලට විසඳුම් සෙවීම සඳහා බලපෑමට ලක් වුණු සියලු දිස්ත්‍රික්කවල දී සාමූහිකව පරිශ්‍රම දරනු ලබන අතර, (මූල්‍ය සහ අනෙක් සහාය පැකේජයන් ප්‍රදානය කිරීම හරහා ද ඇතුළුව) අනල්ප ප්‍රගතියක් අත් කර ගෙන ඇත. බලපෑමට ලක් වුණු බොහෝ දිස්ත්‍රික්කවල ප්‍රධාන ක්‍රියාකාරකම වන කෘෂිකර්මය නිෂ්පාදනය වැඩි කර ගෙන ඇති අතර, ධීවර නිෂ්පාදනය ද වැඩි දියුණු වීමක් පෙන්නුම් කර ඇත. යටිතල පහසුකම් සංවර්ධනය කටයුතු මැනවින් කෙරී ගෙන යයි. කෙසේ වුව ද, මෙම ප්‍රදේශවල තව මත් නොසැපිරුණු අවශ්‍යතා පවතී. ඇතැම් ධීවර බිම්වලට තව මත් පිවිසිය නොහැකි අතර, සමහර දිස්ත්‍රික්කවල දී මසුන් ඇල්ලීම සඳහා නාවික හමුදාවෙන් අවසර පත් ලබා ගත යුතු ය. වාරි සම්පාදන ජලාශ සැලකිය යුතු සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කොට ප්‍රයෝජනයට ගැනෙමින් පවතිතත්, ඉතිරි ජලාශ පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් කඩිනම් වැඩ

සටහනක් ක්‍රියාත්මක කිරීම කෘෂිකාර්මික නිෂ්පාදනයට තව දුර සහායක් වනු ඇත. ඇතැම් අවස්ථාවල දී යළි පදිංචි කිරීම් සහාය පිළිබඳව තව මත් තීරණයක් ගෙන නැති අතර, සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය ලියකියවිලි සම්පාදනයේ දුෂ්කරතා පවතින බව පෙනේ. ගුරුවරුන්ට වාසස්ථාන සැපයීම සෑම දිස්ත්‍රික්කයක ම පවතින පොදු ගැටලුවක් බව පෙනේ.

- ඉඩම් සම්බන්ධ ගැටලු අඛණ්ඩ අභියෝගයක්ව පවතී.

- සැබෑ කැප කිරීම් සහ බෙදා හැරීම් සමග සසඳන කල, ස්ථිර වාසස්ථාන අවශ්‍යතා බරපතළ සැලකිල්ලක් දැක්විය යුතු කාරණාවකි.

- ගොදුරු විය හැකි ඇතැම් පුද්ගල කණ්ඩායම්වල අවශ්‍යතා වඩා යොමු වුණු පිවිසුමක් ඉල්ලා සිටී.

- **ඇතැම් දිස්ත්‍රික්කවල දී, සිවිල් පරිපාලනය යළි ස්**ථාපනය කිරීම තව මත් සිදු වන්නේ හෙමිහිට ය. ග්‍රාම නිලධාරි තනතුරු සම්බන්ධයෙන් බොහෝ පුරප්පාඩු පවතී - ග්‍රාම නිලධාරිවරයා යනු ප්‍රජා මූල මට්ටමේ දී සිවිල් පරිපාලනයේ කේන්ද්‍රය ය යන කරුණ සැලකිල්ලට ගන්නා කල මෙම පුරප්පාඩු පිරවීම ප්‍රමුඛතාවක් විය යුතු බව කොමිසමේ අදහස යි.

9.170 කෙසේ වුව ද, තිස් වසරක් තිස්සේ විහිදුණු ගැටුමේ දිග් ගැසුණු ස්වභාවය සැලකිල්ලට ගන්නා කල, එවන් සියලු ගැටලු විසඳීම සඳහා කාලයක් ගත වීම සාමාන්‍ය දෙයක් බවත්, සැලකිය යුතු සම්පත් සහ මූල්‍ය සම්පාදනයක් අවශ්‍ය බවත් කොමිසම හඳුනා ගනී. එමෙන් ම, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව උතුරට සහ නැගෙනහිරට සැලකිය යුතු අරමුදල් සහ සම්පත් ප්‍රමාණයක් සැබවින් ම කැප කර ඇති බව ද, ශ්‍රී ලංකාවේ සංවර්ධන හවුල්කරුවන් මෙම පරිශ්‍රමයන්ට දායක වෙමින් සිටින බව සහ ආණ්ඩුවේ ආයතන සමග සහයෝගයෙන් වැඩ කරමින් සිටින බව ද කොමිසම සඳහන් කර සිටී. රට පුරා සිටින පුරවැසියන්ගේ මූලික අවශ්‍යතාවලට සහාය වන බවත්, ඔවුන්ට ආර්ථික ලාභාංශ සමානව බෙදාහදා ගත හැකි බවත් සහතික කිරීම සඳහා තමන්ගේ පැත්තෙන් භාර ගැනීමක් සහ කැප වීමක් පවතින බව ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ මෙම කටයුතු පෙන්නුම් කරයි. ඒ අතර ම, සම්පත්, ප්‍රායෝගික දැනුම සහ අත්දැකීම් සජීවීකරණය කිරීම සම්බන්ධයෙන් විදේශීය සංවර්ධන හවුල්කරුවන් සතු පූර්ණ ශක්තිය මුදුන් පමුණුවා කර ගනු පිණිස, රට තුළ සහ විදේශයෙහි සිටින තම සංවර්ධන හවුල්කරුවන් සම්බන්ධයෙන් වඩා ගිවිසුම්ගත සහ ඵලදායී ප්‍රතිපත්තියක් යොදා ගත යුතු යැයි කොමිසම අදහස් කරයි. එවන් ප්‍රතිපත්තියක්, ඉතිරිව පවත්නා යළි ගොඩ නැගීම්, සංවර්ධන අභියෝග සහ ප්‍රතිසන්ධාන අභියෝගවලට මුහුණ දීමේ දී වාසිදායක වනු ඇත.

9.171 යළි ගොඩ නැගීම සඳහා සහ සංවර්ධනය සඳහා දායක වීමට ආරක්ෂක හමුදා ක්‍රියා කර ඇති අතර තව දුරටත් ක්‍රියා කරමින් සිටින නමුත්, ඇතැම් දිස්ත්‍රික්කවල දී ඔවුන් පෞද්ගලික ඉඩම්වල කුඩා ව්‍යාපාර සහ ගොවිතැන් කටයුතුවල යෙදී සිටින බවට උත්සුකතාවන් පැවතියේ යැයි, සිවිල් පරිපාලකයන්ගෙන් සහ වෙනත් අයගෙන් ලැබුණු ප්‍රතිචාර පදනම් කර ගෙන කොමිසම තව දුරටත් සඳහන් කර සිටී. තව ද, ඇතැම් දිස්ත්‍රික්කවල දී, සමහර අවස්ථාවල නිවාස සහාය සැපයීම සඳහා ප්‍රතිලාභීන් තෝරීම ඇතුළු විවිධ ක්‍රියාකාරකම් සඳහා ආරක්ෂක හමුදාවල අවසරය අවශ්‍ය බව ද පෙනී යයි. උතුරෙහි සහ නැගෙනහිරෙහි ඇතැම් රාජ්‍ය ගොඩනැගිලි සහ පෞද්ගලික ඉඩම්/ගොඩනැගිලි ආරක්ෂක හමුදා අඛණ්ඩව ප්‍රයෝජනයට ගනිමින් සිටින බව ද ප්‍රතිචාර පෙන්නුම් කරයි. සැලකිය යුතු කාල සීමාවන් ලබා දී, ආරක්ෂක හමුදා සිවිල් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම සහ ආරක්ෂක හමුදා පෞද්ගලික ඉඩම් ප්‍රයෝජනයට ගැනීම ක්‍රමිකව නතර කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

9.172 දත්ත විශ්ලේෂණය කරන විට, විශේෂයෙන් ම සිවිල් පරිපාලකයන් සපයන දත්ත විශ්ලේෂණය කරන විට, එක් එක් දිස්ත්‍රික්කයේ ප්‍රගතිය/ගැටලු වාර්තා කිරීම සඳහා ඒකාකාර සහ විනිවිද භාවයෙන් යුතු පිවිසුමක අවශ්‍යතාවක් පවතී. එමෙන් ම, අත් කර ගත් ප්‍රගතිය සම්මත වාර්තාකරණ යන්ත්‍රණයක් හරහා අවශ්‍යතා පිළිබඳ හිදැස් සමග සසඳන විශ්ලේෂණයක් අවශ්‍ය ය. සම්බන්ධ ගැටලුවල බහුවිෂයීය ස්වභාවය සැලකිල්ලට ගන්නා කල මෙය දුෂ්කර කර්තව්‍යයක් විය හැකි නමුත්, තව මත් විසඳිය යුතුව තිබෙන සාර්ව මෙන් ම ක්ෂුද්‍ර මට්ටමේ ප්‍රමුඛ ගැටලු පිළිබඳව වඩා පුළුල් අවබෝධයක් ඇති කර ගැනීමට හැකියාව ලබා දීමෙහි ලා එය බොහෝ කලක් සේවය කරනු ඇත.

***අට වන පරිච්ඡේදය: ප්‍රතිසන්ධානය - II වන කොටස: ප්‍රතිසන්ධානය පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ***

9.173 දශක තුනකට ආසන්න දිග් ගැසුණු සහ ලේ වැකි ගැටුම අවසන් වීම, විවිධ ප්‍රජාවන් අතර, විශේෂයෙන් ම සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධානය ඇති කිරීම සඳහා බොහෝ අවස්ථාවන් විවර කර ඇත. අන්තර් රඳා පැවැත්මෙන් යුතු, සාධාරණ, අපක්ෂපාතී, විවෘත සහ විවිධ සමාජයක් පිළිබඳ පොදු දැක්මක් සකස් කිරීම අවශ්‍යතාවක් බවට පත් වේ. පොදු අනාගතයක් පිළිබඳ දැක්මක් වර්ධනය කිරීම, සමස්ත සමාජය ම සම්බන්ධ වීමේ අවශ්‍යතාව මතු කරයි. අතීතයේ අහිමි වීම් සහ පීඩාවන් පිළිගැනීමත්, වන්දි, සමාජ සාධාරණත්වය සඳහා සහ සාමාන්‍ය තත්ත්වය යළි ඇති කිරීම සහ සහානුභූතිය සහ සහයෝගිතාව ප්‍රකාශයට පත් කිරීම සඳහා යන්ත්‍රණයන් සම්පාදනය කිරීමත් යනු සහන සැලසීම අරමුණු කර ගත් පියවරයන් ය. පොදු ලක්ෂණ සහ වෙනස්කම් පිළිගන්නා අතර ම, ප්‍රචණ්ඩ ගැටුමෙන් පසුව සම්බන්ධතා ගොඩ නැගීමත්, විශ්වාසයක් නැතිකම, අගතිය සහ ඉවසා නොදැරීම පිළිබඳ ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීමත් යනු ප්‍රතිසන්ධානයේ හරය යි.

9.174 සැකයේ, භීතියේ, අවිශ්වාසයේ සහ ප්‍රචණ්ඩත්වයේ සංස්කෘතිය උගුලා දැමිය යුතු අතර, මිනිසුන්ට එකිනෙකාට සවන් දිය හැකි සහ මිනිසුන් එකිනෙකාට සවන් දෙන අවස්ථා සහ අවකාශ විවර කළ යුතු ය.

9.175 කොමිසම හමුවේ පෙනී සිටි හෝ එය සමග වෙන යම් ආකාරයකින් අදහස් හුවමාරු කර ගත් පුද්ගලයන් සිය ගණනක් ඉදිරිපත් කර ඇත්තේ, ආසන්න වශයෙන් ඒකමතික සහ ඉතා පැහැදිලි පණිවුඩයකි. එම පණිවුඩය දෙයාකර ය.

9.176 පළමුව, දශක තුනකට ආසන්න කාලයකට පසුව අවසන් වුණු වේදනා ගෙන දෙන සහ දුබල කරවන ගැටුමකින් ගොඩ විත්, සියලු ප්‍රජාවන්ට අයත් මහජනයා දැන් කල් පවත්නා සාමයක්, ආරක්ෂාවක්, මිත්‍රත්වයක් සහ සුසංවාදයක් ප්‍රාර්ථනා කරති. මේ රටේ දේශපාලන නායකයන්ට විසඳිය නොහැකි හෝ ඔවුන් විසඳීමට නොකැමැති ගැටලුවලට විසඳුම් සොයනු පිණිස මෙම භාග්‍යවන්ත භූමිය මත යළි කිසි දිනෙක ලේ හැලීමක් සිදු නොවන බව සහතික කිරීම සඳහා අප අපට හැකි සියලු දේ කළ යුතු යැයි ඔවුහු එක සමාන ප්‍රබලතාවකින් ප්‍රකාශ කර සිටිති.

9.177 දෙවනුව, එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් කිරීම සහ විධායක ජනාධිපතිවරයෙකු නායකත්වය දෙන බලගතු සහ පුළුල් පදනමක් සහිත ආණ්ඩුවකට මුල පිරීම උදාර අවස්ථාවක් සපයා ඇති බවට - සියලු ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධානය, මිත්‍රත්වය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කරමින්, සුලුතර ප්‍රජාවන්ගේගේ දුක් ගැනවිලිවලට දේශපාලනික විසඳුම් සපයමින් සහ සියලු පුරවැසියන්ගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් අත්පත් වන බව සහතික කරමින්, පාලන ගැටලු පරාසයකට විසඳුම් සෙවීම සඳහා ඒකමතික ඉදිරි මාවතක් වර්ධනය කිරීමට අවස්ථාවක් සපයා ඇති බවට - පැහැදිලි පණිවුඩයක් පැවතිණ.

9.178 ප්‍රතිසන්ධානය සහ ජාතිය ගොඩ නැගීම සඳහා නම්, රාජ්‍යය සුලුතර ප්‍රජාවන් වෙත ළඟා විය යුතු අතර, අනෙක් අතට සුලුතර ප්‍රජාවන්, රාජ්‍යය සහ රට සම්බන්ධිත තම කාර්ය භාරය යළි නියම කර ගත යුතු ය.

9.179 එදිරිවාදී දේශපාලනය අත් හැර දැමීම සඳහා සියලු දේශපාලන පක්ෂවල පැත්තෙන් කැමැත්තක් පැවතිය යුතු අතර, ජාතික ගැටලු සම්බන්ධයෙන් ඒකමතික තීරණ ගැනීමක් තිබිය යුතු ය. මෙම අවස්ථාව සම්බන්ධ අභියෝගවලට මුහුණ දෙනු පිණිස, සියලු දේශපාලන පක්ෂවල පැත්තෙන් ධෛර්යයක් දේශපාලනික අධිෂ්ඨානයක් තිබිය යුතු ය.

.

9.180 කොමිසම හමුවේ පෙනී සිටි බොහෝ දෙනා අවධාරණය කළේ, ආරක්ෂක හමුදා අත්පත් කර ගත් දෙය, ජාතිය උදෙසා තිරසර සාමයේ සහ ආරක්ෂාවේ ද ප්‍රජාවන් තුළ සහ අතර කල් පවත්නා මිත්‍රත්වයේ, සබැඳියාවේ සහ සුසංවාදයේ ද යුගයකට මග පෙන්වන දේශපාලනික ක්‍රියාවලියක් තුළ පිහිටුවිය යුතු බව යි. මෙම කර්තව්‍යය මුදුන් පමුණුවා ගත හැක්කේත්, මුදුන් පමුණුවා ගත යුත්තේත්, රටේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරී භාවය ඔසවා තබන ගමන් සහ ප්‍රජාතන්ත්‍රවාදය, ඉවසා දැරීම සහ බලය බෙදා හැරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දිගු කලක් තිස්සේ රැක ගත් වටිනාකම් ආරක්ෂා කරන ගමන් යැයි පුද්ගලයන් පුළුල් පරාසයක් ප්‍රකාශ කළෙන් කොමිසම යළිත් පොදු පදනමක් සොයා ගත්තේ ය.

9.181 ගැටුම අවසන් වූ තැන් සිට වසර දෙකක් ගත වී ඇතත්, ප්‍රචණ්ඩත්වය, සැකය සහ වෙනස්කම් කිරීම පිළිබඳ හැඟීම සාමාජීය සහ දේශපාලනික ජීවිතය තුළ තව මත් පැතිර පවතින බව ද කොමිසමට සිහිපත් කෙරිණ. පැහැදිලි ලෙස යොමු කළ පශ්චාත් යුද සාමය ගොඩ නැගීමේ න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදුව තිබෙන පමාව මෙම තත්ත්වයට හේතු වී තිබෙනවා විය හැකි ය.

9.182 එම නිසා, පහත අමුණා ඇති නිරීක්ෂණ/නිර්දේශ නියෝජනය කරන්නේ, මෙම පැහැදිලි සහ වර්තමාන අනතුරු නිසා උපත ලැබ කොමිසම සැලකිල්ලට ගත් අදහස් සහ කොමිසම හමුවේ පෙනී සිටි පුද්ගලයන් ගණනාවක් දළ වශයෙන් විස්තර කළ අවස්ථාවන් ය. සියලු ශ්‍රී ලාංකිකයන් මට්ටම් තුනක දී උර දිය යුතු සාමූහික පරිශ්‍රමයක් පෝෂණය කිරීමට ඔවුහු උත්සාහ කළහ: එනම්, දේශපාලන නායකත්වය මට්ටමේ දී, සිවිල් සාමාජීය මට්ටමේ දී සහ තනි පුද්ගල පුරවැසි මට්ටමේ දී ය.

9.183 කෙසේ වුව ද, මෙම ක්‍රියාවලියේ ප්‍රධාන යෝජනාකරු වීමේ වගකීම ඍජුව ම තිබෙන්නේ ආණ්ඩුවට බව අවධාරණය කිරීමට කොමිසම කැමැති ය. ප්‍රතිසන්ධානය යනු ක්‍රියාවලියක් මිස යට ගිය සිදුවීමක් නොවන නිසා, එම අරමුණ උදෙසා දරන පරිශ්‍රමයන්, ඡන්දයෙන් පත් වුණු ආණ්ඩුවේ පූර්ණ සහාය ලැබ, අඛණ්ඩව සහ පුළුල් පදනමක කර ගෙන යා යුතු ය.

9.184 ශ්‍රී ලංකාවෙහි ජනවාර්ගික ගැටුමේ මූල හේතුව පවත්නේ දෙමළ ජනතාවගේ අව්‍යාජ දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීමට අනුපිළිවෙළින් බලයට පත් ආණ්ඩු අසමත් වීම තුළ යැයි කොමිසම අදහස් කරයි.

9.185 ගැටුමේ හේතුවලට විසඳුම් සෙවීම සඳහා දේශපාලනික විසඳුමක් ඉදිරිපත් කිරීම අවශ්‍යයෙන් ම කළ යුත්තකි. රෝග විනිශ්චය සහ බෙහෙත් වට්ටෝරුව පිළිබඳව කිසිදු එකඟතාවක් නො පැවතිය ද හැම දෙනා ම ඒ පිළිබඳව කතා කළහ.

**දෙමළ ප්‍රජාවේ දුක් ගැනවිලි**

9.186 ජනවාර්ගික ගැටුම සහ එහි හේතු පිළිබඳ කතාබහේ දී දෙමළ ප්‍රජාවේ දුක් ගැනවිලි කැපී පෙනෙන ලෙස ඉදිරිපත් කර ඇත.

9.187 දෙමළ ජනයා දුක් ගැනවිලි ප්‍රකාශයට පත් කිරීම සිංහල-දෙමළ සම්බන්ධතාවේ කේන්ද්‍රයෙහි දිගින් දිගට ම පවතින අතර, පශ්චාත් ගැටුම් ප්‍රතිසන්ධාන සහ සාමකාමී සහජීවන ක්‍රියාවලියෙහි පළමු පියවර ලෙස සලකා ඍජුව සහ සාධාරණ ලෙස හඳුනා ගෙන විසඳුම් සෙවිය යුතු ය. මෙම දුක් ගැනවිලි කාලයත් සමග වෙනස් වී ඇති බව සහ ඇතැම් ඒවාට අඩු ගණනේ පාර්ශ්වීය වශයෙන් වත් විසඳුම් සපයා ඇති බව ගැන කිසිදු සැකයක් නැත. කෙසේ වුව ද, ගැටුම වර්ධනය වෙද්දී බොහෝ නව දුක් ගැනවිලි එකතු වී ඇත. එම ක්‍රියාවලියේ දී බහුතර ප්‍රජාවට සහ අනෙක් සුළුතර ප්‍රජාවන්ට ද තම තමන්ගේ ම දුක් ගැනවිලි පවතී.

**ශ්‍රී ලංකාව තුළ බහුතර-සුළුතර සම්බන්ධතාවන්ගේ ඓතිහාසික පසුබිම**

9.188 සෝල්බරි කොමිසම් වාර්තාව සුළුතර ප්‍රජාවන්ගේ දුක් ගැනවිලි යැයි එය හැඳින්වූ දෙය සඳහා සැලකිය යුතු ඉඩක් කැප කළේ ය.

9.189 හේතු වුණු ගැටලු විසඳීම සඳහා පරිපාලනමය සහ ව්‍යවස්ථාමය සුරැකිතාවන් අවශ්‍ය වුණු නමුත්, බහුතරයේ සහ සුළුතරයේ අන්‍යෝන්‍ය පැවතුම්වල මූලික වෙනසකින් තොරව මින් එකක් වත් ප්‍රමාණවත් නොවන බව සෝල්බරි කොමිසම නිගමනය කළේ ය. දෙපාර්ශ්වයේ මෙම හැඟීම් ප්‍රජාවන් දෙක අතර සම්බන්ධතා කෙරෙහි තීරණාත්මක බලපෑමක් කළ අතර, ශ්‍රී ලංකාව සිටින්නේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුළ නිසා, කොමිසමේ අදහස නම්, මේ දැන් අවසන් වුණු ගැටුමට හේතු වූයේ කුමක් ද යන්න වැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උත්සාහ කිරීමේ දී වඩාත් ම අදාළ වන්නේ මෙම නිරීක්ෂණ බව යි.

9.190 එවක දේශපාලන නායකයෝ දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීමේ ක්‍රියාවලිය සුමට ලෙස සහ හොඳ හිතින් නො හැසිරවූහ. එය දෙමළ කතා කරන සුළුතරයන්ට සහ අනර්ථයට පත් අනෙක් ප්‍රජාවන්ට අභිමානයෙන් යුතුව සැලකූ ක්‍රියාවලියක් නො වී ය. දෙමළ ප්‍රජාව තුළ පැතිර පවතින බලගතු දුක් ගැනවිලිමය හැඟීම මතු වී එන්නේ එම ක්‍රියාවලියේ වේදනාකාරී පරිශ්‍රමයෙන් සහ අසාධාරණකම්වලිනි.

9.191 අන්තර් ජනවාර්ගික සම්බන්ධතාවේ තීරණාත්මක භේදය පළමුව පැමිණියේ 1958 කැරලි සමග ය, අනතුරුව 1977 දී ය, කූට ප්‍රාප්තියට පත් වූයේ 1983 'කළු ජූලිය' නමින් දන්නා ලැබෙන දෙයින් සහ දෙමළ පුරවැසියන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට එවක ආණ්ඩුව පිළිකුල් සහගත ලෙස අසමත් වීමෙනි. සිංහල සහ දෙමළ ප්‍රජාවන් අතර සම්බන්ධතාව නරක අතට හැරවූ මෙම ප්‍රචණ්ඩ සංස්කෘතිය පිළිබඳව වඩා පූර්ණ අවබෝධයකින් තොරව දෙමළ ප්‍රජාවට අදාළ ගැටලු සහ ඔවුන්ගේ දුක් ගැනවිලි පූර්ණ ලෙස විසඳිය නොහැකි ය.

දෙමළ ප්‍රජාවේ දුක් ගැනවිලි සහ සියලු ප්‍රජාවන්ට පොදු අනෙක් පශ්චාත් යුද දුක් ගැනවිලි පිළිබඳ ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ 9.200 ඡේදයේ සිට ඉදිරියට විදහා දැක්වේ.

**මුස්ලිම් ප්‍රජාවේ දුක් ගැනවිලි**

9.192 උතුරෙහි ජීවත් වන මුස්ලිම්වරුන්ගේ ගැටලු ආරම්භ වූයේ 1990 ඔක්තෝබර් 30 වන දා එල්ටීටීඊය බලාත්කාරයෙන් මුස්ලිම් ප්‍රජාව නෙරපීමත් සමග ය. මෙම ප්‍රදේශවල දී (උතුර සහ නැගෙනහිර) තුවක්කු පෙන්වා තර්ජනය කොට එල්ටීටීඊය කළ ජනවාර්ගික ශුද්ධයේ ගොදුරු බවට පත් වූයේ මුස්ලිම්වරුන් ය.

9.193 උතුරු පළාතේ මුස්ලිම් ප්‍රජාවට තුවක්කු එල්ල කොට කළ සැලකීම, තමන් සිටින්නේ ආණ්ඩුවේ, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල, රාජ්‍ය නොවන සංවිධානවල සහ ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රමුඛතා ලැයිස්තුවේ පතුලෙහි බව විශ්වාස කිරීමට ඔවුන් යොමු කළේ ය.

9.194 අවතැන් වුණු මුස්ලිම්වරුන්ට උතුරු පළාතෙහි තම මුල් පදිංචි ස්ථාන වෙත ආපසු යාම සඳහා කල් තියා ආපසු පැමිණීමට ආණ්ඩුව පහසුකම් සැපයිය යුතු ය.

9.195 එල්ටීටීඊය විනාශ කළ හෝ හානි කළ මුස්ලිම් දේවස්ථාන, නිවාස සහ පාසල් යළි ඉදි කිරීමට සහාය වීම සඳහා ආණ්ඩුව ක්ෂණික පියවර ගත යුතු ය.

9.196 අභ්‍යන්තරව අවතැන් වූවන් සඳහා සුභසාධන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ජාතික සහ ජාත්‍යන්තර ආයතන, 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්' ලෙස හඳුන්වන්නන් සහ අනෙක් අභ්‍යන්තරව අවතැන් වූවන් අතර පවත්නා වෙනස්කම් කිරීම පිළිබඳ හැඟීම සිත තබා ගත යුතු ය. නව අභ්‍යන්තරව අවතැන් වූවන් කෙරෙහි යොමු වන ජාත්‍යන්තර සහ ජාතික අවධානය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් වෙනුවෙන් ක්‍රියාවට නැංවෙන නිසැකව අවශ්‍ය සහායක සහ වැඩ සටහන්මය මුල පිරීම්, ඇතැම් විට 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ට' දැනෙන වෙනස්කම් කිරීම පිළිබඳ හැඟීම තියුණු කරනු ඇත. අසමානතාව සම්බන්ධයෙන් 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්' තුළ පවතින හැඟීම්වල යම් වැදගත්කමක් තිබෙන බව කොමිසමේ විශ්වාසය යි. සමානතාව සහ වෙනස්කම් නොකිරීම යනු ශ්‍රී ලංකාව ද එකඟව තිබෙන එක්සත් ජාතීන්ගේ සියලු මානව හිමිකම් මෙවලම්වල ප්‍රමුඛ මූලධර්ම වේ. මෙලෙස, 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ' තත්ත්වයට විසඳුම් සෙවීමේ දී, තම සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය ඇතිව සමානතාවේ සහ වෙනස්කම් නොකිරීමේ මූලධර්ම සැලකිල්ලට ගැනීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ වගකීමකි.

**පෙර පැවති ගැටුම් ප්‍රදේශවලට ආසන්නව පිහිටි ගම්මානවල ජීවත් වන සිංහලයන්ගේ දුක් ගැනවිලි**

9.197 මෙම ප්‍රදේශවල ජනයාගේ හැඟීම වූයේ ආණ්ඩුව මෙම ගම්මානවල ජීවත් වුණු සහ එල්ටීටීඊය ඇති කළ භීෂණයෙන් දිවි ගළවා ගත් සිවිල් වැසියන් නො සලකා හැරීමට යොමු වුණු බව යි. මෙම ගම්මානවල ජනයා දකුණෙහි පිහිටි ආරක්ෂිත ප්‍රදේශවලට සංක්‍රමණය නො වී තම ජීවිතවලට එල්ල වුණු භයංකර තර්ජන යටතේ අඛණ්ඩව දිවි ගෙවා තිබිණ. මෙම ගම්මානවල ජීවත් වන ජනයා, ආරක්ෂාව පිළිබඳ දරුණු අවදානම්වලට හැරුණු විට, අධ්‍යාපනය, ජීවනෝපායන් කඩාකප්පල් වීම සහ වැනසී යාම, සෞඛ්‍ය රැකවරණ සහ ප්‍රවාහන පහසුකම් හිඟය සම්බන්ධ දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා ඇත. සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳීම සඳහා සමානව සැලකීමේ අවශ්‍යතාව මෙම ගම්වාසීහු ප්‍රකාශයට පත් කළහ.

9.198 මෙම ප්‍රදේශවල වෙසෙන ජනයාගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සෙවීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීමට ආණ්ඩුව පූර්ණ අධ්‍යයනයක් ආරම්භ කළ යුතු ය.

9.199 ආණ්ඩුව ගම්මානවලට එක සමාන සම්පත් වෙන් කිරීමක් සහ සංවර්ධනයක් සහතික කළ යුතු බව කොමිසමේ අදහස යි. එසේ නොවුව හොත්, විශේෂයෙන් ම නැගෙනහිර පළාතෙහි විවිධ ජනවාර්ගික ප්‍රජාවන් ආධිපත්‍යය දරන ගම්මාන රැසක් තුළ එය අපේක්ෂා භංගත්වයකට සහ වාර්ගික ආතතියකට තුඩු දිය හැකි ය.

**ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ ජනයාගේ දුක් ගැනවිලි**

9.200 තමන් ජීවත් වන ප්‍රදේශවල අධ්‍යාපනික සහ සෞඛ්‍ය පහසුකම් හිඟකම පිළිබඳව උත්සුකතා පළ කරමින් සහ වතුවල පැතිර පවතින දුෂ්කර ජීවන තත්ත්වයන් පිළිබඳව ද කොමිසමේ අවධානය යොමු

කරවමින්, ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ ජනයා කොමිසම වෙත ඉදිරිපත් කළ ප්‍රකාශ පැවතිණ. මෙම උත්සුකතාවන් අගය කරන කොමිසම, සෞඛ්‍ය සහ අධ්‍යාපනික පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ද, වතු ප්‍රදේශ තුළ වඩා යහපත් ජීවන තත්ත්වයන් සම්පාදනය කිරීමට ද අවශ්‍ය පියවර ගත යුතු යැයි ආණ්ඩුවට නිර්දේශ කර සිටී.

9.201 වඩා පුළුල් පශ්චාත් ගැටුම් සංවර්ධන න්‍යාය පත්‍රයක් සහ ප්‍රතිසන්ධාන වැඩ සටහන් වර්ධනය කර ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ ජනයාගේ ඉතා වැදගත් අවශ්‍යතාවන් සැලකිල්ලට ගත යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී.

**දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීම සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ගැටලු**

## නීතියේ රජැයීම ක්‍රියාත්මක කිරීමට අසමත් වීම

.

9.202 කොමිසම හමුවේ ප්‍රකාශ ඉදිරිපත් කළ බොහෝ පුද්ගලයන් කියා සිටියේ, දේශපාලනික අනුග්‍රහය ලබන පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් අපරාධ සිදු කළ නමුත්, නීතිය බලාත්මක කරන බලාධිකාරයන්ට එල්ල වුණු දේශපාලන පීඩනය නිසා නීතියේ දිගු හස්තය ඔවුන් වෙත ළඟා නොවුණු බව යි. ස්වාධීන අධිකරණ පද්ධතියක් සහ විනිවිද පෙනෙන නීතිමය ක්‍රියාවලියක් සමගින් නීතියේ රජැයීමට දැඩි ලෙස පක්ෂපාතීව සිටීම යනු, කවර හෝ අර්ථාන්විත ප්‍රතිසන්ධානයක් පැවතීමට නම්, එහි හරය විය යුතු සාමය සහ ස්ථාවරත්වය උදෙසා අත්‍යවශ්‍ය දෙයකි. ප්‍රජාවන් අතර ආතතීන් නිර්මාණය කළ හේතුන් වූයේ, අර්ථාන්විත බලය බෙදා හැරීමක් නැතිකම සමග බැඳුණු යහපාලනය නැතිකම සහ නීතියේ රජැයීම නොපිළිපැදීම යි.

9.203 කොමිසමේ සාකච්ඡාව අතරතුර දී පැන නැගුණු ගැටලු අතර පහත සඳහන් ඒවා විය:

අ. දේශපාලන සම්බන්ධකම් සහිත පුද්ගලයන් අපරාධ කළ විට, අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සහ අපරාධකරුවන්ගෙන් නිදහසට කරුණු විමසා සිටීමට නීතිය බලාත්මක කරන බලාධිකාරයන් අසමත් වීම.

ආ. ගැටුම අවසන්ව තිබිය දීත්, තව මත් නීතිය සහ සාමය පිළිබඳව සැලකිය යුතු ගැටලු පවතී. සන්නද්ධ කණ්ඩායම් කරන බලෙන් මුදල් ලබා ගැනීමේ ක්‍රියාවන් ද පැහැර ගෙන යාම්, අතුරුදන් කිරීම්, කොල්ල කෑම් යනාදි වෙනත් අපරාධ ක්‍රියාවන් ද අඛණ්ඩව සිදු වන නිසා උතුරෙහි සහ නැගෙනහිරෙහි ජීවත් වන ජනයාගේ සිත් තුළ තැති ගැනීමක් පවතී. දේශපාලනඥයන් ගණනාවක් නීතිය නො තකා ක්‍රියා කරන බව කියනු ලැබිණ. සමාජය තුළ සිටින අපරාධ කණ්ඩායම් සමග ඔවුන්ට පවතින අන්තර් ක්‍රියාවන් නිසා, ඔවුහු පොලීසියට අනිසි බලපෑම් කර පොලීසිය දේශපාලනීකරණය කොට අධිකරණ මාර්ගය දුර්වල කරති.

ඇ. ගිනි අවි පාවිච්චිය සමග බැඳුණු දේශපාලන ප්‍රචණ්ඩත්වය මෙම රටේ නීතිගරුක පුරවැසියන් අතර බොහෝ උත්සුකතාවන් පැන නංවා ඇත. දේශපාලන ප්‍රචණ්ඩත්වය වර්ධනය වීම සහ දේශපාලනඥයන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් නීති විරෝධීව ගිනි අවි ළඟ තබා ගැනීම සහ පාවිච්චි කිරීම පිළිබඳව කොමිසම නිරීක්ෂණය කරන්නේ උත්සුකතාවෙන් යුතුව ය.

9.204 අනවසර ආයුධ ළඟ තබා ගෙන සිටින පුද්ගලයන් නිරායුධ කිරීමට මෙන් ම එවැනි වැරදිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ද ආණ්ඩුව ක්ෂණික පියවර ගත යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී.

9.205 මෙම වාර්තාව ලියන සමයේ දී, මෑත දී නිම වුණු පළාත් පාලන මැතිවරණවලින් පසුව මරණ සහ තුවාලකරුවන් ගණනාවක් ඇති කරමින් එක ම දේශපාලන පක්ෂයේ දේශපාලනඥයන් දෙදෙනෙකු සම්බන්ධ බරපතළ වෙඩි තැබීමේ සිද්ධියක් පිළිබඳව කොමිසමට තොරතුරු ලැබිණ. දේශපාලනඥයන් අතර අන්‍යෝන්‍ය උපකාරයක් නොමැතිකම එතරම් ම බේදජනක තත්ත්වයකට පත්ව තිබීම සහ ගැටලු විසඳා ගැනීම සඳහා එතරම් ම දරුණු ප්‍රචණ්ඩත්වයක් යොදා ගැනීම, ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ මේ තීරණාත්මක අවධියේ දී මහජන නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටින දෙයට ආදර්ශයක් නො වේ.

9.206 නියෝජිතයන් ගණනාවක් අවධානය යොමු කරවූ පහත සඳහන් සිදුවීම් විශේෂයෙන් ඉස්මතු කර දැක්වීමට කොමිසම කැමැති ය.

9.207 පැහැර ගෙන යාම, බලෙන් මුදල් ලබා ගැනීම, කොල්ල කෑම යනාදි අපරාධ කිහිපයක්, නැගෙනහිර පළාතේ දී භාරතී නමැත්තෙකු කර ඇති බවට ඉදිරිපත් වුණු චෝදනා පැවතිණ. කොමිසම මෙම කරුණ අදාළ බලාධිකාරයන්ගේ අවධානයට යොමු කළේ ය. වැරදි කළැයි කියනු ලබන තැනැත්තාට එරෙහිව කිසි ම අර්ථාන්විත පියවරක් ගෙන නොතිබීම ගැන කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. පොලිස් නිලධාරීන් හයසියයකට ආසන්න සංඛ්‍යාවක් සමග පැහැර ගෙන යාමකට ගොදුරු වුණු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් සහ ප්‍රකාශ ඉදිරිපත් කරන්නන් දෙදෙනෙක්, ආයුධ පසෙක තබා එල්ටීටීඊයට යටත් වීමට අණ කෙරුණු පොලිස් නිලධාරීන් මරා දැමීම සම්බන්ධයෙන් එවක නැගෙනහිර පළාතේ එල්ටීටීඊ නායක කරුණා සහ තවත් එල්ටීටීඊ සාමාජිකයන් කිහිප දෙනෙකු සම්බන්ධ බවට චෝදනා කළහ.

ප්‍රකාශ ඉදිරිපත් කරන්නන් කළ චෝදනා අනුව, එරෙහිව එල්ල කර ඇති චෝදනා පිළිබඳව කොමිසම මුරලිදරන් නොහොත් කරුණා මහතාගෙන් ප්‍රශ්න කළේ ය. ඔහු මෙම ඝාතන සම්බන්ධයෙන් කෙරෙන චෝදනා ප්‍රතික්ෂේප කළේ ය.

කෙසේ වුව ද, පොලිස් නිලධාරීන් හයසියයක් ඝාතනය කිරීම සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිදු පරීක්ෂණයක් පවත්වා නැති බව මෙම කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. අපරාධයේ ස්වභාවය සහ ප්‍රතිසන්ධානය කෙරෙහි එය කරන බලපෑම නිසා, මෙම කාරණය පූර්ණ පරීක්ෂණයක අවශ්‍යතාව මතු කරන බව කොමිසමේ අදහස යි.

9.208 ප්‍රකාශ ඉදිරිපත් කරන්නෝ කිහිප දෙනෙක් ඊළම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (EPDP) සාමාජිකයන් කළ බලෙන් මුදල් ලබා ගැනීමේ ක්‍රියාවන් පිළිබඳව පැමිණිලි කළහ. ඊපීඩීපීයට එරෙහිව පැමිණිලි කිහිපයක් පවතින නිසා මෙම චෝදනා සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතු බව කොමිසමේ අදහස යි. පරීක්ෂණයක් නොමැතිකම දඬුවම් නො ලැබ ගැළවී යා හැකි ය යන හැඟීමක් ඇති කරනු ඇත.

9.209 බොහෝ ප්‍රකාශ ඉදිරිපත් කරන්නෝ මේජර් සීලන් නමැති පුද්ගලයෙකු නායකත්වය දෙන කල්ලියක නීති විරෝධී ක්‍රියාවන් කෙරෙහි කොමිසමේ අවධානය යොමු කරවූහ. පැහැර ගෙන යාම, බලෙන් මුදල් ලබා ගැනීම සහ කොල්ල කෑම පිළිබඳ අපරාධ හා සම්බන්ධ මෙම ක්‍රියාවන් කරනු ලබන්නේ ආරක්ෂක හමුදා පහසුකම් මුවාවක් ලෙස යොදා ගනිමිනි. කොමිසම මෙය ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අවධානයට ලක් කරවූයේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස, මේජර් සීලන්ගේ හවුල්කාරයෙක් අත් අඩංගුවට ගැනිණ. කෙසේ වුව ද, චෝදනාවට ලක්ව සිටින ප්‍රධාන අපරාධකරුවා තව මත් නිදැල්ලේ පසු වෙයි.

.

9.210 මේ සම්බන්ධයෙන් ගත් කල, නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්වලට අදාළ තම අන්තර්වාර නිර්දේශ සියල්ල පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම කොමිසම යළි යළිත් ප්‍රකාශ කර සිටී.

9.211 තම අන්තර්වාර නිර්දේශ තව මත් පූර්ණ ලෙස ක්‍රියාත්මක කර නොතිබීම ගැන කොමිසම කනගාටුව පළ කර සිටී.

9.212 පළාත්වල සේවය කරන පොලිස් නිලධාරීන්ට පරීක්ෂණ සම්බන්ධ නීතිමය ප්‍රවීණතාව ලබා ගැනීමේ සහ නීතිමය පියවර ගැනීම සිදු කරන ආකාරය දැක බලා ගැනීමේ අවස්ථාවක් නොමැති බව කොමිසම සඳහන් කර සිටී. මෙම තත්ත්වය තුළ, අපරාධ පරීක්ෂණ, නීතිමය පියවර ගැනීම සහ අපරාධ යුක්ති පද්ධතිය ආශ්‍රිත වෙනත් කාරණා සම්බන්ධයෙන් මග පෙන්වීම සහ උපදෙස් දීම සඳහා පළාත්වල නීතිපති දෙපාර්තමේන්තුවේ ඒකක පිහිටුවිය යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී.

9.213 දේශපාලන සම්බන්ධකම් නො තකා සියලු චෝදනා පරීක්ෂාවට ලක් කළ යුතු යැයි ද, වැරදි කළවුන්ට එරෙහිව නීතිමය පියවර ගෙන දඬුවම් පැමිණවිය යුතු යැයි ද කොමිසම අවධාරණය කර සිටී. එවිට, අධිකරණ පරිපාලනය කෙරෙහි මහජනයා අතර විශ්වාසය දැල්විය හැකි වනු ඇත.

9.214 පොලිස් දෙපාර්තමේන්තුව යනු නීතිය සහ සාමය පවත්වා ගෙන යාම පැවරුණු සිවිල් ආයතනයකි. එම නිසා, රාජ්‍යයේ ආරක්ෂාව පිළිබඳ වගකීම දරන සන්නද්ධ හමුදා සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සහ පොලිස් දෙපාර්තමේන්තුව අතර පවතින සම්බන්ධය බිඳ දැමීම අභිමත ය.

9.215 ස්වාධීන ස්ථිර පොලිස් කොමිසමක් යනු පොලීසිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සහ මහජන විශ්වාසය ඇති කිරීම සහතික කිරීම සඳහා පූර්වාවශ්‍යතාවක් බව කොමිසමේ අදහස යි. පොලිස් සේවයේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සඳහා සහ පොලිස් නිලධාරීන් ස්වාධීනව ක්‍රියා කරන බව සහ ඉහළ මට්ටමේ වෘත්තීය කල්ක්‍රියාවක් පවත්වා ගෙන යන බව සහතික කිරීම සඳහා එවැනි කොමිසමකට බලය පැවරිය යුතු ය.

## පාලනය පිළිබඳ ගැටලු

9.216 පරිපාලන පද්ධතියෙහි පවතින ඌනතාවලින් උපත ලබන ඇතැම් සුළුතර දුක් ගැනවිලි සහ යහපාලනයක් නොමැතිකම, ජනවර්ගය නො තකා සියලු පුරවැසියන්ට බලපාන බවට ඉදිරිපත් කළ ප්‍රකාශ කොමිසමට අසන්නට ලැබිණ. මෙම ඌනතා සියලු පාර්ශ්වකරුවන්ගේ සාමූහික ක්‍රියාවක අවශ්‍යතාව මතු කරයි. කෙසේ වුව ද, විශේෂයෙන් ම සුළුතරයන්ට අවාසි වන ආකාරයෙන් පද්ධතිය ක්‍රියාත්මක අවස්ථාවල දී නිශ්චිත පියවරයන් ගත යුතු වේ.

9.217 රටේ දේශපාලන සංස්කෘතිය, තමන්ට හිමි බොහෝ සේවාවන් සහ විනෝදායන පහසුකම් ලබා ගැනීමේ දී දේශපාලනඥයන් මත රඳා පවතින තත්ත්වයක් දක්වා පොදු මහජනතාව බෙලහීන සහ අසරණ තත්ත්වයට පත් කර ඇත.

***පුරවැසි දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීම සඳහා විශේෂ ආයතනයක්***

9.218 වර්ෂ 1994 අංක 26 දරණ පණතින් හඳුන්වා දුන් සංශෝධනය මහජන පෙත්සම් ක්‍රියා පටිපාටිය වැඩි දියුණු කිරීමට උත්සාහ කළ ද, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලය හා සම්බන්ධ වත්මන් නීතිය රාජ්‍ය ක්‍රියාවෙන් පැන නගින දුක් ගැනවිලිවලට ඵලදායීව විසඳුම් සෙවීම සඳහා ප්‍රමාණවත් නො වේ. එම නිසා, රටේ පාලන කටයුතුවල නිරතව සිටින රජයේ නිලධාරීන් සහ වෙනත් පුද්ගලයන් බලය අනිසි ලෙස පාවිච්චි කිරීම නිසා පැන නගින සියලු පුරවැසියන්ගේ, විශේෂයෙන් ම සුළුතර ප්‍රජාවන්ගේ දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීම සඳහා ආණ්ඩුව ස්වාධීන ආයතනයක් පිහිටුවිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. මෙම යන්ත්‍රණයේ කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දෙනු පිණිස ඊට බලගතු පරීක්ෂණාත්මක අංශයක් සම්පාදනය කර දිය යුතු ය.

9.219 කවර හෝ විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් නිසා, විශේෂයෙන් ම ජනවාර්ගිකත්වය හෝ ආගම පදනම් කර ගෙන පැන නැගි දුක් ගැනවිල්ලක් සහිත මෙම රටේ ඕනෑ ම පුරවැසියෙකුට ස්වාධීන ආයතනය හමුවේ සහන ඉල්ලා සිටීමට අයිතිය තිබිය යුතු ය.

9.220 මෙම ආයතනයේ තීන්දු ක්‍රියාවට නැංවීම සඳහා වන විධිවිධාන ද පැවතිය යුතු ය. තව ද, යෝජිත ආයතනය බලදායී කරනු පිණිස, බලය අනිසි ලෙස පාවිච්චි කර තිබෙන පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිය දණ්ඩන සම්පාදනය කළ යුතු ය.

9.221 අන්තර් ජනවාර්ගික සහ අන්තර් ආගමික සුසංවාදය ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමේ දී, විශේෂයෙන් ම ප්‍රජා මූල මට්ටමේ යෙදවුම් සැපයීමෙන්, ඇතැම් විට දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමින් පිහිටුවෙනු ඇති අන්තර් ආගමික ප්‍රතිසන්ධාන සහ සාම කමිටුවලට විශේෂ ආයතනයේ කාර්යයන්ට සහාය වන පෝෂක යන්ත්‍රණයක් ලෙස ක්‍රියා කළ හැකි ය.

***වෙනත් වැඩ පිළිවෙළවල්***

.

9.222 සියලු පුරවැසියන්ගේ, විශේෂයෙන් ම සුළුතර ප්‍රජාවන්ගේ උත්සුකතාවන් සහ කාංසාවන් පිළිබඳව සංවේදී තීරණායකවලින්, නියමයන්ගෙන් සහ කල්ක්‍රියා සංග්‍රහයන්ගෙන් රාජ්‍ය සේවයේ පද්ධතිවලට සහ ක්‍රියා

පටිපාටිවලට මග පෙන්වනු ලැබිය යුතු ය. දුක් ගැනවිල්ලක් පිළිබඳ හැඟීමකට උපත දිය හැකි වැරදි අර්ථ දැක්වීම් ඇති වීම වැළැක්වීම සඳහා ආණ්ඩුවේ තීරණවල තර්කනය සම්බන්ධ පූර්ණ විනිවිද භාවය සහ තොරතුරු මහජනයාට ලබා ගත හැකි විය යුතු ය. මෙම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා පවත්නා ක්‍රියා පටිපාටි සහ පිළිවෙත් සමාලෝචනයට ලක් කළ යුතු ය.

9.223 සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුත්තේ ප්‍රදේශයේ ජනයාගේ උපදෙස් විමසා සහ ඔවුන්ගේ සහභාගිත්වය ඇතිව බව ආණ්ඩුව සහතික කළ යුතු ය. පරිපාලනයෙහි ලා එවන් විනිවිද භාවයෙන් යුතු පිවිසුමක් යොදා ගැනීමෙන්, සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තමන්ට අයිතියක් තිබෙන්නේ යැයි මහජනයාට හැඟෙන තත්ත්වයක් නිර්මාණය වනු මෙන් ම, ජාතිය ගොඩ නැඟීමෙහි ලා තමන් සහභාගි වන්නේ ය යන හැඟීමක් ඔවුන්ට ලබා දෙනු ඇත.

9.224 රාජ්‍ය සේවයේ කාර්ය ආචාර ධර්ම වැඩි දියුණු කිරීම සඳහා වන පුහුණු වැඩ සටහන් හරහා ද ඇතුළුව ආකල්පමය වෙනස්කම් ඇති කිරීම සඳහා විශේෂ වැඩ සටහනක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

.

9.225 කොමිසමේ අවධානයට ලක් කළ කනස්සල්ල දනවන සංසිද්ධියක් වූයේ, රාජ්‍ය නිලධාරීන් පත් කිරීම්, ස්ථාන මාරු කිරීම් යනාදිය සම්බන්ධයෙන් පාලක පක්ෂයේ දේශපාලනඥයන් ඉහළ මට්ටමකින් ඇඟිලි ගැසීම යි. මෙය වනාහි යහපාලනයේ පූර්ණ ප්‍රතිවිරුද්ධය යි.

9.226 රාජ්‍ය සේවයේ දී දේශපාලනික ඇඟිලි ගැසීමක් නොපවතින බව සහ රාජ්‍ය සේවයෙහි බඳවා ගැනීම් සහ උසස් වීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සමානතා විධිවිධානවලට අනුකූල බව සහතික කිරීම සඳහා අප්‍රමාදීව ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් පිහිටුවිය යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී.

9.227 මහජනතාවගේ එදිනෙදා ජීවිතයට අදාළ කාරණා සම්බන්ධයෙන්, විශේෂයෙන් ම කෘෂිකර්මය, ධීවර බිම් යනාදි ආර්ථික ක්‍රියාකාරකම්වලට අදාළ කාරණා සම්බන්ධයෙන්, උතුරු පළාත සිවිල් පරිපාලනයට යළි එළඹීම වැදගත් වේ. මහජනතාවට සාමාන්‍ය සිවිල් ජීවිතයට ආපසු යාමට සහ සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකි වනු පිණිස, මිලිටරියේ පෙනී සිටීම ක්‍රමයෙන් අඩු කළ යුතු ය.

9.228 නීති පද්ධතිය අධිකරණමය සමාලෝචනයකට ලක් කිරීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධාන නොමැතිකම සම්බන්ධයෙන් ප්‍රකාශ ඉදිරිපත් වුණු බව කොමිසම සඳහන් කර සිටී. ඊනැ ම යෝජිත විධිවිධානයක ව්‍යවස්ථානුකූල භාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ක්‍රියාත්මකව අදහස් විමසීම සඳහා මහජන සාමාජිකයන්ට සහ වෙනත් සංවිධානවලට ප්‍රමාණවත් නීතිමය විධිවිධාන පැවතිය යුතු ය. යෝජිත නීතියක, විශේෂයෙන් ම හදිසි පණත්වල ව්‍යවස්ථානුකූල භාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අදහස් විමසීම සඳහා සපයා ඇති කාල රාමුව බෙහෙවින් අප්‍රමාණවත් ය. විධායක ජනාධිපතිවරයා නියම කර ඇති පරිදි, හදිසි පණත් සම්බන්ධයෙන් පැය 24ක කාලයක් ඇතුළත හෝ දින තුනක් පසු නොවන දිනයක දී තීන්දුවක් දිය යුතු යැයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිනු ලැබේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(1) වගන්තිය). යෝජිත නීතියක් සම්බන්ධයෙන් මහජන මැදිහත් වීම යනු ජීවමාන ප්‍රජාතන්ත්‍රවාදයේ නො වෙන් කළ හැකි කොටසකි. එම නිසා, යෝජිත නීතිවලට අභියෝග කිරීම සඳහා ප්‍රමාණවත් කාල රාමුවක් සම්පාදනය කිරීමට, සුදුසු ව්‍යවස්ථාමය සංශෝධනයක් පිළිබඳව ඒකමතිකත්වයකට එළඹීම සඳහා ආණ්ඩුව සහ විපක්ෂය සියලු පරිශ්‍රමයන් දැරිය යුතු යැයි කොමිසම නිර්දෙශ කර සිටී.

## බලය බෙදා හැරීමේ අවශ්‍යතාව

9.229 කොමිසම හමුවේ පෙනී සිටි බොහෝ පුද්ගලයන් පැහැදිලි ලෙස ප්‍රකාශ කර සිටියේ, බලය බෙදා හැරීමට පහසුකම් සපයන දේශපාලනික ඒකමතික භාවයකට එළඹීම, එවන් ඒකමතික භාවයක් මුදුන් පමුණුවා ගැනීම සඳහා දිගු කලක් තිස්සේ ප්‍රධාන බාධකයක්ව පැවති එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් කිරීමෙන් පසුව ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා තීරණාත්මකව වැදගත් වනු ඇති බව යි.

9.230 පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ දී තිරසර සාමය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා රාමුවක් ඇති කිරීම සඳහා අනුගමනය කළ යුතු දේශපාලන ක්‍රියාවලියකට ආණ්ඩුව නායකත්වය සම්පාදනය කිරීම ඉතා වැදගත් වේ. මෙම පරිශ්‍රමයේ දී, එල්ටීටීඊයේ සාමාජිකයන්ව සිට ඇති අය ද ඇතුළු සියලු ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සහතික කළ යුතු ය. මෙම ප්‍රතිඵලය අත් කර ගැනීම සඳහා, බලය බෙදා හැරීම පදනම් කර ගත් දේශපාලන එකඟතාවකින් ජනවාර්ගික ගැටලුවට මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවලට තර්ජනය කරන

අනෙක් බරපතළ ගැටලුවලට ද විසඳුම් සෙවිය යුතු ය. මෙම දේශපාලන ක්‍රියාවලිය කුට ප්‍රාප්ත විය යුත්තේ, අත්‍යවශ්‍ය සමාජ-ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථාවන් සම්පාදනය කරන ව්‍යවස්ථාමය පදනමක් සහ යාන්ත්‍රණයක් තුළ ය.

9.231 බලය බෙදා හැරීම අනිවාර්යයෙන් ම මහජන කේන්ද්‍රීය ස්වභාවයක් ගත යුතු අතර, එහි දී පහත දැක්වෙන තැකීම් සිත දරා ගත යුතු ය -

අ. බලය බෙදා හැරීම අනිවාර්යයෙන් ම වඩා පුළුල් සුසංවාදයක් සහ එකමුතුකමක් ප්‍රවර්ධනය කළ යුතු අතර, රටේ මහජනතාව අතර විසංවාදය සහ අසමගිය ප්‍රවර්ධනය නො කළ යුතු ය. සාරවත් විවිධත්වය ආරක්ෂා කරන සහ අගය කරන අතරතුර කවර බලය බෙදා හැරීමක වුව ප්‍රධාන අරමුණ විය යුත්තේ, මෙම 'ඒකත්වය' සහ පොදු අනන්‍යතාවක් ප්‍රවර්ධනය කිරීම යි.

ආ. සෑම මට්ටමක දී ම, විශේෂයෙන් ම ආණ්ඩුවේ සියලු මට්ටම්වල දී සියලු ප්‍රජාවන්ට අයත් ජනයාට බලය පැවරෙන බව සහතික කිරීමට අවධානය යොමු විය යුතු ය. බලය බෙදා හැරීම කවර හෝ ජනවාර්ගික ප්‍රජාවකට වරප්‍රසාදයක් හෝ අවාසියක් නො විය යුතු අතර, මේ අර්ථයෙන් ගත් විට, රට තුළ සිටින කවර හෝ ජනවාර්ගික ප්‍රජාවකට අයත් ජනයා එය වෙනස්කම් කරන එකක් ලෙස හෝ වෙනස්කම් කරන එකක් ලෙස පෙනේ යැයි නො සැලකිය යුතු වේ.

.

ඇ. මහජනයා ප්‍රජාතන්ත්‍රවාදයෙන් බල ගැන්වීම සිදු විය යුත්තේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂිත විධිවිධානවලට සහ රට ස්වේච්ඡාවෙන් ඉටු කිරීමට භාර ගෙන ඇති ගිවිසුම්ගත බැඳීම්වලට අනුව, ඡන්දයෙන් පත් වුණු ආණ්ඩුවේ මූලික බැඳීමක් වන මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ පුළුල් රාමුව තුළ ය.

ඈ. බලය බෙදා හැරීම පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ දී කාරණා දෙකක් කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමු විය යුතු ය. පළමුව, ප්‍රජා මූල මට්ටමේ දී වඩා පුළුල් මහජන සහභාගිත්වයක් සිදු වන බව සහතික කිරීම සඳහා පළාත් පාලන ආයතන බල ගැන්වීම යි. දෙවනුව, මහජන අවශ්‍යතාවන්ට විසඳුම් සපයන සුදුසු බලය බෙදා හැරීමේ පද්ධතියක් සැලසුම් කර ගැනීමේ දී පළාත් සභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය තුළ පවතින අඩුපාඩුකම්වලින් උගත් පාඩම් සැලකිල්ලට ගැනීම ද අවශ්‍යයෙන් ම කළ යුත්තකි. ඒ අතර ම එය, ශ්‍රී ලංකාවේ සාරවත් විවිධත්වය පෝෂණය කරන ගමන් එහි භෞමික අඛණ්ඩතාව සහ ඒකීයත්වය ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන සම්පාදනය කළ යුතු ය.

9.232 සැලකිල්ලට ගත හැකි අතිරේක යාන්ත්‍රණයක් නම් පළාත් නියෝජිතයන්ගෙන් සමන්විත උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පිහිටුවීමට ඇති හැකියාව යි. ව්‍යවස්ථාදායක තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී, පළාත්වලට විශේෂ අදාළත්වයක් සහිත ගැටලුවලට බලපෑ හැකි ව්‍යවස්ථාදායක පියවරයන් පරීක්ෂාවට ලක් කිරීම ඇතුළුව තමන්ට ද ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරන්නට ඇතැයි, පළාත්වල දේශපාලන නායකත්වය අතර සහ මහජනතාව අතර විශ්වාසය පිළිබඳ හැඟීමක් ජනනය වීමට එවන් යාන්ත්‍රණයක් හේතු විය හැකි ය.

9.233 බලය බෙදාහදා ගැනීම සහ ආණ්ඩුව තුළ සහභාගි වීම පිළිබඳ සැබෑ ගැටලුව වන්නේ මහජනයා බල ගැන්වීම සහ දේශපාලන නායකයන් මහජනයාට වග වන තත්ත්වයට පත් කිරීම බව සියලු පක්ෂ හඳුනා ගත යුතු ය. මෙය සමස්ත ශ්‍රී ලංකාවට ම අදාළ වන අතර, සිංහල, දෙමළ, මුස්ලිම් සහ අන් සියලු ප්‍රජාවන්ගේ පුරවැසි අවශ්‍යතා ඇතුළත් කර ගන්නකි. ඒකමතික බලය බෙදා හැරීමේ රාමුවක් සමගින් මෙම අවශ්‍යතා සපුරන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, ඒ තුළ නිසගයෙන් ම පිහිටි ගුණාංග සහ ආයතන නිසා, සුළුතර ප්‍රජාවන්ගේ දුක් ගැනවිලිවලට ද විසඳුම් සපයනු ඇත.

9.234 සියලු පක්ෂ කැප විය යුත්තේ අන්‍යෝන්‍ය සාකච්ඡාවෙන් අභ්‍යන්තරව විසඳුම් සෙවීමට ය. ජනවාර්ගික ගැටලුවේ අනවශ්‍ය ජාත්‍යන්තරීකරණය ද, ඩයස්පෝරාව යොදන බාහිර පීඩනය සහ දේශපාලන එකඟතාවක් සඳහා කෙරෙන සාකච්ඡාවලට ඉන් සිදු වන බලපෑම ද දෙමළ නායකයන් සැලකිල්ලට ගත යුතු ය. බාහිර තර්ජනය සහ මැදිහත් වීම පිළිබඳ හැඟීම, පිළිගත හැකි විසඳුමක් දෙසට සිදු වන ප්‍රගතියට බරපතළ ලෙස බාධා කළ හැකි, අනාරක්ෂිතතාව පිළිබඳ හැඟීමක් නිර්මාණය කළ හැකි ය.

9.235 බලය බෙදා හැරීමේ හෝ බලය බෙදාහදා ගැනීමේ කවර යන්ත්‍රණයක් වුව මුදුන් පමුණුවා ගත යුත්තේ ස්වෛරී, දේශපාලනිකව ස්වාධීන සහ බහුජනවාර්ගික ශ්‍රී ලාංකික රාජ්‍යයක පුළුල් රාමුව තුළ ය යන්න අවශ්‍යයෙන් ම සිදු විය යුත්තක් බව කොමිසමේ අදහස යි. ප්‍රත්‍යන්ත ප්‍රදේශවලට අර්ථාන්විත බලතල බෙදා හැරීම අත්‍යවශ්‍ය නමුත්, රාජ්‍යයේ හර වගකීම් අඩංගු වන සහ බෙදා හැරිය නොහැකි, මධ්‍යම ආණ්ඩුව තබා ගත යුතු සහ පාවිච්චි කළ යුතු බලතල ද පවතී. බලය බෙදාහදා ගැනීමේ කවර විධිවිධානයක වුව, බෙදුම්වාදී ප්‍රවණතාවන් කෙරෙහි ක්‍රියාත්මක අවධානයක් යොමු කරන සහ ඒවා අධෛර්යමත් කරන, රාජ්‍යයේ ස්වෛරී භාවය සහ ඒකීයත්වය ආරක්ෂා කරන අභ්‍යන්තර යන්ත්‍රණයන් තිබෙන බව සහතික කිරීම ද වැදගත් ය.

9.236 කවර කල් පවත්නා සහ තිරසර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක වුව සාර්ථකත්වය සහතික කරනු පිණිස, බලය බෙදා හැරීමේ ගැටලුව සම්බන්ධයෙන් දෘශ්‍යමාන ප්‍රගතියක් ඇති කිරීමේ තීරණාත්මක වැදගත්කම අවධාරණය කිරීමට කොමිසම කැමැති ය. එම නිසා - විශේෂයෙන් ම ප්‍රජා මූල මට්ටමේ දී ප්‍රත්‍යන්ත ප්‍රදේශවලට හැකි උපරිම බලය බෙදා හැරීම සඳහා මෙන් ම මධ්‍යම ආණ්ඩුවේ දී බලය බෙදාහදා ගැනීම සඳහා - දැනට පවත්නා දෑ පදනම් කර ගෙන, බලය බෙදා හැරීම පිළිබඳව ඒකමතික භාවයක් ඇති කර ගැනීම සඳහා සද්භාවයෙන් යුතු පරිශ්‍රමයකට මුල පිරීමට වත්මන් අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. මෙම ඒකමතික භාවය, තමන්ට බලපාන පාලන තීන්දු ගැනීමේ දී මහජනයාට සහභාගි වීමට හැකියාව ලැබෙන්නා වූත්, කාර්යක්ෂම, වියදම් අඩු සහ විනිවිද පෙනෙන පාලනයට බාධා කරන දේශපාලනික, නිලධාරිමය සහ වෙනත් ආයතනික ව්‍යුහයන් අධික මිලක් වැය කරමින් සහ අනවශ්‍ය ආකාරයෙන් ද්විගුණනය නොකෙරෙන්නා වූත් එකක් විය යුතු ය.

.

9.237 මෙම ප්‍රතිඵලය මුදුන් පමුණුවා ගැනීම සඳහා, අපේක්ෂිත සංවාද ක්‍රියාවලියේ ස්වරූපය සහ අන්තර්ගතය පිළිබඳව ආණ්ඩුවේ සිතා බැලීම් අඩංගු යෝජනාවක් පදනම් කර ගෙන, සියලු පක්ෂ සමග, විශේෂයෙන් ම සුලුතර ප්‍රජාවන් නියෝජනය කරන පක්ෂ සමග, ආණ්ඩුව බරපතළ සහ ව්‍යුහාත්මක සංවාදයකට මුල පිරිය යුතු ය. එම සංවාදය ඉහළ දේශපාලන තලයක සහ ප්‍රමාණවත් ශිල්පීය සම්පත් සහිතව සිදු විය යුතු ය.

## භාෂා ප්‍රතිපත්තිය

9.238 භාෂා ප්‍රතිපත්තිය නිසා සහ අනුපිළිවෙළින් බලයට පත් ආණ්ඩු එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී සිදු වුණු ඌනතා නිසා බොහෝ දෙමළ අයගෙන් ප්‍රකාශයට පත් වුණු කොන් කරනු ලැබීම පිළිබඳ හැඟීමට සවන් දුන් කොමිසම, එම හැඟීම සඳහන් කර සිටී.

9.239 අද පවා සුලුතර ප්‍රජාවන්ට අයත් බොහෝ පුද්ගලයන්ට තමන් කැමැති භාෂාවෙන් නො ව වෙනත් භාෂාවකින් ව්‍යාපාරික ගනුදෙනු කිරීමට සිදුව ඇති සැටි, බලපෑමට ලක් වුණු ප්‍රදේශවලට කළ චාරිකාවල දී කොමිසම සෘජුව ම දැක ගත්තේ ය.

9.240 දෙමළ භාෂාව කතා කරන පොලිස් නිලධාරීන් බඳවා ගැනීම සිදු වෙමින් පවතින බව පිළිගන්නා නමුත්, ජනාධිපතිවරයා වෙත කළ තම අන්තර්වාර සන්නිවේදනයේ දී මෙම කාරණාවලට අදාළ හදිසි පියවරයන් පිළිබඳව කොමිසම ඉදිරිපත් කළ නිර්දේශ තව මත් ක්‍රියාත්මක කර නැති බව කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි.

9.241 භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සහ එහි ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම සඳහා වන නිල මණ්ඩල තුළ දෙමළ කතා කරන ජනයාට සහ දෙමළ කතා කරන ප්‍රදේශවලට ප්‍රමාණවත් නියෝජනයක් තිබිය යුතු ය. භාෂා ප්‍රතිපත්තිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම තුළ, ප්‍රජා මට්ටමට කඩා වෙන් කළ ක්‍රියාකාරී සැලසුම් අඩංගු විය යුතු අතර, පුරවැසි සහභාගිත්වය ඇතිව නිරීක්ෂණය කළ හැකි ඉලක්ක සහිතව, කොට්ඨාස සහ පළාත් මණ්ඩල නිසි ලෙස ආවරණය විය යුතු ය.

9.242 සන්නිවේදන බාධාවන් නිසා උතුරේ සහ නැගෙනහිරේ ජනයා දකුණේ ජනයාගෙන් වෙන් කරනු ලබති. වර්ගය, ආගම හෝ සාමාජීය තත්ත්වය නො තකා සියලු පුරවැසියන් අතර අයිතිය පිළිබඳ හැඟීමක් ඇති කිරීමට සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතු ය. ජාතියක් එක්සත් කරන්නේ සහ බැඳ තබන්නේ භාෂාව යි. එම නිසා, භාෂාවට අදාළ ප්‍රතිපත්ති මෙම ප්‍රතිඵලය ලැබෙන පරිදි සකස් කිරීම අත්‍යවශ්‍ය ය. අවබෝධය, විවිධත්වය සහ ජාතික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා නිල භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම අවශ්‍යයෙන් ම කළ යුත්තකි.

.

9.243 එකිනෙකාගේ භාෂාවන් ඉගෙනීම පාසල් විෂය නිර්දේශයේ අනිවාර්ය කොටසක් කළ යුතු ය. මෙය ප්‍රජාවන් දෙක අතර ආකල්පමය වෙනස්කම් පවතින බව සහතික කරන ප්‍රධාන මෙවලමක් වනු ඇත. සිංහල ළමයින්ට දෙමළ ඉගැන්වීමේ සහ දෙමළ ළමයින්ට සිංහල ඉගැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස එකිනෙකාගේ සංස්කෘතීන් පිළිබඳව වඩා පුළුල් අවබෝධයක් ලැබෙනු ඇත.

9.244 භාෂා ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ අනාගත පරම්පරාවන්ගේ ත්‍රෛභාෂීය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) ව්‍යක්ත භාවය සහතික කිරීම අතිවැදගත් කර්තව්‍යයක් බවට පත් වේ. ත්‍රෛභාෂීය අධ්‍යාපනය, ඉතා තුරුණු කල සිට ම එකිනෙකා අබවෝධ කර ගැනීමට ළමයින්ට ඉඩ සලසනු ඇත.

.

9.245 වසර 2020 වන විට ත්‍රෛභාෂීය ජාතියක් ගොඩ නැගීම සඳහා වන ආණ්ඩුවේ මුල පිරීම කොමිසම සාදරයෙන් පිළිගනී. මෙම ප්‍රතිඵලය අත් කර ගැනීම සඳහා අවශ්‍ය කරන අයවැය වෙන් කිරීම්, ගුරු පුහුණුවට සහ කාර්ය මණ්ඩල සම්පාදනයට ප්‍රමුඛතාව දීමේ පදනමක සිදු විය යුතු ය.

9.246 කිසි ම දිස්ත්‍රික්කයක් හෝ පළාතක් භාෂාව පදනම් කර ගන වර්ගීකරණය නො කළ යුතු ය. රාජ්‍ය සේවයෙහි නිලධාරීන්ට රටේ ඕනෑ ම කොටසක සේවය කිරීම සඳහා භාෂා නිපුණතා පැවතිය යුතු ය.

9.247 රජයේ සියලු කාර්යාලවල හැම විට ම දෙමළ කතා කරන නිලධාරීන් සිටිය යුතු යැයි අනිවාර්ය කළ යුතු ය. පොලිස් ස්ථාන සම්බන්ධයෙන් ගත් කල, ඒවා සතුව පැය 24 පුරා ම ද්විභාෂීය නිලධාරීන් සිටිය යුතු ය. තමන් කැමැති භාෂාවකින් තම ප්‍රකාශය ලිවීමට පැමිණිලිකරුවාට/පැමිණිලිකාරියට අයිතිය තිබිය යුතු ය.

9.248 රාජ්‍ය භාෂා කොමිසම මධ්‍යගතව සහ කොළඹ පදනම් කර ගෙන පවත්නා අතර, ග්‍රාමීය පුරවැසියන්ට පහසුවෙන් ළඟා විය නොහැකි ය. රාජ්‍ය භාෂා කොමිසම, ක්‍රියාත්මක කිරීමේ බලදායී බලතල සහිත අධිකාරියක් විය යුතු අතර, එහි ශාඛා සෑම පළාතක ම පැවතිය යුතු ය.

9.249 භාෂා බාධකය ජය ගැනීම සඳහා මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි තොරතුරු තාක්ෂණයට වඩා පුළුල් අවධානයක් යොමු කළ යුතු ය. මේ සඳහා, දිගු කාලීන ප්‍රතිපත්ති සහ පියවරයන් ක්‍රියාත්මක වන තුරු, තාවකාලික පියවරක් ලෙස, එක් භාෂාවකින් අනෙකකට පරිවර්තනය කිරීම සඳහා මෘදුකාංග වැඩ සටහන් පාවිච්චි කළ හැකි ය.

9.250 මේ සම්බන්ධයෙන් ගත් කල, ද්විභාෂීය ව්‍යක්ත භාවය සහිත විශ්‍රාමික පොලිස් නිලධාරීන් යොදා ගෙන පොලිස් ස්ථානවල පරිවර්තකයන් තැබිය යුතු බවට තමන් කළ අන්තර්වාර නිර්දේශය වෙත අවධානය යොමු කරන්නැයි ආරාධනා කිරීමට ද කොමිසම කැමැති ය.

## අධ්‍යාපනය

### *සමාන අවස්ථා*

9.251 වෙනස්කම් කිරීම පිළිබඳ හැඟීම ඉවත් කිරීම වූකලි එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සිංහල ජනයා සහ දෙමළ ජනයා අතර ප්‍රතිසන්ධානය සඳහා වන පූර්වාවශ්‍යතාවකි. විවිධ ප්‍රජාවන්ට සපයන අධ්‍යාපන අවස්ථාවන්හි පවතින අසමබරතාව අඩු කරන බව සහතික කිරීමට රාජ්‍යය ගන්නා පියවරේ උපක්‍රමයක් ලෙස ප්‍රමිතිකරණය හඳුන්වා දුන් තැන් පටන් බොහෝ කඳුළු ගලා ගොස් ඇත. එම නිසා, අනාගත පරම්පරාවන්ගේ ප්‍රශස්ත අවශ්‍යතා සැලකිල්ලට ගෙන, කුසලතා මත පදනම්ව ඇතුළත් කර ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීමේ දැක්මකින් යුතුව මෙම පංගු ක්‍රමය පිළිබඳව පරිස්සමින් සමාලෝචනයක් කිරීම කාලෝචිත වනු ඇත. එවන් සමාලෝචනයක් කිරීම භාර ගත යුත්තේ අධ්‍යාපනයට සම්බන්ධ විශේෂඥයන්ගේ කමිටුවක් යැයි කොමිසම නිර්දේශ කර සිටී.

.

9.252 සුලුතර ප්‍රජාවන්ට දැනෙන වෙනස්කම් කිරීම පිළිබඳ කවර හෝ හැඟීමක් අවම කිරීම සඳහා දැරෙන සාමූහික පරිශ්‍රමයට දායකත්වයක් ලැබෙන පරිදි, ආණ්ඩුව යළි පණ ගැන්වුණු උනන්දුවකින් යුතුව අධ්‍යාපන පහසුකම් සාධාරණ ලෙස බෙදා හැරීමේ වැඩ සටහනක් ආරම්භ කළ යුතු ය. 2011 වසරේ සිට දිවයින පුරා පිහිටි ද්විතීයික පාසල් දහසක් උසස් කිරීම සඳහා වර්තමානයේ යෝජිත සැලසුම, අසමබරතාවන් අවම කිරීමට සහ අවසානයේ දී තුරන් කිරීමට තවත් අවස්ථාවක් සපයනු ඇත. සමාජය තුළ ආතතීන් සහ බෙදීම් නිර්මාණය කිරීමෙන් තොරව මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතු ය. මෙම පරිශ්‍රමය සාර්ථක වනු ඇත්තේ විෂය මූලික නිර්ණායකයක් පදනම් කර ගෙන සහ දේශපාලනයෙන් තොර තේරීම් ක්‍රියාවලියක් මත මෙම පාසල් හඳුනා ගත හොත් පමණකි. රටේ විවිධ ප්‍රදේශවල අධ්‍යාපන පහසුකම්වල පවතින අසමානතාව අඩු කළ යුතු අතර අවසානයේ දී තුරන් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

.

9.253 විවිධ ජනවාර්ගික සහ ආගමික පසුබිම්වලට අයත් ළමයින්ට සේවාවන් සපයන මිශ්‍ර පාසල්වලට අනුබල දීමට මුල පුරන ප්‍රතිපත්තියක් ආණ්ඩුවට තිබිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. මේ සම්බන්ධයෙන් ගත් කල, පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමට පහසුකම් සපයමින් ආණ්ඩුව පරිස්සමින් සකස් කළ ප්‍රතිපත්තියක් වර්ධනය කළ යුතු ය. පාසල්වලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ගත් කල, ජනවාර්ගික සහ ආගමික පදනම් මත සිසුන් නුසුදුස්සන් බවට පත් කිරීම ප්‍රතිසන්ධානය සඳහා සුබ නිමිත්තක් නො වේ. එවන් කවර පිළිවෙතක් වුව අධෛර්යයට පත් කළ යුතු ය.

9.254 විවිධ ප්‍රජාවන් සතු සාරවත් සංස්කෘතික විවිධත්වය පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධය සහ අගය කිරීම පාසල් ළමයින් සහ තරුණයන් සිත් තුළ කා වැද්දිය යුතු ය. එවිට ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය රටේ සමාජ වියමන තුළ දැඩිව මුල් බැස ගනු ඇත. එම නිසා, විවිධ පළාත්වල පාසල් යුගල වශයෙන් සම්බන්ධ කිරීම, සිසු හුවමාරු වැඩ සටහන් සහ පාසල් තුළ ප්‍රතිසන්ධාන සමාජ නිර්මාණය කිරීම වැනි යන්ත්‍රණයන් හරහා සිසුන් අතර වඩා පුළුල් අන්තර් ක්‍රියාවක් නිර්මාණය කිරීමට සෑම ධෛර්යයක් ම දිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. මීට අමතරව, ජාතික තරුණ සේවා සභාව තරුණ මට්ටමේ වඩා පුළුල් හුවමාරු වැඩ සටහන් යොදා ගත යුතු ය.

***සාම අධ්‍යාපනය***

9.255 කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් කීර්තිමත් ජාත්‍යන්තර නීතිවේදියෙකු, එක්සත්කම සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමේ දී සාම අධ්‍යාපනයේ තිබෙන අතිවැදගත්කම අවධාරණය කළේ ය. සිදු කළ හැකි විෂය නිර්දේශයීය වෙනස්කම් පිළිබඳ කොමිසමේ අදහස් දැක්වීම් ප්‍රධාන වාර්තාව තුළ පිළිබිඹු කර ඇත.

9.256 ත්‍රෛභාෂීය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ දී, විවිධ ප්‍රජාවන්ට අයත් සිසුන්ට අන්තර් ක්‍රියා කිරීමට සෑම අවස්ථාවක් ම තිබෙන බව සහතික කිරීමට හැකි තාක් පියවර ගත යුතු ය. එක ම පන්ති කාමරය තුළ අන්තර් ක්‍රියාව, ප්‍රායෝගිකව කළ හැකි තාක් දිරි ගැන්විය යුතු ය. කෙසේ වුව ද, විවිධ භාෂාවලින් ඉගැන්වෙන විෂයයන් සඳහා ඔවුන් විවිධ පන්ති කාමරවලට යොමු කළ හැකි ය.

.

9.257 රාජ්‍ය විශ්වවිද්‍යාලවල ජනවාර්ගිකව මිශ්‍ර සිදු ගහනයක් සිටින බවත්, එමෙන් ම භාෂා තුනෙන් ම පාඨමාලා පිරිනැමෙන බව සහ ඒවා පිළිබඳව තේරීමක් කිරීමට අවස්ථාවක් තිබෙන බවත් සහතික කිරීමට පියවර ගත යුතු ය. මෑතක් වන තෙක් ම, දෙමළ කතා කරන උපාධි අපේක්ෂකයන් බොහෝ දෙනෙකු උතුරට සහ නැගෙනහිරටත්, සිංහල කතා කරන උපාධි අපේක්ෂකයන් දකුණටත් සීමා කර තිබුණු බවක් පෙනේ.

9.258 ක්‍රීඩා විවිධ ප්‍රජාවන්ට අයත් ජනයා අතර අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නගන බව කොමිසමේ අදහස යි. මෙය ප්‍රතිසන්ධාන ක්‍රියාවලියෙහි ලා අත්‍යවශ්‍ය ය. මෙම දැක්ම සිත තබා ගෙන, අන්තර් පළාත් මට්ටමේ දී ක්‍රීඩා තරගාවලි ද, වැදගත් ජාතික ක්‍රීඩා තරග රට පුරා, විශේෂයෙන් ම උතුරෙහි සහ නැගෙනහිරෙහි ද පැවැත්විය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

## ඩයස්පෝරාව

9.259 ඇතැම් 'දෙමළ ඩයස්පෝරා කණ්ඩායම්' පුළුල් පදනමක් සහිත ප්‍රතිසන්ධාන පරිශ්‍රමයන්ට ඵලදායක ලෙස දායක වීමට උත්සාහ කරන නමුත්, වෙනත් ඇතැම් ඩයස්පෝරා කණ්ඩායම්, විශේෂයෙන් ම එල්ටීටීඊ ආධාරකරුවන් යැයි ඇතැමුන් විස්තර කළ කණ්ඩායම්, එදිරිවාදී පිවිසුමක් තෝරා ගෙන ඇති බවක් පෙනෙතැයි කොමිසම සඳහන් කළේ ය.

9.260 මෙම 'සතුරු ඩයස්පෝරා කණ්ඩායම්වලට' ප්‍රතිසන්ධානය කරා ශ්‍රී ලංකාව දරන අව්‍යාජ පරිශ්‍රමයන්ට වළ කැපිය හැකි බව කොමිසමට පැහැදිලි ය. එම නිසා, සිය රටින් නෙරපුණු ප්‍රජාවේ ශක්තිය ප්‍රයෝජනයට ගැනීම සඳහා, ආණ්ඩුව අදාළ පාර්ශ්වකරුවන් සමග එක්ව පුළුල් පිවිසුමක් සකස් කර ගත යුතු යැයි කොමිසමට හැඟේ.

9.261 එවන් පිවිසුමක ප්‍රධාන අංග විය යුත්තේ:

අ. සුළුතර පක්ෂවලට අයත් ඡන්දයෙන් පත් වුණු නියෝජිතයන් බලය බෙදා හැරීම සහ වෙනත් දුක් ගැනවිලි පිළිබඳව අර්ථාන්විත සංවාදයක යෙදවීම. 'සතුරු ඩයස්පෝරා කණ්ඩායම්' අනදාළ කළ හැකි වඩාත් ම සාර්ථක ක්‍රමය වනු ඇත්තේ, ඉහළ දේශපාලන තලයක දී සිදු වන, ඇසට පෙනෙන සහ පිළිගැනීමක් සහිත ව්‍යුහගත සංවාදයක් හරහා දේශීය සුළුතර පක්ෂ අදාළ කර ගැනීම යි;

ආ. තව මත් එදිරිවාදී ආකල්ප සහ එල්ටීටීඊයේ වෙන් වීමේ පිවිසුම සිත දරා සිටින එම කණ්ඩායම් ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීම සඳහා පියවර ගැනීම සහ දේශීය ප්‍රතිසන්ධාන සහ සංවර්ධන පරිශ්‍රමයන්ට එම කණ්ඩායම් දායක කර ගැනීම සඳහා අවකාශයක් සෙවීම;

ඇ. ජාත්‍යන්තර ප්‍රජාව සමග, විශේෂයෙන් ම මෙම ඩයස්පෝරා කණ්ඩායම්වලට සත්කාර කරන රටවල් සමග කල් තියා රාජ්‍ය තාන්ත්‍රික මුල පිරීමක යෙදී ගැනීම. මෙම මුල පිරීමේ අරමුණ විය යුත්තේ, ඉහත සඳහන් අර්ථාන්විත සංවාදය ගැන සහ පශ්චාත්-ගැටුම් ගැටලු විසඳීම සඳහා වත්මන් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඇතුළු ප්‍රබල සහ දෘශ්‍යමාන පියවරයන් ගැනෙමින් පවතින්නේ ය යන්න ගැන එම රටවල් දැනුවත් කිරීම යි. මෙම සතුරු ඩයස්පෝරා කණ්ඩායම්වලට අඩුවෙන් සවන් දෙන අතර ආණ්ඩුවෙන් සැපයෙන තොරතුරු වැඩිපුර ලබා ගැනීමට සත්කාරක රටවල් ඒත්තු ගන්වා ගැනීමට ආණ්ඩුවට හැකි වන්නේ එසේ කිරීමෙනි. මීට අමතරව, බැහැර කෙරුණු එල්ටීටීඊ ප්‍රචණ්ඩ සහ බෙදුම්වාදී දෘෂ්ටියට සහාය නොදෙන සහ ජනවාර්ගික සුසංවාදයේ සහ සම්මත දේශපාලනයේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පිළිගන්නා සිය රටින් නෙරපුණවුන්ගේ කටයුතු දිරි ගැන්වීමෙහි ලා සහ ඒවාට සහාය දීමෙහි ලා ද ආණ්ඩුව කල් තියා සූදානම් විය යුතු ය.

ඈ. ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට සහ වැඩ කිරීමට කැමැති සිය රටින් නෙරපුණවුන් සම්බන්ධයෙන්, ආණ්ඩුව සතුව වඩා ලිබරල් ප්‍රතිපත්ති සහ ආකල්ප පැවතිය යුතු ය. උදාහරණයක් ලෙස, ද්විත්ව පුරවැසි භාවය ලබා ගැනීම, මුදල් යැවීම පහසු කිරීමෙන් සහ අනිසි සීමා කිරීම්වලින් තොරව රට පුරා චාරිකා කිරීමට හැකියාව ලබා දීමෙන් මෙය කළ හැකි ය.

ඉ. මෙම කර්තව්‍යයන් සඳහා, මේ ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙයන් සහ මෙහි සහ විදේශීය සිවිල් සාමාජීය කණ්ඩායම් හරහා ගොඩ නැගෙන පුළුල් පෙරමුණක් පදනම් කර ගෙන පරිස්සමින් සකස් කළ වැඩ පිළිවෙළක් අවශ්‍ය ය.

9.262 ප්‍රතිසන්ධානමය ප්‍රජා සම්බන්ධතා පදනම් කර ගැනීමේ සහ තිරසර කිරීමේ අගති විරහිත සිතුවිල්ලෙන් යුතුව වන්නිය තුළ ආත්ම විශ්වාසයෙන් යුතු, අනාගත නැඹුරුවක් සහිත ප්‍රජාවක් නිර්මාණය කරනු පිණිස, ශ්‍රී ලංකාව තුළ සහ විදේශයෙහි තම සංවර්ධන හවුල්කරුවන් ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීමට ආණ්ඩුව මුල පිරීම අවශ්‍යයෙන් ම කළ යුත්තකි. මෙය වූකලි, නිවාසකරණය, පාසල්කරණය, සෞඛ්‍ය රැකවරණය සහ ජීවනෝපාය ක්‍රියාකාරකම් වැනි ක්ෂේත්‍රවල දී සංවර්ධන හවුල්කරුවන් සමග සහයෝගීව වැඩ කරමින්, ශ්‍රී ලාංකික 'ඩයස්පෝරාවට' ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ආධාර කළ හැකි ක්ෂේත්‍රයකි.

9.263 සිය රටින් නෙරපුණු ප්‍රජාවේ පාවිච්චි නොකළ ශක්තිය ප්‍රයෝජනයට ගැනීමට වැඩ පිළිවෙළක් යෝජනා කිරීම සඳහා සහ 'සතුරු ඩයස්පෝරා කණ්ඩායම්' යැයි කියනු ලබන කණ්ඩායම්වල උත්සුකතාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා සහ ඔවුන් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියෙහි නිරතව සිටින ආණ්ඩුව සහ අනෙක්

පාර්ශ්වකරුවන් සමග ඵලදායීව සම්බන්ධ කිරීම සඳහා, ජනාධිපති කාර්යාලය, විදේශ කටයුතු, ආරක්ෂක, විදේශ රැකියා, පෞද්ගලික අංශය සහ ශාස්ත්‍රීය සමාජය යන අංශවල නියෝජිතයන් ඇතුළත් බහුවිෂයීය කාර්ය බලකායක් පිහිටුවීමට ආණ්ඩුව පියවර යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. එවන් පුළුල් පිවිසුමක් වහා ම නොපිළිගන්නේ නම්, සතුරු බාහිර වාතාවරණයක් නිර්මාණය කිරීම දෙසට සිදු වන වත්මන් චලනය වර්ධනය විය හැකි යැයි ද, එවන් ක්‍රියාවලියකට සහාය දෙන කණ්ඩායම් ශ්‍රී ලංකාවට තුළට ප්‍රතිසන්ධානය යළි රැගෙන ඒමට සහාය දෙන අනෙක් අයගේ පරිශ්‍රමයන්ට සැලකිය යුතු ලෙස බාධා කරන ආන්තික භේදයක් දිගින් දිගට ම ප්‍රවර්ධනය කරනු ඇතැයි ද කොමිසමට හැඟේ.

## අන්තර් ආගමික ක්‍රියාකාරකම් - ප්‍රතිසන්ධානයෙහි ලා ආගමට ඉටු කළ හැකි කාර්ය භාරය

9.264 කොමිසම හමුවේ ප්‍රකාශ ඉදිරිපත් කළ ආගමික නියෝජිත කණ්ඩායම් කිහිපයක් අවධාරණය කළේ, ශ්‍රී ලංකාව ලෝක ආගම් හතරකට - එනම්, බුදු දහමට, හින්දු දහමට, ඉස්ලාම් දහමට සහ ක්‍රිස්තියානි දහමට - අයත් සම්ප්‍රදායන්ගෙන් පොහොසත් බව යි.

9.265 දිග් ගැසුණු ගැටුමකින් පසුව සිදු කෙරෙන ප්‍රතිසන්ධානය කෙටි කාලයේ දී මුදුන් පමුණුවා ගැනීම දුෂ්කර බව ප්‍රකාශ කරනු ලැබිණ. එම නිසා, එය දිගු කාලීන යළි ගොඩ නැඟීමේ ව්‍යායාමක කොටසක් බවට පත් විය යුතු ය. සාමාජීය සුසංවාදය උල්ලංඝනය කිරීම්වලට පවතින ඉඩකඩ පෙරදැක ඒවා අන්තරායකර පරිමාණයන්ට ළඟා වීමට කලින් විසුරුවා හැරීමට, ප්‍රතිසන්ධානය කෙරෙහි අවධානය රඳවා තැබීම සඳහා ආයතනික වැඩ පිළිවෙළවල් අවශ්‍ය ය.

9.266 නන්නාඳුනන මැර කල්ලි පූජනීය ස්ථාන විනාශ කිරීම පිළිබඳ මෑත සිදුවීම් කිහිපයක් දැන ගැනීමෙන් කොමිසම බරපතළ ලෙස සංවේගයට පත් විය.

9.267 මෙම සිදුවීම් අඛණ්ඩව පැවතී ගෙන යාම ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට නිසැකව ම සතුරු වනු ඇත. එවැනි සිදුවීම් වැළැක්වීම සඳහා දැඩි නිවාරක පියවරයන් ගත යුතු ය. එවන් නීති විරෝධී ක්‍රියාවන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සහ ඒවාට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට නීතිය බලාත්මක කරන ආයතන මේ දක්වා අසමත් වී තිබීම පිළිබඳව කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. එවැනි සිදුවීම් සිදුවීම නතර කිරීම සඳහා ආණ්ඩුව හැකි සෑම පරිශ්‍රමයක් ම දැරිය යුතු ය. එවැනි පියවරක්, බලපෑමට ලක් වුණු කණ්ඩායම් අතර ආරක්ෂාව සහ විශ්වාසය පිළිබඳ හැඟීමක් කා වද්දනු ඇත.

9.268 ප්‍රඥාවෙන් සහ අවබෝධයෙන් යුතුව ක්‍රියා කිරීමටත්, ඉවසා දැරීමේ සහ අන්‍යෝන්‍ය එකඟතාවේ දැක්මකින් යුතුව ගැටුම සහ එහි ප්‍රතිවිපාක දෙස බැලීමටත් සියලු ආගම්වල සියලු ජනයා දිරි ගන්වමින්, සර්ව ආගමික නායකයන් එක්සත්ව නායකත්වය සැපයිය යුතු ය. මෙය මුදුන් පමුණුවා ගත යුත්තේ, ආගම්වල පොදු ලක්ෂණ අවධාරණය කිරීමෙන් සහ පොදු දැක්මකට සහ එක්සත් ක්‍රියාවකට දායක වන සාධක කෙරෙහි අවධානය යොමු කරවීමෙනි.

9.269 මෙම තත්ත්වය තුළ එවන් එක්සත් සහ සාමූහික ක්‍රියාවන් සැලසුම් කර සහ ක්‍රියාත්මක කර ජනවාර්ගික සහ ආගමික සුසංවාදය ප්‍රවර්ධනය කිරීමේ දී, අන්තර් ආගමික කණ්ඩායම්වලට ඉටු කළ හැකි ඵලදායී කාර්ය භාරය අවධාරණය කිරීමට කොමිසම කැමැති ය.

.

9.270 කල් තබා අනතුරු ඇඟවීමේ පද්ධතියක් ලෙස සේවය කළ හැකි යන්ත්‍රණයක් පැවතුණ හොත්, නීතියට සහ සාමයට සහ ප්‍රතිසන්ධානය සහ සාමය ගොඩ නැඟීම කරා වන පරිශ්‍රමයන්ට වළ කපමින්, වාර්ගික හෝ ආගමික ආතතිය හෝ ඝට්ටනය ගැටුමට තුඩු නොදෙන බව සහතික කිරීම සඳහා එය ප්‍රයෝජනවත් නිවාරක වැඩ පිළිවෙළක් විය හැකි බවට කොමිසම හමුවේ පෙනී සිටි විවිධ අන්තර් ආගමික සහ ආගමික නියෝජිතයන්ගේ පොදු පිළිගැනීමක් පැවතිණ. කල් තබා අනතුරු ඇඟවීමේ සහ කල් තබා විසුරුවා හැරීමේ ක්‍රියා පටිපාටියක් ලෙස සේවය කිරීමට විධිනියෝගයක් සහිත එවැනි යන්ත්‍රණයක් අන්තර් ආගමික කණ්ඩායම්වල උපදෙස් ඇතිව පිහිටුවීමට ආණ්ඩුව පහසුකම් සැපයිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.

## කලාව සහ සංස්කෘතිය

***ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමේ මෙවලම් ලෙස භාෂාමය සහ සංස්කෘතික සබඳකම්***

9.271 කොමිසම හමුවේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී, ශ්‍රී ලාංකික අනන්‍යතාවක් ඇති කිරීමේ දී භාෂාමය සහ සංස්කෘතික පොදු ලක්ෂණ හඳුනා ගැනීමේ අවශ්‍යතාව විශේෂයෙන් අවධාරණය කෙරිණ. සාමාජීය අභිවෘද්ධිය සඳහා කලාවේ නිර්මාණශීලිත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සැපයෙන ශක්තිය ප්‍රයෝජනයට ගැනීමට ආණ්ඩුව සහ මහජනතාව අසමත් වී ඇති බව මෙන් ම ප්‍රජාවන් අතර අවබෝධය ඇති කිරීම සඳහා කලාවට සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකි බව අවබෝධ කර ගැනීමට අසමත් වීම ද පෙන්වා දෙනු ලැබිණ.

9.272 ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ දී සංස්කෘතික බැඳීම්වල පවත්නා වැදගත්කම කොමිසම හමුවේ ඉදිරිපත් කෙරුණු ප්‍රකාශවලින් අවධාරණය විය. එමෙන් ම, සිංහල සහ දෙමළ සංස්කෘතීන්ට ඉතා සාරවත් මුල් ඇති බව සහ "1956 දී සිදු වුණාක් මෙන්" කලාව, නාට්‍යය සහ සංගීතය හරහා සංස්කෘතික පුනරුදයක් ඇති විය යුතු බව ද ඒවායින් අවධාරණය විය.

9.273 රට තුළ සිටින බොහෝ පූජනීය ආගමික නායකයන්, කලාකරුවන් සහ නිවැරදි ලෙස සිතන වෙනත් බොහෝ පුරවැසියන් අතර පොදු පදනමක් මතු වීම ගැන කොමිසම සඳහන් කරන්නේ සතුටිනි. එහෙත් මෙම බලගතු පොදු ලක්ෂණවලින්, ප්‍රතිසන්ධානය සහ සාමය ගොඩ නැගීම පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාවලියක් සඳහා නිසැකව ම සුබ නිමිත්තක් සැපයෙනු ඇත්තේ, එම ක්‍රියාවලිය ඵල දැරවීම සඳහා සියලු පාර්ශ්වයන්හි දේශපාලනඥයන් පටු අවශ්‍යතා ඉවත ලූවොත් සහ ඒකමතික නායකත්වයක් සැපයුව හොත් පමණකි.

9.274 විවිධ ප්‍රජාවන් අතර පවත්නා භාෂාමය සහ සංස්කෘතික සබඳකම් පිළිබඳව වඩා පුළුල් දැනුවත්කමක් ඇති කිරීම පුළුල් ප්‍රතිසන්ධානයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රබල මෙවලමක් වනු ඇති බව කොමිසමේ අදහස යි. රාජ්‍යය මීට ඉහළ ම ප්‍රමුඛතාව දිය යුතු අතර, සූදානම් කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්තියක සහ ක්‍රියා මාර්ගයක අත්‍යවශ්‍ය කොටසක් බවට එය පත් කළ යුතු ය.

9.275 ප්‍රධාන දෙමළ සාහිත්‍ය කෘති සිංහලෙන් ද එසේ ම සිංහල සාහිත්‍ය කෘති දෙමළෙන් ද පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. විශේෂයෙන් ම පාසල් ළමයින් සහ තරුණයන් අතර එවැනි ප්‍රකාශන පතළ කිරීම, එකිනෙකාගේ සංස්කෘතීන් සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් සහ සංවේදිතාවක් පිළිබඳ හැඟීමක් පෝෂණය කිරීමෙහි ලා තීරණාත්මක වැදගත්කමක් ගනු ඇත.

9.276 ප්‍රජාවන් අතර පවතින පොදු ලක්ෂණ සහ අන්‍යෝන්‍ය අවබෝධය ඉස්මතු කර දක්වන සිනමා, රූපවාහිනී සහ වේදිකා නාට්‍ය කෘති, ප්‍රකාශන දිරි ගැන්විය යුතු අතර, විශේෂයෙන් තරුණ පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා ඒවා පතළ කළ යුතු ය.

.

9.277 ජාතික ගීය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත් කල, ජාතික ගීය එක විට එක ම තාලයට භාෂා දෙකෙන් ගැයීමේ පිළිවෙත අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර, ඊට සහාය දිය යුතු ය. මෙම අවස්ථාවේ මෙම පිළිවෙතෙහි කවර හෝ වෙනසක් කළ හොත්, ඉන් සිදු වනු ඇත්තේ පශ්චාත් යුද ප්‍රතිසන්ධානය පෝෂණය කිරීමට උපකාරී නොවනු ඇති මහා ඇවිස්සීමක් නිර්මාණය වීම පමණකි.

## ජනයා ජනයා අතර සම්බන්ධතාව

9.278 සිය සභා වාර අතරතුර දී, විශේෂයෙන් ම සිය ක්ෂේත්‍ර චාරිකා අතරතුර දී, අවබෝධය, මිත්‍රත්වය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමේ දී ජනයා ජනයා අතර සම්බන්ධතාවේ වැදගත්කම ගැන සියලු ප්‍රජාවන්ට අයත් ජනයා පැහැදිලි කැඳවුමක් කරනු කොමිසමට අසන්නට ලැබිණ. විශේෂයෙන් ම, මුහුණට මුහුණ ලා අන්තර් ක්‍රියා කිරීම යනු ඒකමතිකත්වය ගොඩ නැගීමේ සහ සුසංවාදය ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් බව ඔප්පු වී ඇති නිසා, කොමිසම මෙම දැක්ම දැඩි ලෙස අනුමත කරයි.

9.279 මේ සම්බන්ධයෙන් ගත් කල, විශේෂයෙන් ම ගැටුම නිසා දරුණු ම අන්දමින් බලපෑමට ලක් වූයේ තරුණයන් නිසා තරුණයන්ට විශේෂ කාර්ය භාරයක් ඉටු කළ හැකි ය. ගැටුමේ සහ එහි ප්‍රතිවිපාකවල පීඩාව උසුලා සිටීමට සියලු ප්‍රජාවන්ට අයත් තරුණයන්ට සිදු විය. ගැටුම මුළුල්ලෙහි, ලේ හලන තත්ත්වයන්හි දී හැරුණු විට, එකිනෙකා මුණ ගැසීමට සහ එකිනෙකා අවබෝධ කර ගැනීමට ඔවුන්ට කාලයක් සහ අවකාශයක් නො වී ය.

9.280 මෙම තත්ත්වය තුළ දී, ආණ්ඩුව සහ සිවිල් සාමාජීය කණ්ඩායම්, විශේෂයෙන් ම "තරුණ පාර්ලිමේන්තුවක්" ඇති කිරීම සඳහා දැනටත් ක්‍රියාත්මක වැඩ සටහනක් සහ "තල් අරඹින් පොල් අරඹට" නමින් හැඳින්වෙන හුවමාරු වැඩ සටහනක් සහිත තරුණ කටයුතු අමාත්‍යාංශය කළ ඇතැම් මුල පිරීම් පිළිබඳව කොමිසම සඳහන් කරන්නේ සතුටිනි.

9.281 එවැනි මුල පිරීම්වලට දිරි දෙන කොමිසම, අදාළ ක්ෂේත්‍රවල රජයේ සියලු අමාත්‍යාංශ සහ වෙනත් ආයතන තම වගකීම්වල විෂය පථයට වැටෙන එවන් නිර්මාණාත්මක වැඩ සටහන්වලට මුල පිරිය යුතු යැයි දැඩි ලෙස නිර්දේශ කර සිටී. මෙය කළ යුත්තේ සිවිල් සාමාජීය කණ්ඩායම් සමග සහයෝගයෙනි. එවිට, එවන් වැඩ සටහන්වලට සහාය ලබා ගත හැකි ය, පුළුල් විය හැකි ය, පුළුල් පදනමක් ඇති කර ගත හැකි ය. කෙසේ වුව ද, එවන් වැඩ සටහන් ක්‍රියාත්මක කෙරෙන්නේ සංචාරක ප්‍රජාවේ මෙන් ම සත්කාරක ප්‍රජාවේ ද සංස්කෘතික සහ භාෂාමය සංවේදිතාවන්ට ගරු කරමින් බවට පරිස්සම් විය යුතු ය.

## දේශපාලනික ඒකමතිකත්වයේ අවශ්‍යතාව

9.282 ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානයට බාධා කරන කැපී පෙනෙන සාධකවලින් එකක් නම්, බලය බෙදා හැරීම පිළිබඳ ගැටලුව වැනි තීරණාත්මක ජාතික ගැටලු පිළිබඳව දේශපාලනික ඒකමතිකත්වයක් සහ බහුපාක්ෂික පිවිසුමක් නොමැතිකම යි.

.

9.283 'ද්වේෂ සහගත කතාව' මහා වාර්ගික විසංවාදයන්ට දායක වුණු අවස්ථා පසු ගිය දශක හතර පහ තුළ පැවතී ඇති බව කොමිසම නිරීක්ෂණය කරයි. 'ද්වේෂ සහගත කතාව' ජනවාර්ගිකත්වයට, ආගමට ජනවාර්ගික සහ ආගමික ආතතිය අවුස්සන සාහිත්‍යයට සම්බන්ධ නිසා, එවැනි පිළිවෙත් කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා නිවාරක නීති පැනවිය යුතු අතර, එම නීති දැඩි ලෙස බලාත්මක කළ යුතු ය.

9.284 ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය, ගැටුමේ ඛේදවාචකය පූර්ණ ලෙස පිළිගැනීමකුත්, දේශපාලන නායකයන් සහ සිංහල සහ දෙමළ යන සිවිල් සමාජ දෙක ම සාමූහිකව බලවත් සේ පශ්චාත්තාප වීමකුත් ඉල්ලා සිටී. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට අයත් දකුණේ දේශපාලන නායකයන් ජාතික අවශ්‍යතාව අනුව ක්‍රියා කළේ නම් සහ දෙමළ ජනයා වෙත පිළිගත හැකි විසඳුමක් පිරිනැමීමට තමන් අතර ඒකමතිකත්වයක් තනා ගත්තේ නම් ගැටුම වැළැක්වීමට ඉඩ තිබිණ. සිංහල සහ දෙමළ යන දෙජනතාවට ම එරෙහිව එල්ටීටීඊය යොදා ගත් ප්‍රචණ්ඩත්වය සහ ත්‍රස්තවාදී විධික්‍රම අනුමත කරමින් සහ එල්ටීටීඊයට සහ ඔවුන්ගේ ඒකාධිපති පිළිවෙත්වලට එරෙහිව බලගතු ලෙස සහ නිර්භීත ලෙස මතු වීමට අසමත් වෙමින් දෙමළ නායකයන් බෙදුම්වාදය කරා වන සන්නද්ධ ව්‍යාපාරයකට අනුබල දීම වැළකුණේ නම් වළක්වා ගන්නට ඉඩ තිබුණු මෙම ගැටුම සම්බන්ධයෙන් දෙමළ දේශපාලන නායකයෝ ද සමාන ලෙස වගකිව යුතු වූහ. සිදු වුණු දෙය සම්බන්ධයෙන් සාමූහිකව බලවත් සේ පශ්චාත්තාප වීමක්, එක් පාර්ශ්වයක් තුළ වත් පහසුවෙන් හට නොගනු ඇත. එය හට ගනු ඇත්තේ, සිදු වී ඇති මානව ඛේදවාචකය පදනම් කර ගෙන බලගතු සදාචාරාත්මක ස්වයං තක්සේරුවක යෙදීමට ඔවුන් සූදානම් නම් පමණකි. ප්‍රතිසන්ධානයේ බීජවලට දලු ලා වැඩිය හැක්කේ සමාව සහ දයාව පවතින්නේ නම් පමණකි. සියලු පාර්ශ්වවල නායකයන් නිහතමානීව එකිනෙකා වෙත අත දිගු කොට, එබඳු ගැටුමක් පැන නැගීම වැළැක්වීමට සියලු පාර්ශ්වයන්හි දේශපාලන නායකත්වය සාමූහිකව අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටුමේ ගොදුරු බවට පත් වුණු අහිංසක සිවිල් වැසියන්ගෙන් සමාව ඉල්ලා සිටිමින් ඒකාබද්ධ ප්‍රකාශයක් කළ යුතු ය. ආගමික නායකයන් සහ සිවිල් සමාජය ඒ උදෙසා ක්‍රියා කළ යුතු ය, එය සමස්ත ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි ඇති කරන සමාදානමය බලපෑම අවධාරණය කළ යුතු ය.

9.285 ජාතික දිනයේ දී වෙන ම පැවැත්වෙන වෙන ම උත්සවයක් නියම කර, ඛේදජනක ගැටුමට ගොදුරු වුණු සියලු දෙනාට සාමූහිකත්වය සහ සහානුභූතිය ප්‍රකාශ කළ යුතු යැයි ද, රට තුළ නැවත වතාවක් එවන් ලේ හැලීමක් සිදු නොවන බව සහතික කිරීමට අපට තිබෙන සාමූහික කැප වීම පිළිබඳව ප්‍රතිඥා දිය යුතු යැයි ද කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. ලැබුණු වාචික සාක්ෂි පදනම් කර ගන්නා කොමිසම, එවන් ගරුගම්භීර සිදුවීමක දී සහ ඉහළ දේශපාලන තලයේ දී කෙරෙන මෙම අනුස්මරණීය ඉඟිය, සමස්ත ජාතිය ම දැන් උර දීමට සූදානමින් සිටින ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට අවශ්‍ය ජවය සම්පාදනය කරනු ඇති බව හඟියි.

*********************************************